FM 104.4,105.7
ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
"රංගිරි ශ්‍රී ලංකා"
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු


# රංගිරි ශ්‍රී ලංකා

**RANGIRI SRI LANKA NEWSPAPER**


FM 104.4,105.7
ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
"රංගිරි ශ්‍රී ලංකා"
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු



ශ්‍රී.බු.ව. 2564- ක්‍රි.ව. 2020
ජූනි (පොසොන්)

මාසික බෞද්ධ සාර සංග්‍රහය ~ අන්තර්ජාල කලාපය

19






## රංගිරි ශ්‍රී ලංකා රූපවාහිනිය

UHF CH 60
PEO TV CH 22
Dialog Tv 21
Dish Tv 2532

RSL TELEVISION

## රංගිරි ශ්‍රී ලංකා ගුවන් විදුලිය
දේශයේ රන් හඬ

RSL RADIO

FM 104.4 - 105.7

වෙබ් : www.rangirisrilanka.lk



රංගිරි දඹුල්ල සංවර්ධන පදනමේ ප්‍රකාශනයකි.



# පොසොන් පෝය වර්ණාව

ලංකාවාසී බෞද්ධ ජනතාවට පොසොන් පොහොය ඉතා වැදගත් වේ.වෙසක් පොහොයට පමණක් දෙවෙනි වන පොසොන් පොහොය ශ්‍රී ලංකාවට නිර්මල බුදු දහම ලැබුණු දිනය ලෙස සැලකේ. දඹදිව(ඉන්දියාව) රජකළ ධර්මාශෝක අධිරාජයා සම්බුද්ධ ශාසනයේ තිර පැවැත්ම සඳහා සිදු කළ තෙවන ධර්ම සංඝායනාවේ ප්‍රතිඵලයක් ලෙසට ශ්‍රී ලංකාවට බුදු දහම ලැබුණි . එවකට ලක්දිව රජ කළ දෙවන පෑතිස් රජතුමාගේ නොදුටු මිතුරෙකු වූ ධර්මාශෝක රජුගෙන් ලද දහම් පඬුරක් වශයෙන් මිහිදු මහරහතන් වහන්සේ මෙරටට බුදු දහම රැගෙන වැඩම කරවීය. එදා දෙවන පෑතිස් රජතුමා දඩයම් ක්‍රීඩාවෙහි යෙදී සිටි දිනයක් විය. මිහින්තලාවේ (මිස්සක) දී රජතුමා සහ මිහිදු මහරහතන් වහන්සේ ප්‍රමුඛ හමුවීමෙන් පසු ,

'' සමණාමයං මහාරාජ ධම්ම රාජස්සහසාවකා තවෙව අනුකම්පාය
ජම්බුදීපා ඉධාගතා''

යනුවෙන් තමන් වහන්සේ කවරෙක් දැයි හඳුන්වා දුන් මිහිදු මහරහතන් වහන්සේ දෙවන පෑතිස් රජතුමා ප්‍රධාන දූත පිරිසට දහම් දෙසා ධර්මාවබෝධය ලබා දුන්නේය. එම සිදුවීම ලංකා ඉතිහාසයෙහි සඳහන් වන සුවිශේෂි කරුණක් ලෙස දැක්විය හැකිය.

මෙහි පැවති විවිධ මිථ්‍යා ඇදහිලි වෙනුවට නිර්මල දහමක් පොසොන් පොහෝ දින ලැබීමෙන් බෞද්ධ සංස්කෘතියක් ඇතිවිය. ලාංකික ජනතාවගේ සිතුම් පැතුම් ද නව මාවතකට යොමු විය. මිහිදු මහරහතන් වහන්සේ සමඟ පැමිණි අනාගාමී භණ්ඩුක කුමාරයා පැවිදි වීමත් සමඟ ලක්දිව පළමු පැවිද්ද හා උපසම්පදාව සිදු වූයේද පොසොන් පොහෝ දිනයේදීය. ''චුල්ලහත්ථි පදෝපම'' සූත්‍රයත් ''සමචිත්ත පරියාය '' සූත්‍රයත් දේශනා කළේ ද පොසොන් පොහෝ දිනය මූලික කරගෙනය. මෙයට අමතරව

'' සච්ච සංයුක්තය'' දේවදූත සූත්‍රය බාල පණ්ඩිත සූත්‍රය ආසිවිසෝපම සූත්‍රය වැනි වටිනා සූත්‍ර දේශනාවන් පැවැත් වූයේ ද මෙම උතුම් පොහෝ දිනය මූලික කරුණක් ලෙස තබා ගෙනය. අටමස්ථානයන් මහමෙව්නාව අවටින් ලකුණු කරනා ලද්දේ ද මෙම පොහෝ දිනය සම්බන්ධ කර ගෙනය. ඒ බව ශාසන ඉතිහාසයෙහි සඳහන් වෙයි .

**ඇම්.ඞී.විජයවර්ධන**

**පුදබිමක අසිරිය**

# ඉසුරුමුණි මහා විහාරය

ලක්දිව ඉතිහාසයේ සඳහන්වන පරිදි දීර්ඝ ඉතිහාසයකට සම්බන්ධ,රාජ,රාජ,මහාමාත්‍යයන්ගේ පාලනය යටතේ පැවැති අනුරාධපුරයේ ඇති සුවිශේෂි බිමක් ලෙසට ඉසුරුමුණි මහ විහාරය හැඳින්විය හැකිය. මෙම ස්ථානය කුඩා කඳුමුදුනක් ඇසුරුකොට නිර්මාණය කර තිබීම විශේෂත්වයක් ගන්නා බව සඳහන් කිරීමට පුළුවන. පොසොන් සමයේ දී බෞද්ධ බැතිමතුන්ගෙන් පිරී පවතින ස්ථානයක් ලෙසින් ද විදේශීය ජනයාගෙන්ද පිරී පවතින ස්ථානයක් ද වේ. මෙම පුදබිම ජනයාගේ වැඳුම් පිදුම් ලැබීමට අමතරව කලාත්මක කැටයමකින් ප්‍රසිද්ධියට පත් වී තිබීම මෙහි වටිනාකම වැඩි වීමට හේතුවක් ලෙෂ සඳහන් කිරීමට පුළුවන.පුරාණයේ මෙම විහාරස්ථානය හඳුන්වා දී තිබෙන්නේ ''මේඝගිරි වෙහෙර'' යන නමිනි. මිහිඳු මහ රහතන් වහන්සේගේ වැඩම වීමෙන් පසු පැවිදි වූ රාජකීය පවුල්වල භික්ෂූන් වහන්සේලා උදෙසා මෙම සුවිශේෂී විහාරය දෙවනපෑතිස් රජතුමා විසින් කරවන ලද්දක් බව ඉතිහාසයෙහි සඳහන් වෙයි.(මහාවංශය ග්‍රන්ථය) ''වෙස්සගිරි'' ශිලා ලේඛණයට අනුව මෙම විහාරය හඳුන්වා තිබෙන්නේ ''ඉසිරමණ වෙහෙර'' යනුවෙනි. කිත්සිරිමෙවන් රජදවස මෙරටට වැඩම කළ ශ්‍රී දන්ත ධාතුන් වහන්සේ වෙනුවෙන් එතුමා විසින් අලංකාර දළඳ මැදුරක් කරවා පුද පූජා පැවැත්වූ බව සෙල්ලිපි ආශ්‍රිත තොරතුරු වලින් හෙළිවේ.



දර්ශනීය පරිසරයක පිහිටි මෙම විහාරය අලංකාර පොකුණකින්ද පියගැට පෙකින් ද සමන්විතය. කාශ්‍යප රජු මෙම විහාරය පිළිසකර කරවා යළි සංඝයා වහන්සේලාට පූජාකළ බව වංශකථාවල සඳහන් වෙයි. පසු කාලීන අනුරාධපුර රජකළ සෑම රජ කෙනෙක්ම මෙම විහාරයට ගරු බුහුමන් දක්වා ඇති බවට ඉතිහාසය සාක්ෂි දරයි. පොකුණට ඉහළින් මිනිස්රුවක් (වාඩිවී සිටින) හා අශ්වයෙකුගේ සටහනක්ද දක්නට ලැබේ.'' අග්නිය හා මේඝය'' ප්‍රකාශ කරන බව මහාචාර්‍ය සෙනරත් පරණවිතාන ශූරීහු පවසති. ආනන්ද කුමාරස්වාමි පඬිවරයා පවසන්නේ කපිල මුනිවරයා සහ ඔහුගේ අශ්වයා වන බවයි. සශ්‍රීකත්වය උදෙසා පුද පූජා පැවැත්වූ සිද්ධස්ථානයක් ලෙසට කුමාරස්වාමි පඬිවරයා අදහන් කරයි.



පවීත විහාරයට සම්බන්ධයක් නොමැතිව හුදකලාවේ තැන්පත් කර ඇති පෙම් යුවලකගේ කැටයම සාලිය කුමරු හා අශෝකමාලාගේ එකතුවීම පෙන්නුම් කරන්නක් යැයි මහාචාර්‍ය සෙනරත් පරණවිතාන මහතා පවසයි. පුරාවිද්‍යාඥයින්(බෙල් මහතා) පවසන්නේ ''ශිව,පාර්වතී) දෙදෙනාගේ ආදරණීය හමුවීමක් පෙන්නුම් කරන බවයි. පෙම් යුවලකගේ අලංකාර කැටයමක් පූජනීය ස්ථානයක නිර්මාණය කෙළේ කුමන හේතුවන් නිසාද යන්නට නිවැරදි පිළිතුරක් තවම ලැබී නැත. ඒ සඳහා විවිධ මත පවතී. ''රන්මසු උයනත්'' මේ ආසන්නයේම පැවැති නිසා සාලිය,අශෝකමාලා යන දෙදෙනාගේ ආදරණීය බව පැවසීමට කලාකරුවා මෙය නිර්මාණය කරන්නට ඇත යන මතයක් පවතී විවිධ මත මෙම විහාරස්ථානය වෙනුවෙන් ඉදිරිපත්කර තිබුණද සුවිශේෂි විහාර මන්දිරයක් වන බව බොහෝ දෙනාගේ පිළිගැනීමයි. අනුරාධපුර අටමස්ථාන වන්දනා ක්‍රමයට මෙම ඇතුළත් කර තිබීමෙන් පෙනී යන්නේ මුල් කාලයේ සිට බෞද්ධ විහාරස්ථානයක් වශයෙන් පැවැතගෙන එන බවයි. බෞද්ධ උරුමයක් වූ ඉසුරුමුණි විහාරය මතු පරපුරටද දැක වැද පුදා ගැනීමට ආරක්ෂා කර තැබීම ලාංකික බෞද්ධ ජනතාවගේ පරම වගකීම වනු ඇත. පර සතුරු උවදුරු වලින් නොනැසී පැවැති මෙම පිංබිම ජාතිකාභිමානයෙන්,ජාත්‍යාලයෙන් ඉදිරියටත් විරාජමාන වේවා...

**විජය තලවත්තේගෙදර**

ආචාර කරන්නහුට ආචාර කරන්න පුරුදුවන්න.



# බුදු දහම ලක්දිව ස්ථාපිත කිරීමට මිහිඳු හිමියන් යොදාගත් උපාය මාර්ග

බුද්ධ පරිනිර්වාණයෙන් පසු සිදු කළ තෙවන ධර්ම සංගීතියේ ප්‍රතිඵලයක් ලෙස ලංකාවට ද ධර්ම දූත කණ්ඩායමක් පැමිණි බව අපේ ශාසන ඉතිහාසයේ සඳහන් වැදගත් පුවතකි. ධර්මාශෝක අධිරාජයන් ශ්‍රී ලංකාව කෙරෙහි දක්වූ ඇල්ම නිසාම රජුගේ පුත් මහා මහින්ද මහරහතන් වහන්සේ ප්‍රධාන ධර්ම දූත කණ්ඩායම මෙරටට එවීමට තීරණය කිරීම විශේෂ කාරණයකි. බුද්ධ පරිනිර්වාණයෙන් වසර 236 කට පසු මෙම ඓතිහාසික සිදුවීම වූ බව හැමදෙනා අවිවාදයෙන් පිළිගන්නා කාරණයකි. ලාංකික ජනතාව බුදු දහම තමන් වහන්සේ ධර්ම දූත ව්‍යාපාරය සාර්ථක කර ගැනීමට යොදා ගත් උපාය මාර්ග රැසකි. ඒ පිළිබඳව මදක් විමසා බැලීම මේ ලිපියේ අරමුණයි.

### ධර්ම දූත කණ්ඩායම

බුදු දහම ප්‍රත්‍යන්ත ජනපදයන්හි පිහිටුවීමට ධර්ම දූත කණ්ඩායම් නවයක් සංගායනාවෙන් පසු පිටත්ව ගිය අතර එම කණ්ඩායම් වල ප්‍රධානත්වය දැරූ මහරහතන් වහන්සේලා විසින් තම කණ්ඩායම තෝරා ගන්නා ලදී. ඒ අනුව මහා මහින්ද මහ රහතන් වහන්සේ ලාංකිකයනට ධර්මය හඳුන්වා දීමට තෝරා ගත් ධර්ම දූත කණ්ඩායමෙහි ද විශේෂත්වයක් තිබේ. මේ වන විට බුදුරජාණන් වහන්සේ ප්‍රත්‍යන්ත ජනපදයන්හි මහණ උපසම්පදා විනය කර්ම කිරීමට උපසම්පදා භික්ෂූන් වහන්සේලා පස් නමකගෙන් හැකි වන ලෙසට විනය ප්‍රඥප්ති පනවා තිබුණි. ඒ අනුව ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල යන සිවු දෙනා වහන්සේ කැඳවා ගන්නා ලදී. මෙහි විශේෂත්වය වූයේ සුමන සාමනේරයන් වහන්සේ හා භන්ඩුක උපාසකවරයා ද සම්බන්ධ වීමයි. මෙයින් භන්ඩුක උපාසකවරයා ගෙන්වා ගැනීමට ඇත්තේ ලාංකිකයන්ට තමන් මනුෂ්‍යයන් බව පෙන්වීමටත් මේ රටේ දී පැවිදි කරවීමටත් විය හැක. සුමන සාමනේරයන් වහන්සේ ශ්‍රී ලංකාවේ දී උපසම්පදා කරවීමට සිතා කණ්ඩායමට එක් කළා වන්නට ඇත. මේ ආකාරයෙන් මිහිඳු හිමි ධර්ම දූත කණ්ඩායම සැකසීමේදී පවා උපක්‍රමශීලිව ක්‍රියා කර ඇති බව පෙනේ. මිහිඳු මහරහතන් වහන්සේත් සුමන සාමනේරයන් වහන්සේත්, භන්ඩුක උපාසකවරයාත් අශෝක රජතුමාත් සමීප ඥාතීන් වීම තවත් විශේෂත්වයකි.

### මුටසිව රාජ්‍ය පාලනය

ධර්ම දූත කණ්ඩායම පිටත් වන අවස්ථාව වන විට ලංකාවේ රාජ්‍ය පාලකයා වූයේ මුටසිව රජතුමායි. එතුමා වයෝවෘද්ධව සිටි බැවින් එම වකවානුවේ ලක්දිව ධර්ම ප්‍රචාරක කටයුතු කිරීමට පැමිණීම අසාර්ථක විය හැකි බව සිතා තවත් කාලයක් තම පැමිණීම ප්‍රමාද කළේ ද උපක්‍රමයක් ලෙසිනි. මුටසිව රජුගේ ඇවෑමෙන් දෙවන පෑතිස් රජතුමාට රාජ්‍ය බලය හිමිවීම දක්වා වූ කාල පරාසය මිහිඳු මහරහතන් වහන්සේ ගත කළේ තම මව් බිසව වූ වේදිස දේවිය මිසදුටු බවින් මුදවා ගැනීම සඳහා නගරයේ යි. කාලය උන්වහන්සේ සිංහල භාෂාව පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට යොදා ගත් බවට ද මතයක් පවතී. ඒ අවබෝධය ලබා ගැනීමට උත්සහ කළේ ඉන්දියාවට ගිය ලාංකික වෙළෙඳුන්ගෙන් හා වෙනත් දූත කාර්යයන්හි නිරත වූවන්ගෙනි. මෙය ද තවත් උපාය මාර්ගයක් විය. තමන් වහසන්සේ ප්‍රකාශ කළ දේ දෙවන පෑතිස් රජතුමාට එක එල්ලේ අවබෝධ වූයේ මෙහි ප්‍රතිඵලයක් වශයෙනි.

### රජතුමා හමු වීම.

මිස්සක පවුවේ දී දඩ කෙළියෙහි යෙදුනු රජතුමා පළමුව හුදලකලාව ධර්ම දූත පිරිසට හමු වීමට සලසා ගත්තේද මිහිඳු හිමියන් බොහෝ දුරට හිතා මතා ගත් තීරණයක් අනුවයි. මෙහිදීම තවත් සිදු වූ විශේෂ කාරණයක් වූයේ 'තිස්ස' යනුවෙන් රජතුමා ඇමතීමයි. රජ පිරිස ද සමඟ ප්‍රථම හමුවීම සිදු වූයේ නම් රජුගේ අවනත භාවය අඩු වීමට ඉඩ කඩ තිබිණි. එම තත්ත්වයෙන් මිදීම සඳහා මෙය උපක්‍රමයක් ලෙස යොදා ගන්නට ඇත. 'තිස්ස' යැයි ඇමතීමෙන් මිහිදු හිමියන් තමාට වඩා බලවතකු බව රජුට වටහා ගැනීමට ද ඉඩ සැලසූයේ බුද්ධිමත් තීරණයකට අනුවයි. බුදු දහම යනු බුද්ධිමතුන් සඳහා දේශනා කරන දහමක් වන නිසා රජුගේ බුද්ධිමත් බව අවබෝධ කර ගැනීමට මිහිදු හිමියන්ට අවශ්‍ය විය. එය බුද්ධි පරීක්ෂණයකින් 'අඹ පැන' හා 'නෑ පැන' විසඳීමෙන් ප්‍රත්‍යක්ෂ කර ගන්නා ලදී. මෙය ද මිහිදු මහරහතන් වහන්සේ යෙදූ තවත් උපාය මාර්ගයක් වේ.

### දේවතාරාධනාව

ධර්ම දේශනාවකට පෙරාතුව එම ස්ථානයට දෙවියන් කැඳවීම බුද්ධ කාලයේ පටන් අද දක්වාම පවත්වාගෙන එන සිරිතකි. ලක්දිව මිස්සක පව්වේදී මිහිදු මහරහතන් වහන්සේ ධර්ම දේශනාවට පෙරාතුව ද දෙවියන්ට ධර්ම ශ්‍රවණය සඳහා ආරාධනා කළ යුතු විය. රජු හා මැති ඇමති පිරිස ඉදිරියේ දී මිහිදු හිමියන් මෙම කාර්යය පවරණ ලද්දේ සුමන සාමනේරයන් වහන්සේටයි. එය ද තම පිරිස කෙරෙහි රජුගේ ගෞරවය වර්ධනය කර ගැනීමට යොදා ගත් උපායකි. සුමන සාමනේරයන් වහන්සේ ආරාධනා ගල මත සිට මුළු ලංකා ධරණීතලය පුරා දෝංකරය දෙන අයුරු දේවතාරාධනය කළේ,

සමන්තා චක්ක වාලේසු - අත්‍රා ගච්චජං තු දේවතා

ආදී ගාථාව දේශනා කරමිනි. මෙහි සිදු වීම දුටු එම හඬ ඇසූ රජතුමා ඇතුළු පිරිස කල්පනා කළේ හත් හැවිරිදි කුඩා සාමනේරයන් වහන්සේ මෙවැනි දක්ෂතාවයකින් යුක්ත නම් සෙසු පිරිස ඊට වඩා විශාල ශක්තියක් ඇති අය බවයි.

### චුල්ල හත්ථි පදෝපම සූත්‍රය දේශනා කිරීම.

බුදු දහම වැළඳගන්නා කෙනෙකු පළමුවෙන් හඳුනා ගත යුත්තේ බුද්ධ, ධම්ම, සංඝ යන රත්නත්‍රය යි. එම කාර්යය මිහිදු මහරහතන් වහන්සේ විසින් කරන ලද්දේ රජ පිරිසට 'චුල්ල හත්ථි පදෝපම' සූත්‍රය දේශනා කිරීමෙනි. මෙම සූත්‍ර ධර්මය පළමුවෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කළේ 'ජාණුසෝනි' බ්‍රාහ්මණයා හා 'පිලෝතික' පරිව්‍රාජකවරයා යන දෙදෙනා අතර ඇතිවූ සංවාදයක් නිසයි. යථෝක්ත සූත්‍ර දේශනාව තෙරුවන් කෙරෙහි ප්‍රසාධයට පත් වන තැනැත්තකු ක්‍රමයෙන් කය වචන සංවරභාවයට පත්ව චාරිත්‍ර වාරිත්‍ර සීලයන්හි හික්මීමෙන් සැනසීම ලබන අන්දම පැහැදිලි වේ. මහාවංශය මේ පුවත සඳහන් කරන්නේ මෙලෙසිනි.

'දේසනා පරියෝසානෙ - සද්ධිං තෙහි නරෙහි සො
චත්තාළීස සහස්සේහි - සරණෙසු පතිට්ඨහි'

මින් පැහැදිළි වන්නේ එම ස්ථානයේ සිට සියලු දෙනා නව දහම අවිවාදයෙන් යුතුව පිළිගත් බවකි.

චුල්ල හත්ථිපදෝපම සූත්‍රයට අමතරව පේතවත්ථු, විමාන වත්ථු වැනි දේශනාවන් පැවැත්වූයේ ඒ වන විට ලාංකිකයන්ගේ ආගමික විශ්වාස හා ඇදහීම් වලට අනුකූල වන අයුරිනි. මෙයද මිහිදු මහරහතන් වහන්සේ ලාංකික ජනතාව බුදු දහමට නැඹුර කර ගැනීම පිණිස යොදා ගත් තවත් ක්‍රියා මාර්ගයකි.

### රජ මාලිගයට පිටත්වීම

පළමුව මිහින්තලාවේ දී දෙවන පෑතිස් රජතුමාට මිහිදු හිමියන් ඇතුළු ධර්ම දූත කණ්ඩායම හමු වීමෙන් පසු උන් වහන්සේලාට අනුරාධපුර පිහිටි තම රජ මැදුරට වඩින ලෙස රජතුමාගෙන් ආරාධනාව ලැබිණි. මේ ආරාධනාව පිළිගත් මිහිදු හිමියන් රජතුමා ඇතුළු පිරිස පිටත් කර යවා පසුව වැඩම කරවීමට තීරණය කොට රජ පිරිස මාලිගයට යෑමට පෙරාතුව එහි වැඩමවා වැඩ සිටි බවට සඳහන් පුවත ද විශේෂ වූවකි. මේ අවස්ථාව උපයෝගී කර ගන්නා ලද්දේ තම ශක්තියට පෙන්වීමට විය හැකිය. මග සලකුණක් හෝ නොදන්නා පිරිසක් මහා වනාන්තරය මැදින් නියමිත ස්ථානයට රජතුමන් ඇතුළු කණ්ඩායම එහි යාමට පෙර පැමිණ සිටීම ආශ්චර්යයක් විය. සෘද්ධි බලය උපයෝගී කොට ගෙන මෙවැන්නක් කිරීම මඟින් ද තම බලය දක්නට සැලසීම උපක්‍රමශීලීව කළ කාර්යයකි.

### පළමු පැවිද්ද

පළමුව ලක්බිමේ දී ප්‍රව්‍රජ්‍යාව ලද තැනැත්තා වූයේ භන්ඩුක උපාසකවරයායි. එයින් අනතුරුව ලාංකිකයන්ටත් පැවිදි වීමේ අවස්ථාව උදා විය. ඒ අනුව දෙවන පෑතිස් රජතුමාගේ බෑණනු කෙනෙකු වූ 'අරිට්ඨ' ඇමතිවරයා මේ රටේ උපන්නකු ලෙස මිහිදු මහරහතන් වහන්සේ ගුරු තන්හි තබා පැවිදි විය. මේ සමඟ තවත් ලාංකිකයන් පනස් හතර දෙනෙක් පැවිද්ද ලැබූහ. මිහිදු හිමියන් මින් අනතුරුව කළේ මේ රටේ භික්ෂූන් වහන්සේලා මඟින් ලාංකිකයන්ට ධර්මය ඇසීමේ අවස්ථාව සලසා දීමයි. තම රටේ තමන්ගේ ඥාති භික්ෂූන් වහන්සේලාගෙන් ධර්මය ඇසීමේ කැමැත්තක් මෙරට වැසියනට තිබුණා පමණක් නොව ජනතාව වඩ වඩාත් බුදු දහමට නැඹුරු කර ගැනීමට එය ද වැදගත් උපාය මාර්ගයක් විය.

### මෙහෙණි සස්න

බුදු රජාණන් වහන්සේ බුද්ධ ශාසනය ව්‍යාප්ත කළේ භික්ෂු - භික්ෂුණී, උපාසක - උපාසිකා යන සිව්වනක් පිරිස මඟිනි. මිහිදු මහරහතන් වහන්සේ ද ලාංකිකයින් බෞද්ධයන් බවට පත් කිරීමට එම උපාය මාර්ගයම අනුගමනය කර තිබේ. දෙවන පෑතිස් රජතුමාගේ මාර්ගයෙන් අශෝක අධිරාජයන් වෙත දූතයන් යවා තම සොයුරිය වූ සංඝමිත්තා මෙහෙණින් වහන්සේ ජය ශ්‍රී මහා බෝධින් වහනසේ සමඟ කුලයන් 18 ක පිරිස් කැටුව මෙරටට ගෙන්වා ගන්නා ලද්දේ භික්ෂුණී ශාසනය ශ්‍රී ලංකාවෙහි ස්ථාපිත කර ශාසන දියුණුව සැලසීමටයි. ඒ මඟින් ඇති වූ අනුලා බිසවගේ පැවිද්දත් සමඟ තවත් සිය දහස් ගණන් කුල කාන්තාවෝ භික්ෂුණී ශාසනයේ පැවිද්ද ලබා ගත්හ.

### මෙහෙණි සස්න

බුදු රජාණන් වහන්සේ බුද්ධ ශාසනය ව්‍යාප්ත කළේ භික්ෂු - භික්ෂුණී, උපාසක - උපාසිකා යන සිව්වනක් පිරිස මඟිනි. මිහිදු මහරහතන් වහන්සේ ද ලාංකිකයින් බෞද්ධයන් බවට පත් කිරීමට එම උපාය මාර්ගයම අනුගමනය කර තිබේ. දෙවන පෑතිස් රජතුමාගේ මාර්ගයෙන් අශෝක අධිරාජයන් වෙත දූතයන් යවා තම සොයුරිය වූ සංඝමිත්තා මෙහෙණින් වහන්සේ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ සමඟ කුලයන් 18 ක පිරිස කැටුව මෙරටට ගෙන්වා ගන්නා ලද්දේ භික්ෂුණී ශාසනය ශ්‍රී ලංකාවෙහි ස්ථාපිත කර ශාසන දියුණුව සැලසීමටයි. ඒ මඟින් ඇති වූ අනුලා බිසවගේ පැවිද්දත් සමඟ තවත් සිය දහස් ගණන් කුල කාන්තාවෝ භික්ෂුණී ශාසනයේ පැවිද්ද ලබා ගත්හ. මෙය ලංකාව තුළ බුදු දහමේ සීඝ්‍ර ව්‍යාප්තියට ප්‍රබල හේතුවක් වූවා මෙන්ම එය ද මිහිදු මහරහතන් වහන්සේ විසින් යොදා ගන්නා ලද විශේෂිත වූ තවත් උපාය මාර්ගයකි.

මෙබඳු උපාය මාර්ග තුළින් පොසොන් පුර පසළොස්වක පොහෝදාක මේ රටට උතුම් දායාදයක් ලෙස ලැබුණු බුදු දහම ශ්‍රී ලංකා ධරණී තලයෙහි ස්ථාපිත වූ බව පැහැදිලි කාරණයකි.



**අපවත් වී වදාළ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ ශාස්ත්‍රපති පූජ්‍ය ලෙනදොර සෝරත හිමිහට ගුණානුස්මරණ සැළකීමයි.**

# මහින්දාගමනයෙන් අප ලද බොදු පුරුදු හා හොඳ පුරුදු



**සිරිලකට බොදු සුවඳ ගලා ඒමත් සමඟම උදේ - හවස පන්සිල් රකින දාන -ශීල - භාවනාවට මුල් තැන දෙන සංවරශීලී ගුණ ගරුක බොදුණු බවෙන් පිරිපුන් සමාජයක් බිහිවීම තුළින් ඒ හරහා එදා පවුල් පසුබිම ක්‍රමවත්ව ඔපවත්වගොඩ නැගුණි.**



**ම**හින්දාගමනයෙන් පසුව සිරිලකට හැමුව බොදු සුවඳ නිසා අධ්‍යාත්මික ගුණවගාවෙන් පිරුණු ස්වාමි-භාර්යා යන දෙපක්ෂයම ඔවුනොවුන්ට ගරු කරන සංයමයෙන් යුත් සුන්දරවූ පවුල් පසුබිමක් එදා අප සමාජයෙහි ගොඩනැගුණු බව ඉඳුරාම කිව හැක. එය අප සමාජයේ පමණක් නොව ධර්මාශෝක අධිරාජයාණන් දඹදිව සිට දියත් කෙරුණ ධර්මවිජය හේතුවෙන් බොහෝ ආසියාතික රටවල මනාව සැලසුම් සහගත වූ ක්‍රමවත් සංවර වූ සද්භාවයෙන් පිරුණු පවුල් පසුබිමකට අඩිතාලම වැටුණු බව පෙන්වා දිය හැක.

සිරිලකට බොදු සුවඳ ගලා ඒමත් සමඟම උදේ - හවස පන්සිල් රකින දාන -ශීල - භාවනාවට මුල් තැන දෙන සංවරශීලී ගුණ ගරුක බොදුණු බවෙන් පිරිපුන් සමාජයක් බිහිවීම තුළින් ඒ හරහා එදා පවුල් පසුබිම ක්‍රමවත්ව - ඔපවත්ව ගොඩනැගුණු බව පෙනී යයි.

පවුලේ ස්වාමි පුරුෂයාත් බිරිඳත් අතර පැවතියේ පුදුමාකාර අන්‍යෝන්‍ය සම්බන්ධයකි. දෙදෙනාම ශිලවන්තයෝ වූහ. ඔවුනොවුන් අතර අති සුපිරිසිදු ගුණාංගයන් හා මනා බුද්ධිමත් භාවයන් නිසා දෙදෙනාට දෙදෙනා ගරුසරු වෙමින් තැනට සුදුසු ලෙස සිය නුවණ මෙහෙයවා සිය  නිවසේ කටයුතු කළ ආකාරය ඉතාමත් ආදර්ශමත් විය. කිසිම විටෙකවත් ස්වාමියාට ඉහළින් බිරිඳ කටයුතු නොකළාය. සෑම දෙයක්ම ඔහුගේ අනුදැනුම ඇතිවයි එදා බිරිඳක් නිවසක කටයුතු කිරීමට හුරුව සිටියේ. එමෙන්ම සැමියා ද සිය පවුලෙහි කිසියම් කටයුත්තක් හෝ සැලසුමක් කිරීමේදී තම බිරිඳ හා සතුටුසාමීච්ව අදහස් හුවමාරු කරගෙනයි කිසියම් තීරණයකට එළඹියේ. මේ නිසා පවුලේ සම්මත ප්‍රශ්න කිසිම විටෙකවත් ඇති නොවන තරමට පවුලේ සාමකාමී භාවය සුරැකුණි. මෙයින් අපට පෙනී යන වැදගත්ම දෙය තමා පවුලේ දෙදෙනා අතර ඔවුනොවුන් කෙරෙහි ඇති ත්‍යාගශීලී භාවය. මොනම විටෙකවත් බිරිඳ සැමියාට නොදන්වා ගමන් බිමන් යාම නොකළාය. එය පවුලේ සමගියට බාධාවක් බව ඇය දැන සිටියාය. නමුත් අද අපේ බිරින්දෑවරුන් ගෙන් ඇතැම් දෙනෙක් තම සැමියනට නොදන්වා හිතුමතේට ගමන් බිමන් යාම කරති. හිතුමතේට තනි තීරණවලට එළඹෙති. අද බොහෝ පවුල්වල ප්‍රශ්න මතුවී තිබෙන්නේ මෙවන් දූරදර්ශී ක්‍රියාකලාපයන් නිසා බව කිව යුතුය. අනෙක තම දරුවන් ද මෙවන් හැසිරීම් තුළින් ලැබෙනුයේ නරක ආදර්ශයන්ය.

එදා බෞද්ධ සංස්කෘතිය තුළ පැවතුණා වූ නිවසක පවුලක ස්වාමිපුරුෂයාට ලැබුණේ උතුම් ගෞරවයකි. නිවසේ ගෘපතියා හැටියට ඔහු බිරිඳගෙන් දරුවන්ගෙන් නිති ගෞරවාදරය ලැබීය. ගෘහපතියෙකු ලෙස ඔහු වෙතින් ඉටුවිය යුතු සියලු කටයුතු නොපිරිහෙලා ඉටු කිරීමත්, ක්‍රියාවෙන් පවා ආදර්ශමත් බව පෙන්වීමත් තුළින් ඔහු නිවසේ සියලු දෙනාගේම ගරු බුහුමනට පාත්‍ර විය. බිරිඳක ද ගෘහපතිණිය ලෙස සැමියාගෙන් ලැබුවේ අපරිමිත ආදරයකි, ගෞරවයකි. මෙහිදී බිරිඳක සතු යුතුකම් කොටස සිය සැමියා වෙනුවෙන් ඇය නොපිරිහෙලා ඉටු කළ අතර, සිය දරුවනට අවැසි ආදරය, කරුණාව, සෙනෙහස නොඅඩුව පුදකරමින්

මවකගෙන් ඉටුවිය යුතු හැම සම්පතක්ම දරුවන් වෙනුවෙන් ඇය ලබා දුන්නාය. නිවසේ ආහාර පිළියෙල කිරීමෙන් අනතුරුව ඇය මුලින්ම ආහාර පිළිගැන්වූයේ තම ස්වාමි පුරුෂයාටය. ඉන් අනතුරුවයි ඇය නිවසේ අන් අයට ආහාර පිළිගැන්වූයේ. අතැම්විට තම නිවසේ අඹු-සැමි දෙපලගේ මව්පියන් ද රැඳී සිටින්නේ නම්, ස්වාමියාට ආහාර පිලිගැන්වීමට කලියෙන් එම මහලු දෙමාපියන්ට පළමුව සංග්‍රහ කිරීම එදා බිරිඳක සතු හොඳ ගුණාංගයක් වූවාය.

එදා අප රටතුළ මහලු මඩම්, වැඩිහිටි නිවාස දකින්ට තිබුණේ නැහැ. මන්ද එදා පවුල් පසුබිම තුළ තම මහලු දෙමාපියන්ට දැක්වූයේ විශේෂ සැලකිල්ලකි. තමා කුඩා කළ හැදූ වැඩූ දෙමාපියන් ඔවුන් කිසිම විටෙකවත් පසෙකට ලෑවේ නැත. මහලු දෙමාපියන් කෙරෙහි ඔවුන් දැක්වූයේ අසීමිත ආදරයකි, ගෞරවකි. තම හැදෙන වැඩෙන දරුවන් වෙතින් ආච්චි අම්මාට, සීයාට ආදරය දැක්වීම, සංග්‍රහ කිරීම වැනි හොඳ පුරුදු තුළින් ඔවුන්ව පෝෂණය කළහ. අදද අප සමාජයේ මෙවන් හොඳ පුරුදු රකින් පවුල් තරමකට හෝ දැකීම වාසනාවකි.

දරුවන්ව යහමඟට යොමු කරවීමට එදා දෙමාපියන් ගත් උත්සාහය අතිමහත්ය. එපමණක් නොව පවුලේ දරුවන් තුළ සහෝදරත්වය, සමගිය ඇතිවන පරිද්දෙන් අවවාද අනුශාසනාදියෙන් තම දරුවන්ව ප්‍රගුණ කරවමින් ශික්ෂණයෙන් හා සංගමයෙන් මෙන්ම කරුණාව, දයාව මුසුවුණා. ත්‍යාගශීලි බවින්, සහජීවනයෙන් යුතු පරිසරයකට දරුවන්ව හුරුපුරුදු කළහ.

අද සමාජයේද සෑම දෙමාපියයෙක්ම තම දරුවන්ගේ අභිවෘද්ධිය පතා කටයුතු කරති. යුතුකම් කරති. එනමුත් ඔවුන් සිය දරුවන්ගෙන් බලා පොරොත්තු වන්නේ උසස් විභාගයන් සමත් කරපු, විවිධ නිලතල - බලතල හොබවන යාන වාහන වලින් යනෙන සුවිසල් මන්දිර - සැප සම්පත් ළඟා කරගත් සමාජයේ කැපී පෙනෙන ලොකු මිනිසෙකි. නමුත් මේ ලොකු මිනිසා තුළ එක්තරා හිස් බවක් දකිනු හැකිය. එනම් අධ්‍යාත්මික පැත්තයි. මනුෂ්‍යයෙකු වශයෙන් මෙලොව ජීවත්වීමේදී විනයට, ශික්ෂණයට, සංගමයට මෙන්ම ශීලයට ප්‍රමුඛස්ථානයක් දිය යුතු බව බුද්ධ දේශනාවෙහි ඉතා පැහැදිළි කොට දක්වා ඇත. නමුත් අද දෙමාපියන් ඉහතින් සඳහන් කළා වූ අන්ධ වූ සිතුවිළි තුළින් ඔවුන් ද අන්ධ වූවන් බවයි පෙනී යන්නේ. ඉරිදා දිනයන්හිදී දහම් පාසලට යැවිය යුතු දරුවන්ව අමතර පංතිවලට යවන දෙමාපියන් අද සමාජයේ කොතෙකුත් ඇද්ද? කොතරම් විභාග සමත් වුවත් අසංවර,

නොහික්මුණු බුද්ධිහීන දරුවෙකුගෙන් අනාගතයේ රටට සෙතක් වේද? අඩුම තරමින් ඔහුටවත් සෙතක් වේද? දෙමව්පියන්ගෙන් විය යුතු එකම යුතුකම වනුයේ නැණෙන් ගුණෙන් පිරිපුන් දරුවෙකු තැනීමයි.

එදා පැවති සමාජයේ අධ්‍යාපනය තුළ අදමෙන් තරඟකාරීත්වයක් තිබුණේ නැහැ. දරුවන් නිදහසේ සැනසිල්ලේ හෙමින් සීරුවේ තම අධ්‍යාපනය කරගෙන ගියහ. දෙමාපියන් තම දරුවන්ට අධ්‍යාපනයට යොමු කිරීමේදී කිවීමට, ලිවීමට, පරිසරය වින්දනාත්මකව විඳගැනීමට ඔවුන්ව උනන්දු කළහ. මේ දරුවන්ට කියවන්නට ලැබුණේ සද්ධර්මාලංකාරය, ලෝ වැඩ සඟරාව, සනදෙවි හැල්ල, බුද්ධ ගජ්ජය, සුභාෂිතය වැනි හැඟීම් සාරවත් වන පොත පතය. මේ නිසා එදා දරුවනට අසහනයෙන් හා පීඩනයෙන් ගැටලු වලින් තොර යහපත් ජීවිතයකට උරුමකම් ලැබිණ.

අද සමාජය තුළ මෙවන් හොඳ පුරුදු දරුවන් වෙතින් ගිලිහී ඇති බවයි පෙනෙන්නට තිබෙන්නේ. මේ පිළිබඳව අප දරුවනට දොස් පැවරීම යුක්ති සහගත නොවේ. මන්ද අද අපේ පවුල් පසුබිම තුළ වැඩිහිටියන් මේ හොඳ පුරුදු දරුවන් තුළ ප්‍රගුණ කොට නොමැති නිසාවෙනි. බොහෝ පවුල් තුළ වැඩිහිටියන් ඔවුන්ගේ වැඩිහිටියන්ටවත් ක්‍රියාවෙන් හෝ ආදර්ශයක් තම දූ දරුවනට නොපෙන්වති. දරුවන් සමඟ හරිහරියට වාඩිවී රූපවාහිනියේ දරුවනට නුසුදුසු දර්ශන පවා නැරඹීමට අද දෙමාපියන් ආච්චි අම්මලා හුරුවී සිටින අයුරු ඉතාමත්ම කණගාටු දායකය.

එදා බෞද්ධ පසුබිමින් යුත් නිවසක හැන්දෑයාමය ගෙවී ගියේ ඉතාමත්ම සුන්දරව, නිස්කලංකව වැඩපල නිමාවී ගෙදර පැමිණ නිදහසේ සිටින ස්වාමියා ද කැටුව බිරිඳ මුහුණ කට සෝදාගෙන දරුවන් ද ලංකර ගනිමින් මල් පහන් පූජා කොට ශබ්දනගා ගාථා කියමින් බුදුන් වැඳීම දින චරියාවේ එක් අංගයක් වූවා. මේ මොහොත එළඹෙන්නට කලියෙන් නිවසේ භාර්යාව රාත්‍රී ආහාරය වේලාසනින්ම සූදානම් කොට හමාරවී සියලු වැඩපල වලින් නිදහස් වෙලයි බොහෝවිට සිටිනුයේ. අදද අප සමාජයේ මේ පුරුදු රැකගෙන තිබීම සතුටට කාරණයකි.

ලද දෙයින් සතුටුවීම එදා පවුල් පසුබිමක දක්නට තිබූ උතුම් ගුණාංගයකි. ඉහට උඩින් බලාපොරොත්තු ඔවුන් තුළ තිබුණේ නැහැ. මේ නිසා බලාපොරොත්තු බිඳ වැටුණ ද ඔවුන් මානසිකව වැටුණේ නැත. ජීවිතය ගොඩනගා ගැනීමට ඔවුන් යළි නව පන්නරයක් ලැබුවේ නව චින්තනයන් සිතුවිලි දාමයන් තුළිණි. සුචරිතයට මුල් තැන දෙමින් තෙරුවන් ගුණ වචනයට පමණක් සීමා නොකොට ක්‍රියාවෙන්ම ඉස්මතු කළ ඔවුන් ගතකළේ ධර්මානුකූල ජීවිතයකි. මේ නිසා එදා පවුල් සංස්ථාව තුළ අඹු-සැමියන්, දරුවන් අතර පැවතියේ සාමකාමී බවකි.

බුදුරජාණන් වහන්සේ සාර්ථක පවුල් දිවියක අඹු-සැමි යුවලකගේ ගති ලක්ෂණ කෙබඳුද යන්න සමජීවී සූත්‍රය වැනි දේශනාවන් තුළින් දක්වා ඇත. එනම් 'ශ්‍රද්ධාවෙන්, සීලයෙන්, ත්‍යාග සම්පත්තියෙන් සමාන පවුලක් එකතු වූ කල දෙවියෙක්, දිව්‍යාංගනාවක් සමඟ දිව්‍ය භවනක වාසය කරනවාක් මෙන් සතුටින් පවුල් ජීවිතය සාර්ථකත්වය කරා ගොඩනගා ගත හැකි බවයි'. එවන් අඹු-සැමියන් අද සමාජයේ ද පවුල් සංස්ථාව තුළින් දැකිය හැකි නම් විවාහ ජීවිතය මොනතරම් පිවිතුරුද? සුන්දරද? වැඩදායකද? එසේ නම් අද දවසේ සිරගෙවල්, මහලුමඩම් මෙතරම් අවශ්‍ය නොවනු ඇත.

චන්ද්‍රලතා සුමනසේකර

# "බුදුහිමි වදහල දහමට අනුවයි - ලෝකය සැමදා පෙරලෙන්නේ තලමල පරවෙයි ඒ ගස මියයයි - අපටත් ඒකයි සිදුවන්නේ"

වර්තමාන සමාජයේ බොහෝ දෙනෙකුගේ දෑස් වලට දකින්නට නොලැබෙන රස වින්දනයට හමු නොවන 'තලමල' පැරණි ජන කවියාගේ හදවත සාහිත්‍ය රසයෙන් පෝෂණය කළ උත්තරීතර වස්තුවක් වන්නේය. ජන ජීවිතයේ බොහෝ හරවත් පැති මෙන්ම බෞද්ධ දර්ශනයේ සුවිශේෂ ගුණාංග ද එකතු වී ජන කවියාගේ මුවගින් නිරායාසයෙන් ගලාගිය කවි පද සැබැවින්ම රසවත්ය, හරවත්ය. වර්මතමානයේ විවිධ නාලිකා ඔස්සේ විවිධ මල් වලට ගී තනු ලියැවුණු ගී පද රචකයින්ට 'තලමල' පිළිබඳව අමතක වී යාම භාග්‍යයකි.

වසර පනහකට පමණ එක්වරක් පිපෙන 'තලමල' කෙනෙකුට ජීවිතකාලයටම දකින්නට හැකි වන්නේ එක්වරක් පමණකි. තලගස් ඉතාම අඩුවෙන් තිබෙන නිසාත් මෙහි මල පිපෙනු බොහෝ දෙනෙකුට දැකගත නොහැකි වනු ඇත. මේ අඩුව සපුරාලන්නට මෙන් ජන කවියා තමාගෙන් ඉටුවිය යුතු සමාජ මෙහෙවරක් සේ සලකා තමා විඳින ලද ආශ්වාදය සිව්පදයකට මුසුකොට ගායනා කරන්නට ඇත. පරපුරෙන් පරපුරට කටපාඩමින් මතකයේ රඳවාගත් 'තලමල' සම්බන්ධ බොහෝ කවි පරපුරේ පැරණි ගැමි ජනතාව අතරින් ගිලිහී යන්නට ද ඇත. යාම්තමින් දැන් දැන් ලිඛිත සටහන් (මුද්‍රණ) අතරට එකතු වී ඇති 'තලමල' කවි යම් තරමකින් හෝ අනාගත පරපුරේ රසවින්දනයට හේතු වනු ඇත.

අඩි විසිපහක් පමණ උසට තලමල පිපි දිළෙයි. කේතුරූපාකාර හැඩ තලයක් ඇති තලමලේ ප්‍රධාන මල් කනුවට සම්බන්ධව ඇත් දළ සේ වටවුණු අතුරු මල් ඉති විසිරී පවතී. මේ ඉතිපිරෙන්නට මල් පිපෙයි. මී පැණි බමර මුළු පැණි සොයා 'තල මල' පිපී ඇති ඉසව්වට නාදරටා මතු කරමින් ඇදී යන්නාහය. එහි සුවඳ බොහෝ පෙදෙසක විසිරෙන්නාහ. තලමලක් පිපීම අහල ගම් හතකට අසුභ ඵල ගෙන එන්නක් බවට ගැමි ජනතාව අතර මතයක් පවතී. මේ නිසාම 'තලමල' කාව්‍ය ප්‍රබන්ධයේදී තෙරුවන් සිහි කිරීම දෙවියන් පිළිබඳව සිහිපත් කිරීම හා බුදු දහමේ සඳහන් ධර්ම කරුණුද සිහිපත් කරදීමට ජන කවීහු ද අමතක නොකළහ.

තලමල කවි බොහෝවිට කාන්තා පක්ෂය ''කුඹුරේ' හා 'හේනේ' දී ගායනා කරනු දැකීම අද කෙසේවෙතත් මීට දශක පහකට පමණ පූර්ව කාලයේදී බොහෝ විට අසන්නට ලැබුණි. බොහෝ තලමල් කවි දීර්ඝ විජිත වලින් ප්‍රබන්ධ කර ඇති අතර මෙරට ජන ජීවිතයේ භෞතික හා අධ්‍යාත්මික අංශයන්ද චිත්‍රනය කරයි.

තල අත්ත කුඩයක් සේ අව්වෙන් විශේෂයෙන් වැස්සෙන් ආවරණය සලසන අතර කල ගොබය පදම්කොට ගත් කල ධර්ම ග්‍රන්ථ ලිවීම, වෙද පොත් ලිවීම, කේන්ද්‍ර පිටපත් සෑදීම විවිධ අපල උපද්‍රව සඳහා යන්ත්‍ර මන්ත්‍ර භාවිතයට අක්ෂර සටහන් තැබීම කර්ණාභරණයක් ලෙසට භාවිතා කිරීම ආදියට ප්‍රයෝජනයට ගැනේ. මෝරා වැඩුණු තලගස් කපා එහි මැද කොටස තලා කොටා 'තලපිටි' සකස්කර ගන්නා විශේෂිත ක්‍රමයක් ද ගැමියෝ දැන සිටියහ. මෙහිදී අප විසින් විමසා බැලීමට අදහස් කරනුරයේ 'තලගස' පිළිබඳ පුවත් නොවන බැවින් මෙතැන් සිට තලමල ගුණ සුවඳ විමසන්නට අදහස් කරමු.

දොඹවෙල පිපුණ 'තලමල' ක් පිළිබඳව සඳහන්වන මේ දීර්ඝ විරිතකින් යුතු තලමල කවියෙන් තලමලේ අසිරියක් ඒ වටා සරණ බිඟු රැණ පිළිබඳවත් අපූරු සිතුවමක් අප සිත්හි ඇඳීමට සමත්වෙයි.

**"සඳ විලසින් සඳමඩල ලෙසින්**
**එම රැස් විලසින් තරුවට දිලෙනා**
**බඳගෙතුමෙන් මුතු පබළු පෙළින්**
**පෙළ කිණිති බරින් දස අත නැමුණ**
**නඳ කෙරුමෙන් විණාවේ හඬින්**
**බිඟුරොන් ගනිමින් ගුවනේ කෙළිනා**
**සොඳරුවකින් තලමල මෙලෙසින්**
**සකි බල සතොසින් දොඹවෙල පිපුණ"**

ඇත් දළ ලෙසින් විසිරී තිබෙන දඬුවල මුතු පබළු ලෙසින් මතුවන තලමලේ අලංකාරය කෙතරම් චමත්කාර ජනක ද? සැබැවින්ම මේ පැදිය තුළ ඇත්තේ ජනකවියෙකු සතු ප්‍රභාවට වැඩි දියුණු කාව්‍ය ලක්ෂණවේ. සැබැවින්ම මේ පැදියේ ව්‍යක්ත බවක් ද නැත්තේ නොවේ.

වේරහැර පිපුණ තලමටල කියවුණ මේ අපුරු කවිය රසවිඳින්න.

**"පැළ සිටුවන්ටත් කඳ ආරන්ටත්**
**කොහොමද මේ ගස උස වැවුණේ**
**අතු සිටුවන්නටත් මල පීදෙන්ටත්**
**නොම කල්ගිය බව පවසන්නේ**
**දුරට පෙනෙන්ටත් ළඟට පෙනෙන්ටත්**
**රන්වන් පාටින් මල් දිලුනේ**
**බඹරු පිරෙන්ටත් රොන් ගෙන යන්ටත්**
**වේරහැරයි තලමල පිපුණේ"**

තලමල්වල පාට ලා කහ පැහැයකි. සැබැවින්ම රන්වන් පාට සේ දකින්නේ එහි අලංකාරයයි. මලට බමරු පිරෙන ආකරයත් රොන් ගෙන යන ආකාරයත් මෙම ජන කවියෙන් මනාව පැහැදිලිවෙයි. මේ කවි වලින් විශේෂයෙන් 'තලමල' පිපුණ ගම පිළිබඳව ද තොරතුරක් එයි. කවිය පුරාවට යම් නැටුම් ලාලිත්‍යයක් ද නොදැනෙන්නේ නොවේ.

බොහෝ ජන කවිවලදී බුදු දහමට තුණුරුවන් හා දෙවි දේවතාවුන් වහන්සේලා පිළිබඳව යම් ආකාරයක සඳහනක් වෙයි. බුදු දහම සමඟ විශේෂයෙන් සමීප සබඳතාවක් තිබුණු ගැමි ජන දිවිය එමගින් යම් පමණක හික්මීමක් ද ලැබුවේ වෙයි. 'තලමල' පිළිබඳව කියැවුණ මේ ජන කවිය මතු කරනුයේ බුදු දහමින් ප්‍රකාශිත අටලෝ දහමට අනුව ඇති වන කුමන වස්තුවක් වුවද විනාශ වී යාමේ සදාකාලික සත්‍යයයි.

**"බුදු හිමි වදහල දහමට අනුවයි**
**ලෝකය සැමදා පෙරලෙන්නේ**
**තලමල පරවෙයි ඒ ගස මියයයි**
**අපටත් ඒකයි සිදු වන්නේ**
**පරපණ වනසයි විලිබිය දුරලයි**
**කවුරුදෑ මේ රට රැක දෙන්නේ**
**ගුනදම් වැඩුවොත් මිනිසා දෙවියෙකි**
**ඇයි මේ ටික අමතක වන්නේ"**

දැදුරුඔයේ කන්දේ තිබුණු 'තලගස' කඩා වැටීම පිළිබඳව තොරතුරක් ඒ මල නැවත මතු වීම පිළිබඳවත් අපූරු පුවතක් හෙළිකරයි.

**"බුදුහිමි වදහල දහමට අනුවයි**
**ලෝකය සැමදා පෙරලෙන්නේ**
**තලමල පරවෙයි ඒ ගස මියයයි**
**අපටත් ඒකයි සිදුවන්නේ**
**පරපණ වනසයි විලිබිය දුරලයි**
**කවුරුද මේ රට රැක දෙන්නේ**
**ගුණදම් වැඩුවොත් මිනිසා දෙවියෙකි**
**ඇයි මේ ටික අමතක වන්නේ"**

දැදුරු ඔයේ කන්දේ තිබුණු ''තලමල'' කඩා වැටීම පිළිබඳව තොරතුරකුත් ඒ මල නැවත මතු වීම පිළිබඳවත් අපූරු පුවතක් හෙළිකරයි.

**"දැදුරු ඔයේ කන්දේ ඒ තලගස**
**මුල්සේදී වතුරට වැටුණ**
**ඔය ඉහළින් තඳ වතුරක් ඇවිදින්**
**මල් කඳ කෙළ කෙළ යට ගිලුණ**
**නුරා කරන සොඳ පෙතියෝ රැනක්**
**ඒ මල වටකර ඇවිද ගියා**
**පුරාණ වප්මස වස්නැත දෙවියනි"**

දැදුරු ඔයේ තලමල පිපුණ අලංකාර තලමල පිපුණත් ඒ ගසත් ලෝක ස්වභාවය අනුව දියට වැටී විනාශයට පත්වේ. එහෙත් කවියාට මේ මල විනාශ වනවා දකින්නට කැමැත්තක් නැත. මේ නිසා පෙතියෝ රැණක් ඇවිදින් මලවට ඇවිද ගියා යනුවෙන් දක්වන අතරම මලට හානියක් කර නැත. නැවතත් වැටුණු තලමල දැදුරු ඔයේ පිපුණ ලෙස දක්වා ඇත. මෙයින් හැඟී යන්නේ ගහ විනාශ වුවත් මල සුරක්ෂිත වුණ බවකි.

**නාගරාජ සැව ඇරියා වාගේ තම්දාන තාන**
**එයින් උපන් තලගොබයක් වාගේ තම්දාන තාන**
**අප මුණිඳුට මුතු කුඩයක් වාගේ තම්දාන තාන**
**එයින් උපන් තල මලකුයි වාගේ තම්දාන තාන**

අප මුණිඳුට මුතු කුඩයක් වාගේ යනුවෙන් තලමල අගය මැනවින් මතු වී පෙනෙයි. මුතුකුඩය බුදුන් වහන්සේටත් සෙවන සලසන අලංකාර වටිනා වස්තුවකි. බුද්ධ ශරීරයටත් ඉහළින් මුතු කුඩය පෙනේ. තලමල මුතු කුඩය හා සැසඳීමෙන් එහි පැහැය හා අලංකාරය එහි වටිනාකම ද අසන්නාගේ සිත් තුළ චමත්කාරයක් මවාපායි. නැටුම් විලාශයක් හා අලංකාර භාෂා හා උපමාවක් ගෙන හැර දැක්වීමට ජන කවියා සමත් වී ඇති ආකාරය මින් පැහැදිලිව දකිත හැකිය.

ඇතැම් තලමල කවි වලින් එකල පැවති ගම්බිම් විස්තර දකින්නට ලැබේ. මෙයද බෙහෙවින් අගය කළ යුත්තකි. බොහෝ ගම්බිම්වල වර්තමාන නාමයන් වෙනස් වී ඇතුවාද සැක නැත. කෙසේවෙතත් එමගින් මතුවන ගම්බිම් පිළිබඳ තොරතුරු බොහෝ දෙනෙකුට වැදගත් වන්නාහ. අම්පිටියේ පිපුණ තලමලක් දකින්නට යන ගමන් මඟ මෙයින් විස්තර වෙයි.

**ඌවට කඩයිම දොඩතු කපල්ල ද ඉදල් පිටිය පසු කරල යනා**
**ගිනි ගප්පුල කළු පහණත් පසුකර මුත්තෙට්ටුව ගම නවා තැනා**
**කහට පිටිය තෙල්දෙනියත් පසුකර අම්බැබිලේ ගම කොනින් යනා**
**නුදුටු කෙනෙක්වත් බලන්ට යනවද අම්පිටියේ තලමල පිපුණා**

මේ සමාජ තොරතුරු සැබැවින්ම වැදගත්වෙයි. ජන කවියා තලමල සුවඳ ආග්‍රහනය කළා පමණක් නොව අවට පරිසරය ගැනද තොරතුරු පළ කිරීමෙන් සමාජ මෙහෙවරක් ද ඉටු කරයි. මේ තවත් එවැනි තලමල කවියකි.

**"සිය නෑ කෝරළේ සියයක මැද්දේ**
**සැදුවයි පත්තිනි දේවාලේ**
**සිත්තරු ගෙන්නා මල්වැඩ කරලා**
**සැදුවයි නාගමු දේවාලෙ**
**ඇසල මහේ පෙරහැර පවතින කළ**
**මඩුව ඉඩක් නැත දේවාලෙ**
**ඊට මුදුන්පිට පිපුණ තලමල**
**අලංකාර ලෙස පස්මාලේ"**

ඓතිහාසික නාගමු පත්තිනි දේවාලය පිළිබඳවත් එහි ඇසල මහ පෙරහැර ගැනත් විශාල පිරිසක් එයට සහභාගීවන පුවතක් සමාජ තොරතුරු වශයෙන් ඉතාවැදගත්ය. ඒ අතර මෙම දේවාලය මුදුන්පිට පස්මාලයකින් යුතු අලංකාර තලමලක් පිපීම පිළිබඳ ප්‍රවෘත්තිය ඉදිරිපත් කිරීමෙන් තලමලේ අගය ඉහළින් තැබීමට ජනකවියාට අවශ්‍ය වී තිබේ. මෙවැනි වූ අපූරු යෙදුම් සහිත කවිපද කිහිපයක කොටස් මෙසේය.

**"බැන්දේ ලෙසට නිල් කොඩියෙන් චාමර**
**රන්දොරින් රිදියෙන් කොත උසට පෙනේ**
**මල් උඩ පත්තුවෙ පිපුණ තලමල**
**රිදියෙන් තුන්මල් ගේ වාගේ**
**ළෙල දෙමින් මල උඩු ගුවනේ**
**මුතු කුඩ ලෙසිනේ සුළඟට වැනුනේ**
**සොඳ ලෙසිනේ මිණි කිරුළ මෙනේ**
**ඈතට පෙනුනේ රන්කො ලෙසිනේ**
**දිව්‍ය ලෝක දහසයේම බැලුවත්**
**මෙහෙම රුවක් නැත වෙන අන්දම්**
**සින්දුව කීවට වස්නැත දෙවියනි**
**තලමල සුළඟට යන අන්දම්"**

මිණි කිරුළ මෙන් රන්කෙත ලෙසින්, මුතුකුඩ ලෙසිනේ, රිදී කොත ලෙසින් ආදී උපමා සාම්ප්‍රදායික ඒවා සේ පිළිගැනෙතත් තලමල වර්ණය සඳහා ජන කවියා එවැනි යෙදුම් යෙදීමෙන් බලාපොරොත්තුවන්නට ඇත්තේ එහි උත්තරීතර බව ප්‍රකාශ කිරීමටය. දිව්‍ය ලෝක දහසයේම බැලුවත් යන යෙදුමෙන් මීට සමකළ හැකි කිසිවක් නැත යන්න අදහස් කළා විය හැක. එපමණටම අපූර්ව සුන්දරත්වයක් තලමල පිපී තිබෙනු දැක්මෙන් කවියාගේ හද තුළ උතුරා යන්නට ඇත.

බොහෝ තලමල කවි වලින් අසන්නට දකින්නට ලැබෙන්නේ එහි සුන්දරත්වය නොඑසේනම් එය පිපුණ ගම්බිම් පිළිබඳ විස්තරය. ඇතැම් තැනෙක දෙවියන් හා බුදුන් වහන්සේත් බුදු දහමේ ඇතැම් ධර්ම කරුණු සිහිපත් කිරීමත් සිදුකොට ඇත. එසේ වුවත් එයට හාත්පසින්ම වෙනසු වූ කරුණු කාරනා පිළිබඳව ද තලමල කවි වලින් ඉඳහිට තොරතුරු හෙළිවේ.

සන්දේශ කාව්‍යවල දක්නට ලැබෙන වැනුම් දියකෙළි වැනුම් වල එන ඇතැම් අවසථාවන් මේ තලමල කවියෙන් හෙළිදරව්වේ.

**"රන රන හංස ඔසරියෙන් වසාගෙන**
**රන රං මොණරා මිණි මෙවුලේ**
**මන පිනවන සළෙළුන්ට ඉන් කොමලේ**
**දෙනුවන් ගෑ සොඳ සඳුන් මනෝහර**
**තවයි ළමයිලා පට්ටි පොලේ**
**වෙන වෙන තලමල් බලමින්**
**රුබර ලියෝ සිටිති අම්බලන් වෙලේ"**

සන්දේශ සාහිත්‍යයේ දක්නට ලැබෙන සළෙළුන් මඟ සැටි හා ජල ක්‍රීඩාකරන ගංඟා ආශ්‍රිතව හැසිරී ඇති අයුරු සන්දේශ කාව්‍ය රසවිඳි පාඨකයෙකුට අමතක නොවේ. මෙහිදී විශේෂයෙන් තරුණියන් තලමල නරඹනවාට අමතරව වෙන වෙන තලමල් යනුවෙන් අදහස් කරන තරුණයන් දෙස ඇස දල්වන ආකාරයක් පැහැදිළිවේ. මිණි මෙවුල යන ආභරණ පැළඳීම දෑස් සඳුන් අඳුන් තවරාගෙන සිටීම සන්දේශ කාව්‍ය වල සුළභව දක්නට ලැබෙන දර්ශන වේ. එබැවින් මේ තලමල කවිය අනුව තලමලක් පිපෙන ස්ථානයක් අවට විශාල පිරිසක් ගැවසෙන බැවින්ද තලමලක සාමාන්‍යයෙන් ආයුකාලය මාස හයක් පමණ ආසන්නවන බැවින්ද මෙවැනි සිදුවීම් එම පරිසරය තුළ සිදු වන්නට ඇතැයි කෙනෙකුට උප කල්පනය කළ හැක. මෙයින් සමාජ තොරතුරක් ද දර්ශනය වේ.

තලමලේ සුන්දරත්වය හා අලංකාරය කොපමණ රස වින්දත් සෑහීමකට පත් නොවේ. සැබැවින්ම මෙ බුදු පුදට ගෙනෙන්නට ද ක්‍රමයක් නැ. කෙසේ වෙතත් බෞද්ධයාගේ අවසාන අරමුණ බුද්ධ පූජාවයි.

**"බෝධිය ලෙසට තල ගස මුදුන වටකරේ**
**පූජාවේව මේ මල අනුරාධ පුරේ"**

**"ගොබේ සොඳයි දස දරුමේ ලියවන්ඩ**
**මෙමල සොඳයි බුදු මඟුලට ගෙනියන්ඩ"**

**"සිරි පාද වැඳලා මල මුදුන් වුණ**
**පෙරිමියන්කුලම තලමල උතුරට නැමුණ"**

මේ අයුරින් ජන කවියා විසින් තලමල වෙනුවෙන් අපුරු කවි කල්පනා රාශියක් ජන සමාජයට දායාද කොට ඇත. වර්තමානයේදී බොහෝ කවීහු අතරින් මේ යුතුකම පැහැර හැරී ඇති බව සඳහන් කළ යුතුය.

ජන කවියා තමා තුළින් බිහි වූ සුන්දරත්වයේ අපූරු අත්දැකීම් එක්වරම ගායනයෙන් එළි දැක්වීය. ඒවායේ බහු ශ්‍රැත ලක්ෂණ හෝ ඒවාට සම්මාන පඬුරු පාක්කුඩම් ලැබේයැයි හෝ බලාපොරොත්තුවෙන් කවි ගායනා කළේ නැත. මේ නිසාම ජන කවිය පුරා හැබෑ ගැමි සුවඳ වාහන විය. තලමල කවි වලින් මේ ස්වභාවය වඩාත් ප්‍රභාවයට පත්විය. තලමල තරම් ජනකවියාට අපූරු සුන්දරත්වයක් එක්කළ වෙනත් මලක් ගැන අසන්නට නැත. වර්තමානයේ බොහෝ දෙනෙකුට සමහර විට තම ජීවිත කාලය පුරාවටම එක්වරක් හෝ තලමලක් දැකීමට භාග්‍යයක් නොවන්නට පිළිවන. මන්දයත් අද නවීකරණය විසින් බොහෝමයක් ඉඩකඩම් කොන්ක්‍රීට් වනාන්තර කර ඇති බැවිනි. තල ගහක් වෙනුවෙන් තම ඉඩමේ බිම් කොටසක් වෙන් කිරීම අද අසීරු වී ඇත. මේ නිසා අප අවධාරණයෙන් සැලකිය යුතු කරුණක් වන්නේ තලමල කවි සංරක්ෂණය කිරීම සඳහා මීට වඩා අවධානයක් යොමුකළ යුතු බවය. වෙනත් ගහ කොළ මෙන් නොව එකවරක් පමණක් මල් පිපිමෙන් ගසෙහි ආයු කාලය නිමවන තලමලේ සුන්දරත්වය ජීවිතයේ අනිත්‍ය ස්වභාවයක ද අපට පසක් කර දෙයි. තලමල කවි වලින් හෙළි වන සොදුරු බව විඳීමට නම් කවදා කොහේ දී කෙසේ හෝ තලමලක් නැරඹීය යුතුමය. ඒ අසිරිමත් බව වෙනත් කිසිදු මලකට හිමි නොවේ.

යූ. බී. දිසානායක - මලව කැකිරාව

පව්ටු මිතුරන්ගෙන් ප්‍රවේශම් වන්න.

රංගිරි ශ්‍රී ලංකා
RSL NEWSPAPER

# සැපත සැනසුම් සොයා සත වෙත.....

## මුනිඳු දෙසුවේ මේ දහම් පද

තුන් ලොව වෙසෙන සියළුම සත්ත්වයෝ නිරතුරුවම සැපත සැනසුම සොයා වෙහෙසෙති. මහා කාරුණික වූ බුදුරජාණන් වහන්සේ සත්ත්වයා සොයන සැපත සැනසුම කුමක්දැයි බුද්ධ ග්‍රහණයන්ගෙන්ම පසක් කළ සේක. ඒ නිසා මහා කරුණාවෙන් ලොව බලා වදාරණ උනවහන්සේ එක් අවස්ථාවකදී තුන්ලොවම අන්ධයන්ගෙන් පිරී ඇති බව වදාළහ.

අන්ධයා යනු රැය මෙන්ම දවාල එකසමානව දකින තැනැත්තාටය. ඔහුට පැවැත්මට අනුන්ගේ මඟ පෙන්වීම අවශ්‍යය. එහෙත් ලොවේ සිටින්නේ මෙවැනි අන්ධයන්ම ද? නැත. එවැනි අන්ධයන් ඉතාම ස්වල්ප දෙනෙකි. වැඩි දෙනෙකුට මැනවින් ඇස් පෙනෙයි. එහෙත් බුදුරජාණන් වහන්සේ මේ සියළු දෙනම අන්ධයන් ලෙස හැඳින්වූයේ ඇයි. ඒ අන් කවරක් නිසා නොව සත්‍ය වූ නිවැරදි දර්ශනයක් නොදකින නිසාය. බොහෝ විට දුක සැප හැටියටත්, සැප දුක හැටියටත් මාරු කර ගනී. අප්‍රිය කළ යුතු දේ ප්‍රිය හැටියටත්, ප්‍රිය කළ යුතුදේ අප්‍රිය හැටියටත් දකියි. මේ වැරදි දැකීම සත්වයා සසරින් සසරට ගෙන යයි. විටක හොඳ වූ දෙය විටක නරක දෙයක් වේ. මිතුරා ලෙසින් දුටු ඔහු පසුව සතුරා ලෙසින් දකී. සැකවින් බලන විට මුලින් දකින දෙය පසුව වෙනස් වී දකින විපල්ලාසයන්ගෙන් සත්ත්වයා සමන්විත බව පැහැදිළිවම පෙනී යයි. මේ කවර හේතුවක් නිසා දැයි බුදුහු දෙසා වදාළහ. පුද්ගලයා තුළ පවතින සඤ්ඤා විපල්ලාසයත් දිට්ඨි විපල්ලාසයත් මුල් වී සත්ත්වයා මුලාවට පත් වී සැපත සැනසුම නැතිකරගන්නා අයුරුත් එයින් අතිමිදීමේ සැපත සැනසුම උදාකරගත යුතු ආකාරයත් භාග්‍යවත් වහන්සේ වැනවින් පෙන්වා වදාළහ.

**'ඡ ඉමානි භිකඛවේ අනුත්තරියානි කතමානි ඡ දස්සනානුත්තරියානං සවණානානුත්තරියානං ලාභානුත්තරියානං සික්ඛා නුත්තරියානං පාරිචරියානුත්තරියානං ආස්සුතානුත්තරියානං ( අං නි ඡක්කක)**

මහණෙනි ඉතා උතුම් කාරණා සයකි. ඒ කවර සයක් ද යත්? ඉතා උතුම් ලැබීමය. ඉතා උතුම් හික්මීමය. ඉතා උතුම් සේවයය. ඉතා උතුම් සිහිකිරීමය. යන මේ ධර්මයෝය.

### උතුම් දකීම

උතුම් දැකීම වශයෙන් සාමාන්‍ය ලෝකයා විසින් සලකන දේ බොහෝ ඇත. ලොවේ ඇති පංචකාම වස්තු විෂය කොට ඇති රූප දර්ශනාදිය මත වඩන ප්‍රිය උපදන සැපත සැනසුම පුහුදුන් ජනයාට පෙනෙනු ඇත. එය වැලැක්විය නොහැක. එය වැලැක්වීමට බලහත්කාරකම් ද නොකළ යුතුය. මක්නිසාද යත් බලහත්කාරකම් අනිසි විපාක ගෙන දෙන බැවිනි. එබැවින් යථාර්තයට නතුවීම පිණිස ස්වයං අවබෝධයට ඉඩ හැරිය යුතු යයි පෙනී යයි. ඉහත දැක්වූ දැකීම ආර්ය දර්ශනයට නොවේ. එය සසර කළකිරීමට හෝ තෘෂ්ණාවේ නොඇලීමට හෝ නොවේ. මක්නිසාද? ලෞකික ආශාවන් මුදුන් පත් කරගැනීම සඳහා දකින පුද්ගලවස්තු රූප සසරින් සසරට ගෙන යන ක්ලේෂ ධර්ම මෙන්ම මෙලොව නිමාවක් නැති කෙලෙස සයුරක ගිල්වන බැවිනි. එහි අතෘප්තියක් මිස තෘප්තියක් ඇති නොවේ. චිත්ත සමාධිය ද ඇති නොවේ. එසේම මෙලොව පරලොව විෂය කොට දැනගත යුතු මහා දැනීම පිණිස ද මෙය හේතු නොවේ යැයි තථාගතයන් වහන්සේ වදාල සේක.

එසේ හෙයින් උතුම් දැකීම වනුයේ තථාගතයන් වහන්සේ හෝ තථාගත ශ්‍රාවකයෙකු දැකීමය. මෙයින් පෙන්වා වදාළේ තථාගත දර්ශනය මෙලොව පරලොව ලෞකික ලෝකෝත්තර වශයෙන් සැපත සැනසුම ළඟා කර ගත හැකි බවයි. ඒ උතුම් දැකීමෙන් සැනසුම සැපත උදාකරගත් පිරිස පිළිබඳව අප මොහොතක් සිහි කරමු.

**'එහි සෝපාක මාභායී
ඔලොක්කස්සු තථාගතං
අහංතං තාරයිස්සාමි
රාහු මුඛෙව චන්දිමා'**

සෝපාක මෙහි එන්න. බිය නොවන්න. තථාගතයන් වහන්සේ දෙස බලන්න. රාහු මුණයෙන් මුදවා ගත් චන්ද්‍රයා මෙන් මම ඔබ මුදවන්නෙමි. යනුවෙන් සෝපාක කථාපුවතේ සඳහන් වේ. මෙලෙස සෝපාක පමණක් නොව රජ්ජුමාලා, පටාචාරා, සුනීත ආදී පිරිස ද අංගුලිමාල, ආලවක ආදී දරුණු චරිතයන් ද විවිධ වූ ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, ග්‍රහපති, ශුද්‍ර ආදීපිරිස ද මේ උතුම් වූ තථාගත දර්ශනය, ශ්‍රාවක දර්ශනය දැකීමෙන් සැපත සැනසුම ළඟා කර ගත්හ. නූතන අපට මේ අයුරින් වූ දැකීම දැකිය නොහැකි යැයි සිතිය හැක. එය සාමාන්‍ය දෙයකි. එනමුත් තථාගත දර්ශනය තවමත් ලෝකයේ ජීවමානය.

පහන් වූ නුවණින් ඒ දැකීම තවම දැකිය හැක. එවිට අප වටා ඇති මිථ්‍යා දසුන් රූ සටහන් අතුරුදන්වේ. සම්මා දිට්ඨිය තුළින් සදා කාලික සැපත සතුට උදාකර ගත හැකිය.



### උතුම් ඇසීම

මියුරු සත්සර හා මුසු වූ ගී නද බෙර සක් ආදී නාදයන් මෙන්ම මියුරු තෙපුලෙන් දොඩමළු වන කතුන්ගේ හඬ ද උතුම් ඇසීම ලෙස සමහරු සලකති. එය ඇසීමක් වුව ද නියම ඇසීමක් ලෙස බුදු වදන අනුව පිළිගත නොහැකිය. වැරදි සහිත මහණ බමුණන්ගෙන් බණ ඇසුවත් එය උතුම් ඇසීමක් නොවන්නේ ය.

ඒ සියල්ල ලෞකික මායාවන් බව දැන තථාගත ශ්‍රාවකයෙකු වෙත එළඹ ධර්මය අසයි නම්, එය උතුම් ඇසීම ලෙස දක්වා ඇත. බණ ඇසීම යනු නොඇසූ දේ ඇසීමයි. ඇසූ දේ පිරිසිදු කර ගැනීමයි. සැක දුරු කර ගැනීමය. දෘෂ්ටිය සෘජු කර ගැනීමයි. සිත පහන් කර ගැනීමට හේතුවෙන් බව අමුතුවෙන් කිව යුතු නැත.

### උතුම් ලාභය

මෙලොව උතුම් ලාභ වශයෙන් දරුවන් ලැබීම ධනය ලැබීම ආදිය සළකති. මේ කිසිවක් උතුම් ලාභය ලෙස සැලකිය නොහැක. එය ලාභයක් වන සැබෑය. එහෙත් උතුම්ම ලාභය වන්නේ පුද්ගලයෙක් තුළ ත්‍රිවිධ රත්නය කෙරෙහි ඇති වන අචල ශ්‍රද්ධා සම්පත්තිය පමණි. එය කිසිවිටකත් නොවෙනස් වන ශ්‍රද්ධාවකි.

**'ඡ ඉමානි භිකඛවේ අනුත්තරියානි
කතමානි ඡ දස්සනානුත්තරියානං
සවණානානුත්තරියානං ලාභානුත්තරියානං
සික්ඛා නුත්තරියානං පාරිචරියානුත්තරියානං
ආස්සුතානුත්තරියානං
( අං නි ඡක්කක)**

### උතුම් හික්මීම

තථාගත ධර්මය දැන ඉගෙන ශීල සමාධි ප්‍රඥා මාර්ගය වෙතින් නිවනට අරමුණු වන හික්මීම උතුම්ම හික්මීමයි. සරලව ගත් විට ගතින් වන වරද තුනෙන් ද වන හික්මීම උතුම්ම හික්මීමයි. තථාගත දේශනාව වැඩි වශයෙන් විෂය වී ඇත්තේ මේ හික්මීම සඳහාය.

### උතුම් සේවය

අප විවිධ සේවාවන් කරන්නෝ වෙමු. රජුට, රටට, ගමට, නගරයට, පාසලට, රෝහලට යනාදී වශයන් උසස් සේවාවන් කරන්නෝ වෙමු. එය ද සේවාවන් ලෙස අගයමු. එහෙත් සම්බුද්ධ දේශනාව අනුව උතුම්ම සේවය ශාසන සේවයයි.

එනම් බුද්ධ වචනය සුරක්ෂිත කර ගනිමින් තමාට මෙන්ම මෙලොව පරලොව සැපත සැනසුම ළඟා කර ගැනීමට හේතු වන ආකාරයට ජීවත් වීම උතුම්ම සේවය වන්නේය.

### උතුම් සිහි කිරීම

මෙලොව අපි නොයෙක් දේ සිහි කරති. ලෞකික සැපයන් ළඟා කර ගැනීම සඳහා බොහෝ දේ සිහි කරති. එහි වරදක් නැත. එහෙත් බුද්ධ දේශනාවට අනුව උතුම්ම සිහි කිරීම කුමක් දැයි අවසාන වශයෙන් සිහි කළ යුතු ය.

ඒ අන් කවරක් නොව බුද්ධ, ධම්ම, සංඝ යනුවෙන් දෙදහස් පන්සිය පනස් වසරක් මුළුල්ලේ රැක ගත් ත්‍රිවිධ රත්නය නිතර සිහි කිරීමයි. එවිට අපට පාපයෙන් වෙන් වීමේ සිත පහළ වේ මේ දහම් කරුණු බුදුගුණ මහිමයෙන් මැනවින් සිහිපත් වේ.

අධ්‍යාපනපති
පූජ්‍ය තලාකොළ වැවේ
සාරානන්ද හිමි.

ගුණමකුබව දුදන ගතියකි.

# ප්‍රඥාවෙන්ම දැකිය යුතු ශ්‍රී සද්ධර්මයේ දාර්ශනික පසුබිම.

බුදු රජානන් වහන්සේ දේශනා කළ ශ්‍රී සද්ධර්මය හා එහි ඇති සුවිශේෂත්වය පිළිබඳ කරුණු විමසා බැලීමේ දී බුදු රජානන් වහන්සේ ගේ පහළ වීමත් සමඟම ධර්මය බැබලීමට පටන් ගත් බව පැහැදිලි වේ. බුදු වරු ලොව පහළ වුවද පහළ නොවුවද ශ්‍රී සද්ධර්මය සදාතනිකම පවතිනු ඇත. නමුත් කාලයක් යෑමේ දී අසත්‍ය නැමැති කටු අකුල් වලින් සත්‍ය නැමැති මිණි පහන වැසී යනු ඇත. එවැනි කළට බුදුවරයකුගේ ලොව පහළ වීම අවශ්‍ය වේ. සත්‍ය-අසත්‍ය, පින්-පව්, හොඳ-නරක, යහපත-අයහපත කුමක් ද? යහපත් දේ කිරීමේ දී ලැබෙන ප්‍රතිඵලය මොනවා ද? ආදී වශයෙන් මඟ පෙන්වීම සඳහා බුදුකෙනෙකුන් ලෝකයට පහළ වේ. බුදු දහමේ අවසාන පරමාර්ථය වන නිර්වාන ධර්මය ලබා ගැනීමට පෙර ලෞකික ජීවිතය මෙලොව පරලොව පමණක් නොව සංසාරික ගමනම යහපත්ව පවත්වාගෙන යා යුතුය.

ඒ සඳහා ධර්මය පවුරක් කර ගත යුතුය. කුල්ලූපමන් වො භික්කවේ නිස්සරනත්ථාය නො ගහනත්ථාය, එම උතුම් ධර්මය වුවද එම සංසාර ගමනින් එතෙර වීම සඳහා පමණි. කර තබාගෙන යාම සඳහා නොවේ." යනුවෙන් බුදු රජානන් වහන්සේ දේශනා කළහ. උන් වහන්සේ දේශනා කළේ පඤ්ඤාවන්තස්සායං ධම්මො නායානං ධම්මො දුප්පඤ්ඤස්ස" මාගේ ධර්මය ප්‍රඥාවන්තයිනට මිස දුප්ප්‍රාඥයිනට නොවේ. ආදි වශයෙනි. එයට හේතුව ඒ තරමටම උන් වහන්සේ දේශනා කළ ශ්‍රී සද්ධර්මය ගැඹුරුය. ප්‍රඥාවෙන්ම දැකිය යුත්තකි. අන්දානුකරණයෙන් හෝ අන්ද භක්තියෙන් ධර්මය පසක් කර ගත නොහැකිය. ඒ නිසාම බුදු සසුනේ පළමු රහතන් වහන්සේලා 60 නම අමතා දේශනා කළේ සියලු සත්වයිනටම යහපත සලසන බුදු වදනකි. එනම් චරථ භික්ඛ වෙ චාරිකං බහුජන හිතාය බහුජන සුකාය ලෝකානුකම්පාය අත්ථාය හිතාය දේව මනුස්සානං මා එකෙන ද්වෙ අගමිතථ. දෙසෙථ භික්ඛවෙ ධම්මං ආදී කල්‍යාණං මජෙඣ කල්‍යාණං පරියොසාන කල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කේවල පරිපුණ්ණං පරිසුද්ධං භ්‍රහ්මචරියං පකාසෙසි" (මහණෙනි, ලොවට අනුකම්පා පිණිස දෙව්ලොව මිනිසුන්ගේ දියුණුව පිණිස චාරිකාවේ යෙදෙන්න. දෙදෙනෙක් එක මඟ නොයන්න. මේ දහම මුල මැද අග යහපත් වූවකි. අර්ථ සහිත වූ හාත් පසින් සම්පූර්ණ වු පිරිසිදු වූ සසුන් බඹසර ලොවට ප්‍රකාශ කරන්න.)

මෙම ප්‍රකාශය තුළින් ශ්‍රී සද්ධර්මයේ දාර්ශනික පසුබිම පැහැදිලි වේ. එම සුවිශේෂත්වය නිසාම සත්වයාට එම උතුම් දහම දේශනා කරන අයුරුද පැහැදිලි කොට ඇත. බුදු රජානන් වහන්සේ දේශනා කළ ධර්මය ඉතා ගැඹුරුය. උන් වහන්සේට බුද්ධත්වය අවබෝධ කර ගැනීමෙන් පසු එය සත්වයාට දේශනා කිරීමට පෙරාතුව අජපාල නුග රුක මුලදී මෙබඳු සිතුවිල්ලක් පහළවිය.

මේ ධර්මය මා අවබෝධ කළේ මහත් ආයාසයෙනි. සියලු කෙලෙසුන් නැති කිරීමෙන් මේ ලෝක සත්වයෝ රාග, ද්වේෂ, මෝහ ආදියෙන් දැඩි සේ බැඳී ගියාහුය. මේ තරම් ගැඹුරු දහමක් අවබෝධ කර ගැනීමට ඔවුනට පහසු නොවනු ඇත.

මෙම බුද්ධ සිතුවිල්ල දැන ගත්ත සහම්පතී බ්‍රහ්ම තෙම බුදුරාජානන් වහන්සේ කරා පැමිණ මෙසේ ප්‍රකාශ කළ සිටියහ. භාග්‍යවතුන් වහන්ස මාර සංග්‍රාමයෙන් ජය ගත් මහෝත්තමයන් වහන්ස, ලෝ සතුන් කෙරෙහි අනුකම්පාවෙන් අමා දහම දේශනා කරන සේක්වා. නැඟී සිටිනු මැනවි. ධර්මය දැන ගන්නෝ බොහෝ වෙති." ආදී වශයෙන් ධර්මය දේශනා කරන්න යැයි ආරාධනා කර සිටියහ. මෙහිදී පැහැදිලි වන්නේ බුදු ඇසින්ම ධර්මයේ සුවිශේෂත්වය දැකපු අයුරුයි. එබැවින් එම ධර්මය අනුවනයින්ට අවබෝධ කර ගැනීමට අපහසුය. ප්‍රඥාවන්තයින්ටම සීමාවන්නකි. එයට හේතු එම උතුම් දහම තම තම ඥාන පමණින් දැන ගත යුත්තක් බැවිනි. තවෙකෙකුට එතෙර කරවිය නොහැකිය. තම තමා විසින් උත්සාහයෙන් එතෙර විය යුතුය. බුදු රජානන් වහන්සේටද කළ හැක්කේ මාර්ගය පෙන්වීම පමණකි. තුමෙහහී කිච්ඡං ආතප්පං අක්ඛාතාරො කථාගතො" යන පාලි පාඨයෙන් ඒ බව පැහැදිලි වේ. තමාට පිහිට තමා විසින්ම සපායා ගත යුතුය. වෙන කෙනෙකුන් කෙසේවත් පිහිට වන්නෙම්ද? අත්ථාහි අත්ථනො නාථො - කොහි නාථො පාරොසියා" තමා තමාටම ප්‍රදීපයක් කොට (පහනක්) ජීවත් විය යුතුය. අත්ථ දීපා භික්ඛවෙ විහරථ" ධර්මය හේතු කොට ගෙන ජීවිතය හා සම්බන්ධ කොට මේ ආකාරයෙන් දේශනා කළ දහම් පාඨ තුළින්ද ධර්මයේ ඇති සුවිශේෂත්වය විදහා දැක්වේ.

බුද්ධ කාලයේ සිටි වක්කලී තෙරුන්ගේ කතා පුවතින්ද ධර්මය පිළිබඳව කරුණු හෙළිදරව් වේ. බුදු රජානන් වහන්සේගේ කාලයේ වක්කලී කියා තරුණයෙක් සිටියාය. මොහු බුදු රජානන් වහන්සේගේ රූප කාය දැකීමට දැඩිසේ ඇලුම් කළාය. බුදු රජානන් වහන්සේ පින්ඩපාතය හෝ දහම් චාරිකාවේ හැසිරෙන (වඩින) කළ වක්කලී තරුණයා කොහේ හෝ සිට බුදු රජානන් වහන්සේ දෙස ආසාවෙන් බලා සිටිනු ඇත. මෙය එදිනෙදා දින චරියාවක් වශයෙන් සිදු කළාය. පසුව මොහු සිතුවා පැවිදි වුව හොත් මීට වඩා හොදට බුදු රජානන් වහන්සේ දැක බලා ගන්න පුළුවන් ඒ නිසා පැවිදි විය යුතුයි සිතා පැවිදි භාවයද ලබා ගත්හ.

දැන් වක්කලී හාමුදුරුවෝ. මේ වක්කලී හාමුදුරුවෝ පැවිදි වුවත් බුදු රජානන් වහන්සේ දෙසම බලා සිටීමේ කටයුත්ත සිදු කළා. දිනක් එලෙස බුදු රජානන් වහන්සේ දෙස බලා සිටිනකළ බුදු රජානන් වහන්සේ වක්කලීට පිහිට විය යුතු බව දැන කිං ථෙ වක්කි: ඉමිනා පූතිකායෙන දිට්ඨේන යො ධම්මං පස්සති සො මං පස්සති" ආදී වශයෙන් දේශනා කළා. එයින් අර්ථවත් වන්නේ වක්කලිය මෙම කුණු ශරීරය දෙස බලා සිටීමෙන් එලක් නැත. ඔබට මා හැමදාම දැක ගැනීමට අවශ්‍ය නම් ධර්මය දැකිය යුතුයි." පසුව වක්කලී හාමුදුරුවෝ සත්‍ය වටහා ගෙන ධර්මය තම නුණින් දැක එය අවබෝධ කොට ගෙන සසර කතරින් එතෙර විය. මේ කතා පුතින්ද ධර්මය ඉස්මතුකෙට එහි විශේෂත්වය පැහැදිලි කොට ඇත.

සැරියුත් මුගලන් යන අග්‍රශ්‍රාවක යන දෙනම ගිහි කළ උපතිස්ස කෝලිත නම් විය. ගිහි ජීවියත ගැන කලකිරීමෙන් විමුක්තිය සොයා ගිය එම දෙපලගෙන් පළමුව අස්සජි මහ රහතන් වහන්සේ



හමුවූයේ උපතිස්ස පිරිවැජිටය. එම අවස්ථාවේදී අස්සජි හාමුදුරුවන් වහන්සේ දේශනා කළේ.

**"යෙ ධම්මා හෙතුප්පභවා - තෙසං හෙතුං තථාගතො ආහ**
**තෙසඤ්ච යො නිරොධො - එවං වාදි මහාසමණො"**

යම් ධර්මයක් හේතූන් මුල් කොට ඇද්ද එහි හේතුව තථාගතයන් වහන්සේ වදාළහ. එහි නිරෝධය වදාළහ." යන්න එහි අර්ථයයි. මේ තුළින්ද ධර්මයේ සුවිශේෂි තත්ත්වය පැහැදිලි වේ. බුදු රජානන් වහන්සේ ආනන්ද හාමුදුරුවන් වහන්සේට වරක් දේශනා කරන්නේ

**"යො බො ආනන්ද මයා ධම්මො ච විනයො ච**
**දෙසිතො පඤ්ඤත්තෝ සො වො මමච්චයෙන සත්ථා"**

ආදී වශයෙන් ධර්මය විනය පිළිබඳ විවිරණයක් කළ අවස්ථාවක් ඉන් පැහැදිලි වේ. බුදු රජානන් වහන්සේ ගුරු මුෂ්ඨියක් නොමැතිව ධර්මය විනය දේශනා කළ බවත් බුදු රජානන් වහන්සේගෙන් පසු ධර්මය ගුරු තනතුරෙහි තබාගන්නා ලෙසත් දෙශනා කර ඇත. බුදු රජානන් වහන්සේ වැනි උත්තමයෙක් ගුරු තනතුරෙහි තබා ගන්නා ලද්දේ ද ධර්මයයි. ඉන් ධර්මයේ සුවිශේෂත්වය හොඳින්ම පැහැදිලි වේ. බුදු රජානන් වහන්සේ ගේ ධර්මය අසා ශ්‍රාවකයන් අසතුටට පත් වූයේ එක් අවස්ථාවක් පමණි. එනම් ම:නි: මූල පරියාය වර්ගයේ ප්‍රථම සූත්‍රය වන මූල පරියාය සූත්‍ර දේශනාව ඇසීමෙනි. එය නොවැටහුනු නිසා මාන්‍ය අධික බමුණන් අසතුටට පත් විය. බුදු රජානන් වහන්සේ ද ඔවුන්ගේ මානය බිදීම (නැති කිරීම) සඳහා නොවැටහෙන්න දේශනා කළහ. අටුවාවන්හි සඳහන් වල මෙවැනි පුවත් තුළින්ද ධර්මයේ සුවිශේෂි බව මනාව ඉස්මතු කොට පෙන්වනු ඇත. අ:න: න්‍යාය සූත්‍රයේ මෙලොව දීම ධර්මාවබෝධය ලබන පුද්ගලයින් තිදෙනෙකු ගැන සඳහන් වේ. එනම්

**01. උග්ගටිතඤ්ඤු** (දේශනාව අසා සිටින විට දීම විවරණය සහිතව අවබෝධ වීමයි)

**02.විපටිතඤ්ඤු** (මාතෘකාවක් විස්තර වශයෙන් දේශනා කිරීමේ දී අවබෝධ වීමයි.)

**03.ඥෙය්‍ය** (උත්සාහයෙන් ඇසූ දේශනාව නැවත නැවත මෙනෙහි කිරීමෙන් අවබෝධ වීමයි.)

මීට අමතරව තවත් **පදපරම** යනුවෙන් පුද්ගලයෙකු ගැන සඳහන්වේ. ඔහුට කිසි අයුරකින් ධර්මාවබෝධය කළ නොහැක. මිත්‍යාදෘෂ්ටික පෙර භවයන්හි කළ කර්ම ශක්තිය නිසා එම විපාකය ලැබී ඇත. පළමු හා දෙවන පුද්ගලයින් පෙර භවයන් හි පුරන ලද ධාර්මික ප්‍රතිපත්ති නිසා නිර්වානය ලබා ගැනීමේ හැකියාව ඇත. තුන්වන පුද්ගලයාද කරන ලද පුන්‍ය කර්ම වල ශක්තියෙන් ක්‍රමක් ක්‍රමයෙන් නිවන් දැකීමේ ශක්තිය ඇත. කාලේන ධමම සාච්ඡා" සුදුසු කාලයට ධර්ම සාකච්ඡා පැවැත් වීම තුළින්ද ධර්මාවබෝධය ලබා ගැනීමේ හැකියාව ඇත. ධර්ම අකාලිකව (සෑම කළටම) වූත්, සන්දෘෂ්ඨික (ඇස් ඉදිරියේ දැකිය හැකි ඵලයෙන් යුක්ත) වූත් ඒහිපස්සික (එවබලව යයි විවෘත) වූත්, ඕපනයික (තම තමන්ගේ සිත්සතන් හි නිතර වැඩිය යුතු) වූත් පච්ඡත්ථං වේදිතබ්බෝ (නුවන ඇති සත්පුරුෂයන් විසින් වෙන වෙනම දත යුතු) වූත් ගුණයන්ගෙන් පරිපූර්ණය. සමහර කාල වලට ධර්මය ඇසීමට දැකීමට නොහැකි කාල උදාවනු ඇත. දහම් සොඬ රජතුමා ධර්මය සොයා ගෙන ගොස් එය දත් කෙනෙකු හමු නොවූයෙන් අන්තිමට රාස්සයෙක ලඟට ගියේය. රාස්සයා ධර්මය දන්නෙමුදු ආහාරයක් නොමැතිව ධර්මය දේශනා කිරීමට අකමැති වෙයි. පළමුව කුස ගින්න නිවාගෙන ධර්මය දේශනා කරන්නේ යැයි දහම්සොඩ රජතුමාට පැවසනු ඇත. පසුව දහම්සොඬ රජතුමා දෙන්නට දෙයක් නොමැතිව තම ජීවිතය දි ධර්මය ඇසීමට තීරණය කරයි. ඒ අනුව උස් පර්වතයකට නැග රාස්සයාගේ කටට පනින අතරේදී ධර්මය ඇසූ ආකාරය එක් පුවතකින් පිළිබිඹු වේ.

බුදු රජාණන් වහන්සේ දේශනා කරන ලද ධර්මය හැදින්වෙන්නේ සෝ ධමමං දෙසෙති ආදි කල්‍යාණං, මජ්ජේ කල්‍යාණං, පරියොසාන කල්‍යාණං, සත්ථං, සබ්බජ්ජනං කෙවල පාරිසුද්ධං පරිපූණනං" ආදී වශයෙනි. මුල මැද අග යහපත් නිසා උපාලි වැනි ගෘහපතියන්ද අංගුලිමාල වැනි මිනී මරුවන්ද සච්ඡක වැනි වාද කරුවන්ද නන්දෝපනන්ද වැනි නා රජුන්ද ආලවක වැනි යක්‍ෂයන්ද සභිය වැනි පරිභ්‍රාජකයන්ද පහසුවෙන් මෘදු මොලොක් බවට පත්විය. බුදු රජානන් වහන්සේ දේශනා කළ ධර්මය තුළ කැපීපෙනෙන සුවිශේෂී අවස්ථා හැටියට

**01. සද්ධා ජනනතෙ** (ශ්‍රද්ධාව උපදවීම)

**02.පඤ්ඤා ජනනතො** (ප්‍රඥාව උපදවීම)

**03. සබ්බ්‍යඤ්ජනතො** (ව්‍යඤ්ජන සහිත වීම)

**04.කේවල පරිපුණ්ණං** (හුදෙක් සව් සම්පූර්ණ වීම)

ආදී ලක්‍ෂණ හැඳින්විය හැක. බුදු රජානන් වහන්සේ ගේ ධර්මය ශ්‍රවණය කොට අන්‍යාගමිකයින් අන්‍යතීර්ථකයන් පවා සඳහන් කළේ සුභවාදී අදහස්ය. ඒ තරමට ශ්‍රී සද්ධර්මය අන්‍යයන්ට අමෘතයක් බදුය.

**අභික්කන්තං භෝ ගෝතම සෙය්‍යථාපි හො ගෝතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්චන්නං වා විවරෙය්‍ය, මූල්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තේල පජ්ජෝතං ධාරෙය්‍ය.. එසාහං භගවන්තං ගෝතමං සරණං ගච්ඡාමි"** (යටිකුරු දෙයක් උඩුකර පෙන්නුවා සේ වසා තැබූ දෙයක් විවෘත කළා සේ, මංමුලාවූවකුට මඟ කීවාසේ, අඳුරෙහි උන්නහුන්ට පහනක් දැල්වූවා සේ උතුම් සත්ධර්ම දේශනය බෙහෙවින් අගනේය.)

මේ ආදී වශයෙන් සංසාර දුකෙහි ඇලී සිටින සත්වයාට ධර්මය ඖෂධයක් බදු විය. පිපාසයෙන් සිටින්නකුට පැන් පොදක් ලැබුනු විගස දැනෙන ප්‍රීතියට වඩා ප්‍රීතියක් ධර්ම ශ්‍රවණය තුළින් සත්වයාට ලැබුනු බවයි ඉහත ප්‍රකාශය තුළින් පැහැදිලි වන්නේ. **(ධම්මඖෂධ සමං නාත්ථිඑතං පිවත භක්ඛ වො)** ආදී වශයෙන් රාග ද්වේෂ මෝහ නැමැති භයංකාර රෝග සුව කරන ඖෂධයක් විලසින් ධර්මය පෙන්නුම් කොට ඇත. ධර්මය ඇසීම තුළින්ද ධර්මයෙහි සුවිශේෂත්වය පෙන්නුම් කර ඇත.

**01. අස්සුතං සුනාථි** (නොඇසූ දෙයක් ඇසීමට ලැබීම)

**02.සුතං පරියොදපෙථි** (ඇසූ දෙය වඩාත් පිරිසිදු කොට ගත හැකි වීම)

**03.කංඛං උජුං විතරති** (සැකය දුරුකොට ගත හැකිය)

**04. දිට්ඨිං උජුං කරොති** (තම දෘෂ්ඨිය සෘජු කොට ගත හැකි වීම)

**05.චිත්ත මස්ස පසිදති** (සිතේ පැහැදීම (චිත්ත ප්‍රසාදය) ඇතිව.

මහා ධර්මපාල ජාතකයට අනුව බරණැස් නුවර ධර්මපාල නම් වු බමුණු ගමේ කිසිවෙකු අඩු වයසින් නොමළේය. එයට හේතුව ධර්මානුකූල ජීවිත ගත කිරීමයි. ඒ අනුව ධර්මය විසින් ජීවිත ආරක්‍ෂාකර ඇති බව පැහැදිලි වේ.

**"ධම්මො හවේ රක්කති ධම්මචාරි - ධම්මො සුචිණොණ සුඛ මාව හාති එසානි සංසො ධම්මෙ සුචිණෙණ - න දුග්ගතිං ගච්ඡති ධම්මචාරි"**

එයින් පැහැදිලි වන්නේ ධර්මානුකූලව ජීවත් වන්නා ධර්මයෙන් ආරක්‍ෂා කරනු ඇත. මැනවින් පුරුදුකරන ලද දහම් කරුණු නිසා දෙලොවම සැප ලබයි. ධර්මයෙහි හැසිරෙන්නෝ දුගතියට නොයයි. මේ අනුව පැහැදිලි වන්නේ ධර්මානුකූල ජීවත් වීම දෙලොවටම සැප ගෙනෙන්නක් බවයි. ධර්මයට සමාන කළ හැකි දෙයක් මේ තුන්ලෝකයේ තවත් නැත. ධර්මයෙන් සිදුකළ දෙය මවෙකුට වත් පියෙකුවත් සිදුකළ නොහැක. එබැවින් සංසාර සත්වයාට ධර්මය හැර මවෙක් හෝ පියෙක් නොමැති බව පැහැදිලිවේ. ධම්මං විනා නත්ථි පිචාත මාතා" යන පාඨය තුළින් ඒබව ද්වනිත වේ.

ධර්මය පිළිබඳ විමසා බැලිමේදේී සියළු දානයන් අතරින් ධර්ම දානය උසස් කොට පෙන්වා ඇත. ඒ බව සබ්බදානං ධම්මදානං ජිනාති" යනුවෙන් සියළු දානයන් පරදවා ධර්ම දානය ජයග්‍රහණය කරන බව පැහැදිලි කොට ඇත. ධර්මය තුළින් පුද්ගල චර්යාවන් වෙනස් කළ හැකිය. දුෂ්චරිත සුචරිත වත් බවට පත් කළ හැකිය. නරක මිනිසුන් හොද මිනිසුන් බවට පත්වේ. තිදොරම යහපත කොට ගෙන දෙලොවම ජයගත හැකි මඟ ධර්ම මඟීයයි. තම ඥානයෙන් ම ලැබිය යුතු දෙයකි ධර්මය. කාලාම සූත්‍රයට අනුව කරුණු 10කට අනුව ධර්මය නොවළදගත යුතුය එම කරුණු නම්.

1. **මා අනුස්සවෙන** (අනුශ්‍රවයෙන්)
2. **මා පරම්පාරාය** (පරපුරෙන් ආ පමණින්)
3. **මා ඉතිකිරාය** (මෙසේ වන්නට ඇතැයි අනුමානයෙන්)
4. **මා පිටකසම්පදානේන** (තමන්ගේ පිටකයට සමාන යැයි)
5. **මා තබවහේතු** (තර්කයට හරියයි)
6. **මා නය හේතු** (න්‍යායට හරියයි)
7. **මා ආකාරය පරිවිතක්ඛේන** (කරුණු හොදයයි)
8. **මා දිට්ඨි නිජ්ජානක්ඛත්තියා** (තමන්ගේ දෘෂ්ඨියට එකඟයැයි)
9. **මා භබ්බරූපතාය** (පුද්ගල ගෞරවයෙන්)
10. **මා සමණෝ නො ගරූහි** (අපගේ ගුරුවරයා යැයි)

යන කරුණු දහයට අනුව ධර්මය නොපැළි ගෙන තම ඥානයට මේදෙය හරි මේදෙය වැරදි යැයි වැටහුණු කළ ධර්මය පිළිගන්න. යනුවෙන් අ:නි: කාලාම සූත්‍රය තුළින් පැහැදිළි කොට ඇත. එසේ වැළඳගත් ධර්මය තුළින්

**"ධම්මංචරේ සුචරිතං - නතං දුච්චරිතං චරේ ධම්මචාරි සුඛං සේති - අස්මිං ලොකේ පරං හිච"**

සුචරිතයෙහි හැසිරෙන්න. දුෂ්චරිතයෙන් වලකින්න. ධර්මානුකූලව හැසිරෙන්නා දෙලොවම සැපසේ ජීවත් වෙයි. සුනාථ ධාරෙත චරාථ ධම්මේ" යන්නෙන් පැහැදිලි වන්නේ අසන්න, අසන ලද ධර්මය සිතේ ධාරණය කර ගන්න. එම ධාරණය කර ගන්නා ලද ධර්මයට අනුව හැසිරෙන්න. සමස්තයක් හැටියට ගත් කළ ධර්මයෙහි ඇති සුවිශේෂත්වය හදුනාගෙන ඒ අනුව ජීවන ගමන පවත්වාගෙන යෑම උතුම් බව මතක් කළ යුතුය. දුර්ලභව ලැබූ මනුස්ස ජීවිතයෙන් හා සත්වයින් අතුරෙන් මිනිසා උසස් මනසක් ලැබීමෙන් මොහොතින් මොහොත පවත්වා ගෙන යෑමට උත්සාහ කළ යුතුය. එසේ කරන ලද උත්සාහයෙන් මෙලොවත් යහපත් ජීවිත ගත කොට පරලොවත් සතර අපාය ආදී දුගතියකට පත් නොවී බුදු දහමේ අවසාන පරමාර්ථය වන නිර්වාන ධර්මයද ලැබීමට සෑම දෙනෙකුටම හැකිවේවා කියා ප්‍රාර්ථනා කරමි.

කොබෙයිගනේ පුබ්බලිය ශ්‍රී සාරානන්ද පිරිවෙනේ ආචාර්ය
ශ්‍රී බෝධිරාජාරාමයේ ගලගෙදර රතන වංශ හිමි.

**පණ්ඩිතයෝ නම් හොඳය. එහෙත් අති පණ්ඩිතයෝ නම් හොඳ නැත.**

# මිහිඳු මාහිමියන්ගෙන් සිදු වූ සමාජ විපර්යාසය සහ හෙළ කලාවේ උපත



**මේ** අසිරිමත් පොසොන් සමයයි. පොසොන් පුර සඳ අහසේ නැගෙන විට අපට සිහිපත් වන්නේ එදා මිහින්තලා පව්වේදී අනුබුදු මිහිඳු මාහිමියන් වහන්සේ දෙසූ සිරිමත් පින්සාර ධර්මයයි. ලක් දෙරණට මහත් ආලෝකයක් ලබා දෙමින් උන් වහන්සේ දේවානම් පියතිස්ස නිරිඳුගේ මහා නුවණ දැක පළමුවෙන්ම රටේ පාලකයා බුදුන් සරණ ගිය උපාසකයෙක් බවට පත්කළ සේක. ලක් වැසියන්ගේ අවිඳු අඳුරින් පිරි හදවත් විද්‍යා ආලෝකයෙන් ආලෝකමත් වූ පොසොන් පොහෝ දිනයේදී මිහිඳු මාහිමියන්ගෙන් වූ සේවය කෙසේ නම් කියා නිම කළ හැකිද?

මිහිඳු මාහිමියන්ගෙන් උදා වුණු අභිනව සංස්කෘතිය හේතු කොට ගෙන විශාලතම සමාජ විපර්යාසයක්, අධ්‍යාත්මික විප්ලවයක්, චින්තන ප්‍රබෝධයක් ලක් වැසියන් අතර ඇති විය. මිහිඳු හිමියන් විසින් ඉගැන්වූ පිළිවෙත් මග සාමකාමී එකක් විය. චාම් දිවිපෙවතකට ආධාර විය. භික්ෂූන් වහන්සේ රටට ආදර්ශයක් විය. රට හදන උපදෙස් මාර්ග කියා දෙන භික්ෂූන් වහන්සේ රජු ඇතුළු සියලු රට වැසියාටම මහඟු ආදර්ශයක් විය. ලක්දිව හැම ගමකම විහාරාරාමයන් පිහිටුවන ලදි. ඒවා සිංහල සංස්කෘතියේ කේන්ද්‍රස්ථාන බවට පත් විය. අනුරපුර මිහින්තලා කන්දෙන් පැන නැගී ලක් දිව දස දිසාවම ගලා ගිය නිර්මල ධර්ම ගංගාව නිසා සියලු සිංහලයෝ බෞද්ධයන් බවට පත් වූහ.

අධර්මයෙන් වෙලී, දුසිරිතෙන් බර වී, අවිද්‍යාවෙන් මුලා වී පැවති මේ දිවයින අනුබුදු මිහිඳු හිමියන් විසින් සද්ධර්මාලෝකයෙන් ඒකාලෝක කරන ලදි. සිංහලයාගේ ඇස් ඇරුනේ නුවණැස පහළ වූයේ, සමස්ථ ලංකා ධරණී තලයම සදහම් ආලෝකයෙන් එළිය වැටුණේ මහින්දාගමනයෙන් පසුවය. ගස් ගල් පර්වත වලට පුදපූජා කරනවුන්, මළවුන්, යකුන්, අදහන්නවුන් ක්‍රමයෙන් තුරන් වෙද්දී බෞද්ධ ප්‍රතිපත්තීන් මත සැකසුණු බුද්ධ ධර්මය හෙළ දිව මුල්බැස ගියේය. සත්‍යය ධර්මයෙන් ආශිර්වාද ලත් සිංහලයෝ ක්‍රමයෙන් ප්‍රබුද්ධ පිරිසක් බවට පත් වූහ.

ලක්දිව තිබෙන ජාතික හා ආගමික නෂ්ඨාවශේෂයන්ගෙන් අපට ප්‍රදර්ශනය වන්නේ හෙළ කලාවේ උපත මිහිඳු යුගයෙන් පසුව ආරම්භ වුණු බවය. සිංහ, කොටි වැනි බිහිසුණු සතුන්ගේ වාසභූමීන් බවට පත්ව තිබුණු විශාල ගල් ගුහා ලොව්තුරා මිහිර කැවුණු විහාර ලෙන් බවට පත්වූයේත්, වනයේ තිබුණු මහා කලු ගල්වලට කරුණා, මෛත්‍රී, සමාධි ගුණ කැවී සිංහලයාගේ කලාකාමීත්වය ඔප් නංවමින් ශාන්ත බුදු පිළිම බවට පත් වූයේත්, අලි වගවලසුන්ගේ කෙළි බිම් බවට පත්ව තිබූ විශාල වන පෙදෙස් රමණීයවිහාරාරාමයන් ගෙන් හා අලංකාර මාළිගාවන්ගෙන්ද මනහර පුෂ්පෝද්‍යානයන් ගෙන්ද සිත්කලු පොකුණු වලින්ද යුත් ඓතිහාසික ජය භූමීන් බවට පත් වූයේත් බුදු සමය නිසාය. මහ කඳු ශිඛරයක් වූ සමනොළ කන්ද ලක්ෂ සංඛයාත බැතිමතුන්ගේ ශුද්ධ භූමියක් බවට පත් වූයේත් අනුරාධපුරයත්, මිහින්තලයත්, පොළොන්නරුවත්, කතරගම කිරිවෙහෙරත්, සිතුල් පව්වත්, සීගිරියත්, දඹුලු විහාරයත් අපට ඇති වූයේ බුදුසමය නිසාය.

දුටුගැමුණු මහාපැරකුම්බාවන් වැනි වීරෝදාර ප්‍රතාපවත් රජවරුන් සිරිසංඝබෝධි, බුද්ධදාස වැනි බෝධිසත්ව ගුණෝපේත රජ දරුවන් සිගිරි කාශ්‍යප වැනි කලාකාමී නරවිරුවන්, සුරනිමල ථේරපුත්තාභය වැනි රණකාමී යෝධයින්, අරිය මලියදේව වැනි සිංහල රහත් හිමිවරුන් අනුලා වැනි රහත් මෙහෙණින්, ලීලාවති, කල්‍යාණවතී වැනි රාජ්‍ය පාලනයෙහි නියුක්ත රජ මෙහෙසියන් විහාර මහා දේවී, සෝමා දේවී වැනි වීරෝධාර හෙළ මව්වරුන්, හේමා වැනි ගුණ නුවණින් හෙබි කුළ කතුන් මේ රටේ පහළ වූයේත් පෝෂණය වුයේත් බුදු සමයේ බලපෑම නිසාය.

ධර්මසේන හිමි, වැත්තෑවේ හිමි, මයුරපාද පරිවේනාධිපති බුද්ධ පුත්‍ර හිමි, විදාගම මෛත්‍රිය හිමි, ගුරුළුගෝමී, විද්‍යාචක්‍රවර්තී හා දෙවනි පැරකුම්භාවන් වැනි මහා පඬිවරුන් බිහිවූයේත් බුදු සමය නිසාය.

මේ අනුව මහින්දාගමනයත් සමඟ ඇතිවුණු බෞද්ධ ප්‍රභාවෙන් දීප්තිමත් නොවුණු එකදු අංශයක් හෝ ඇතැයි නොකිව හැකිය. විචිත්‍ර චරිතයෙන් කාරුණික ගුණයෙන් ආදර්ශ සම්පන්න පැවැත්මෙන් ජන ප්‍රසාදයටත් ගුණ කථනයටත් පාත්‍රවුණු ස්ත්‍රී රත්නයකැයි කිව හැකි කවර හෝ සිංහල වනිතාවක් වේ නම් ඇය මිහිඳු මහා රහතන් වහන්සේගේ ගුණ කදම්බය වන පසමලින් පුද කළ දුගී දූස්සකැයි හඬ නගා කීම කිසිම විදිහකින් මදි පුංචිකමක් නොවිය හැක.

මේ අති උත්තම පොසොන් පුන් පොහෝ දිනය වූ කලී අනුබුදු හිමියන් වහන්සේ පිළිබඳවත් දඹදිව අශෝක නරනිඨයන් පිළිබඳවත් අතිවිශිෂ්ඨ අනුස්මරණයන් එකිනෙක පෙරට ගෙන එන අතිශයින්ම වැදගත් අතිපාරිශුද්ධ දිනයෙකි. මේ අතිශේෂ්ඨ මහා පුරුෂයන් පිළිබඳව, අතිසම්භාවනීය චරිතාපදානයන් පිළිබඳව මෙනෙහි කිරිම මෙදින කළ හැකි මහා කුසල කර්මයක් වන්නේය. විසිතුරු සිද්ධීන්ගෙන් විචිත්‍රවුණු අශෝක චරිතාපදානය දෙස හැම බෞද්ධ සිතකටම මහත් ආලෝකයක් ගෙනදීමට තරම් හැම අතින්ම ප්‍රභලය. එතුමා විසින් ගිරිපුවරු ටැම් ආදියෙහි කොටවා තමන් සතු සෑම රාජ්‍යයෙහි තැන්තැන්වල පිහිටුවන ලද ධර්ම ලිපි වලින් අංශුමාත්‍රයක් කියවා මෙනෙහි කිරීමට වුවද සියල් සතුනට වැඩ සාදාලිමෙහි එක සේ පොහොසත්ය.

බෞද්ධ සභ්‍යත්වයෙහි දරුවා නැළවුණු තොටිල්ල යැයි ඉතිහාස විශාරදයන් විසින් විවරණය කරනු ලබන මිහින්තලය ගැන පොසොන් පොහෝදා මෙනෙහි කරන ඕනෑම බෞද්ධයකු වුවද ප්‍රසාධසංවේගයෙන් ඇලලී යනවාට කිසිම අඩමානයක් නැත. මහා භාරත අධිරාජ්‍ය වැනි ඓශ්චර්යයකින් අනූන වූ දේශයක සිංහාසනය ඉවත දමා මිහින්තලාවේ ගල් ලෙනක් තුළ මුළු ජීවන යුගයක් ගෙවමින් සිංහල රටටත්, සිංහල මිනිසාටත් නොනැසෙන රටටත්, සිංහල මිනිසාටත් නොනැසෙන ආලෝකයක් ගෙන දුන් අනුබුදු මිහිඳු මාහිමියන් සමණාමයං මහා රාජ" යනුවෙන් ප්‍රථමයෙන්ම වදාළ පරිදි ලංකාවේ මතුවූ අලුත් ගුණ වගාව අභිනව සංස්කෘතිය පිළිබඳව අල්පමාත්‍ර වූද හැඟීමක් ඇති කර ගත හැකි නම් එයම අතිශයින් සාර්ථක වූ මහා පොසොන් උළෙලක් පැවැත්වූවා වන්නේය. ඒ පරිද්දෙන් මිහිඳු උදාවත් සමඟම පරම්පරාවෙන් පරම්පරාවට පැවත ආ උසස් බෞද්ධ ප්‍රතිපදාවේ නිර්මල අංග ඔබෙනුත් ආරක්‍ෂා වී අනාගත පරම්පරාවේ උරුමයක් හැටියට තබා ජාතියේ උදාර රුධිරය එයින් පෝෂණය කළ යුතු යැයි අවංක අධිෂ්ඨානයක් බවට පත් කරගත හැකි නම් ඔබ උදාර සිංහල බෞද්ධයකු වීමේ මූල ප්‍රණිධිය සම්පූර්ණ කළ කෙනෙකැයි ඉතා ගෞරවයෙන් සිහිපත් කළ හැකි වනු ඇත. ළමා හදවතට කවිලියූ එස්. මහින්ද හිමියන්

"ලක් වැසියන් කෙරෙහි නැමී
අරහත් මහා මිහිඳු හිමි
පෙව්ව උතුම් සදහම් මී
පුත නුඹටත් පොවමි එමී"

මෙසේ සිංහලයන්ගේ ලෞකික ලෝකෝත්තර හැම දියුණුවකටම මුල් වූයේ මිහිඳු මාහිමියන් විසින් ඇති කළ බුදු සමය බව කිව යුතුය.

සිංහලයන්ගෙන් කිසිදු ගෞරවයක් බලාපොරොත්තු නොවී හුදු කරුණාවෙන් යුතුව ස්වදේශය හැර දමා විදේශගතව අර්ධ ශතවර්ශයකට අධික කාලයක් මුළුල්ලෙහි කරන ලද උදාර ශාසනික සේවය සිංහල ජාතියත් ලංකා සම්බුද්ධ ශාසනයත් පවත්නා තාක් අමරණීයව පවතිනු ඇත. මිහිඳු මාහිමියන් ප්‍රධාන ඉට්ඨිය උට්ඨිය, සම්බල, භද්දසාල, සුමන සාමණේර, භණ්ඩුක උපාසක, ප්‍රධාන ධර්මදූත පිරිස මුණ ගැසුණු මිස්සක පව්වෙන් හමා එන සුළං රැල්ල පවා සිංහල සැදැහැතියාගේ ගත සිතට ලබා දෙනුයේ විශාල සැනසිල්ලකි. ගල් පඩි එක්දාස් අටසිය අසූවකට අධික සංඛ්‍යාවක් ගෙවා අවුරුදු පතා ලක්ෂගණන් බැතිමතුන් මිහින්තලා පව්වට නැග සැනසුම් සුසුම් හෙළන්නේ මිහිඳු මාහිමියන් විසින් එහි සිට අරඹන ලද සද්ධර්මවිප්ලවයට කෘතෝපකාර දක්වීම වශයෙනි.

දිල්රුක්ෂි අබේකෝන්

**" මිහිඳු මාහිමියන්ගෙන් උදා වුණු අභිනව සංස්කෘතිය හේතු කොට ගෙන විශාලතම සමාජ විපර්යාසයක්, අධ්‍යාත්මික විප්ලවයක්, චින්තන ප්‍රබෝධයක් ලක් වැසියන් අතර ඇති විය. මිහිඳු හිමියන් විසින් ඉගැන්වූ පිළිවෙත් මග සාමකාමී එකක් විය. චාම් දිවිපෙවතකට ආධාර විය. භික්ෂූන් වහන්සේ රටට ආදර්ශයක් විය"**

රංගිරි ශ්‍රී ලංකා RSL NEWSPAPER

රංගිරි - ශ්‍රී ලංකා මාධ්‍ය ජාලය
රංගිරි දඹුල්ල සංවර්ධන පදනම,
අංක 130, දඹුල්ල.

දුරකථනය: 066-2283606 (දිගුව 161) හෝ 071 5361328
ෆැක්ස්: 066-2284603
ඊමේල්: rangirinewspapers@gmail.com
වෙබ් අඩවිය: www.rangirisrilanka.lk

# පොසොන් පණිවුඩය අර්ථවත් කරමු.

අනුබුදු මාහිමියන් විසින් ලංකාද්වීපයට සම්බුදු දහම හඳුන්වා දීමේ උත්තම දවස සැමරීමට සියලු බෞද්ධයෝ සැරසී සිටිති.

ලංකාවාසීහු අධ්‍යාපනයෙන්, සංස්කෘතියෙන්, අර්ථක්‍රමයෙන් මෙන්ම අධ්‍යාත්මික ජීවිතයෙන්ද පරිපූර්ණ වෙනසකට ලක්වූයේ බොදු දහමේ ආභාෂයෙනි. ඒ හැර ගෘහනිර්මාණ ශිල්පය, ලේඛන කලාව, සිරිත් විරිත් ඇතුළු තවත් අංග රාශියක් ඒ අතර තිබෙයි.

අශෝක අධිරාජයා අපට දායාද කළ ඒ අසිරිමත් දහම ශ්‍රී ලංකා දේශයේ ජන විඥානයේ පරමාදර්ශය වූ බව කව්රුනුත් පිළිගනිති. බුදු දහම, ලෝකය තුළ ශ්‍රී ලංකාව සහ ලාංකිකයා ඉහළින් ඔසවා තබන්නට ද උපකාරී වූහ.

කෙසේ වුවද බුදු දහම හා අපගේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් ගත් කළ අඩුව තිබියදී අත පුච්චා ගැනීම යන ආත්‍රෝපදේශය අපට සිහිපත් වෙයි. මෙලොව, පරලොව යහපත පිණිස සේම පවුල ජනසමාජය සහ රටක් වශයෙන්ද උසස් ජීවිතයක් ලබාගැනීම සඳහා බුදුදහම ලබාදෙන මාර්ගෝපදේශය අන් කවරම හෝ ආගමකින් ලැබිය නොහැකිය.

පරිසර සංරක්ෂණය, තිරසර ගොවිතැන යනාදී අර්ථක්‍රමයන් මැනවින් අපට උගන්වන බුදුදහම රටට උචිත දේශපාලන ක්‍රමය ද පෙන්වා දී තිබේ. නමුත් අපි එකී උසස් බුද්ධ දේශනාවන්ගෙන් ප්‍රයෝජන ගන්නේ දැයි යන්න කව්රු විසිනුත් සිතා බැලිය යුතුය.

ශ්‍රී ලංකාද්වීපය තුළ මානව ශිෂ්ඨාචාරය වර්ෂ ලක්ෂ 7ක් පමණ පැරණි බව ඉතා මෑතකදී සොයා ගැනුණි. ඒ අනුව මේ පොලෝතලයේ මානව වංශ කථාව පෘථිවිය මත ජීවය ආරම්භය දක්වාම පැතිර යන්නකි. එවන් උසස් ඉතිහාසයක අප වර්තමානයේදී මුහුණ දී සිටිනුයේ සුවිසල් ගැටළු හා අර්බුද රැසකටය. ඉන් බොහොමයක් මිනිස්කමට නොගැලපෙන ඒවා බව පෙනී යයි.

ගෙවුණු වෙසක් පෝය මෙන්ම එළඹෙන පොසොන් පෝය ද අපට සිහිපත් කරදෙන්නේ මෙලොව පහළවූ ශ්‍රේෂ්ඨතම චින්තකයාගේ, දාර්ශනිකයාගේ නොඑසේනම් තිලෝගුරු ශාස්තෘවරයාගේ සර්ව කාලීන ලෝක යථාර්ථයේ පණිවුඩයයි.

අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන්නෙන් ඇරඹි ඒ මහා දහම් පණිවුඩය විශ්වයේ කාහටත් එකසේ පොදුය. එය අපට ලැබී දැන් වසර 2564ක් ද සම්පූර්ණ වී අවසන්ය.

පොසොන් මාසයේ අප ලද ඒ අසිරිමත් බෞද්ධ දහම් පණ්වුඩයේ හැසිරෙමින්, ඒ මඟ යමින්, බුදු දහම පෙන්වාදෙන සදාකාලික ශක්තිය ළඟා කර ගැනීමට අප මෙතැන් සිටවත් පිළිවෙතින් පෙළගැසෙමු.



සිත්කලු වන ලැහැබ
වීතරාගී උතුමන්ගේ පවා
සිත් තුළ ප්‍රබෝධයක්
ප්‍රසාදයක් ඇති කරයි

ගෞතම බුදුන්වහන්සේ



# පරිසර හිතකාමී ශාස්තෘවරයාණෝ



සිත්කලු වනලැහැබ විතරාගී උතුමන්ගේ පවා සිත්තුළ ප්‍රබෝධයක් ප්‍රසාදයක් ඇතිකරන බැව් මෙයින් පැහැදිළි වෙයි.

බුදුරජාණන් වහන්සේ පරිසරයේ අගය සුන්දරත්වය අවබෝධ කරගත්තා සේම එය රැක ගැනිමේ වටිනාකමද පෙන්වාදුන් ශ්‍රේෂ්ඨ නායකයෙකු වූහ. ගස්වැල් රෝපණය කිරීම, උද්‍යාන පිහිටුවීම, ඒදඬු පාලම් තැනවිම, පැන්හල් පොකුණු ඉදිකිරීම සැමදා පිං වැඩෙන උදර සමාජ සේවාවන් සත්කාර්යයන් ලෙස පෙන්වාදුන් අයුරු සංයුක්ත නිකායේ වනරෝප සූත්‍රයෙහි දැක්වෙයි.

"ආරාමරොප වනරොපා යෙ ජන සේතුකාරකා
පපංච උදපානංච යෙ දදන්ති උපස්සයං"

**තුරු ලතාවන් ළා දළු පත්වලින් වර්ණවත් වී මලින් සුවඳවත් වී ඵලවලින් පිරී ඇති මෙම පොසොන් සමය සමස්ත ලෝකවාසී බෞද්ධයන්ගේම සිත්සතන් බුද්ධාලම්භන ප්‍රීතියෙන් පිරිඉතිරී යන කාලයයි. බුදුරජාණන් වහන්සේගේ මහා කරුණාව, මහා ප්‍රඥාව සහ සීල සමාධි විමුක්තිඥාණ දර්ශනාදී අපරිමිත ගුණසමුදායන් පිළිබඳව මෙම කාලයේදී වෙනදාට වඩා මහත් ශ්‍රද්ධාවෙන් ගෞරවයෙන් යුතුව සියල්ලෝම සිහිපත් කරති. අහස පොළව හා සාගරය සම්බන්ධ සියලු පාරිසරික සම්පත් දූෂණය වීමේ සහ විනාශ වීමේ තර්ජනයට මිනිසා මුහුණදී සිටින මෙම යුගය බුදුරජාණන් වහන්සේගේ පරිසර හිතකාමීත්වය පිළිබඳව විමසා බැලිමටද ඉතාමත්ම සුදුසු කාලයයි.**

බුදු රජාණන් වහන්සේ තරම් ස්වභාවික පරිසරය ඇසුරු කළ එහි සෞන්දර්යය ස්පර්ශ කළ අගය පෙන්වා දුන් අන්‍ය ශාස්තෘවරයෙකු නැති තරම්ය. ගිහි ජිවිතයෙන් සමුගැනීමේ සිට බුදුවී පිරිනිවන් පානතෙක්ම උන්වහන්සේගේ ජිවිතය ස්වභාවික පරිසරය සමඟ බද්ධවී පැවතුණි. අවුරුදු හයක් වනගතව තවුස් දම් පිරූ උන්වහන්සේ බුද්ධත්වයට පත්වූයේ නේරංජනා ගඟ ඉවුරෙහි සුදු වැලිතලාවක් මත පිහිටි බෝරුකක් මුලදීය. ජේතවනාරාමය පූර්වාරාමය නිග්‍රෝධාරාමය වැනි මහා විහාරවල වාසය කර තිබෙනුයේ වැසි සාර මාසය තුළ පමණි. බොහෝ විට උන්වහන්සේගේ නවාතැන ගිමන්හළ වූයේ රුක්මහල් වන ලැහැබය. තණබිම් ගල්තලාවන් සහ පර්වත ගුහාවන්ය. ගංගා ඇළ දොළ වන උයන්, පර්වත මුදුන්, වැලි තලාවන් ඇසුරු කරමින් ධර්මදේශනාවන් පැවැත්වූ උන්වහන්සේ පිරිනිවන් පා වදළේ කුසිනාරා නුවර මල්ල රජදරුවන්ගේ උපවත්තන නම් සල් උයනේදීය. සිදුහත් කුමරු ලෙස උපත ලැබුයේද ලුම්බිණි සල් උයන තුළදීය. ගහකොළ, සතා සිව්පාවා, ඇළ දොළ, ගිරිශිඛර උපමාවටද ගෙන ධර්මය දේශනා කළ බුදුරජාණන් වහනසේ පරිසරයේ සුන්දරත්වය නොයෙක් වර පෙන්වා දුන්හ.


බුද්ධත්වය ලබාගැනීම සඳහා බවුන් වැඩීමට තෝරාගත් භූමි භාගය සිත්කලුය. වන ලැහැබ ප්‍රසාද දනවන සුළුය. සුදුවැලිතල ඇති මනාගොටුපළවල් ඇති සිත්ගන්නා සුළු නදිය ගලා බසී. හාත්පස ගොදුරුගම් වෙයි. බවුන් වඩනු කැමති කුලපුත්‍රයනට මේ බිම සුදුසුය යනුවෙන් ආර්‍යපරියෙසන සූත්‍රයේදී සිත්කලු වන වැනුමක් ඉදිරිපත් කරති. වීතරාගී උතුමන් වනපෙත්හි ඇලෙන බවත් වරෙක උන්වහන්සේ පෙන්වා දුන් අයුරු ධම්මපදයෙහි දැක්වෙයි.

"රමණියානි අරඤ්ඤානි යත්ථ න රමති ජනො
වීතරාගා රමෙස්සන්ති නතේ කාමගවෙසිනො"

මෙසේ වටිනා පුණ්‍යකර්මයක් ලෙස පරිසර සංරක්ෂණ විධි පෙන්වාදුන් උන්වහන්සේ තුරුලතා සහා සත්වයන් විනාශකරමින් කරන අන්‍ය ආගමික යාගහෝම පවා අධාර්මික බැව් පෙන්වාදුන් ආකාරය දීඝනිකායෙහි කූටදන්ත සූත්‍රයෙන් පැහැදිළිවෙයි. මුලින්, තදින්, පුරුකෙත්, දල්ලෙත් සහ ඇටවලින් පැළවෙන ශාක හා බීජ විනාශයෙන් වැලකී සිටීම සම්‍යදෘෂ්ටික පුද්ගලයාගේ සීලයට පවා අයත්වන බව සාමඤ්ඤඵල සූත්‍රයේදී පැහැදිළි කර ඇත. නිල්තණමත, පිරිසිදු ජලය මත, මූත්‍රා කිරීම කුණුරොඩු දැමීම ඉඳුල් දැමිම වරදක් බැව් භික්ෂූණීන් වහන්සේලාටද පෙන්වා දුන් බුදුරජාණන් වහන්සේ ගස්වැල්, පක්ෂීන් රැක ගැනීම පාලකයන්ගේ වගකීමක් ලෙසද චක්කවත්ති සීහනාද සූත්‍රයේදී පැහැදිළි කළහ. තුරුලතා සිඳලීම, අතුකඩා දැමීම, ආදී ක්‍රියාවන් භික්ෂූන් වහන්සේට තහනම් කළ අයුරු විනය පිටකය තුළින්ද දැකගත හැකිය.

මෙසේ කරුණු සළකා බැලීමේදී බුදුරජාණන් වහනසේ පරිසරය සමඟ ජිවත් වූ එහි සෞන්දර්යය අත්විඳි එහි අගය පෙන්වා දුන් එය රැකගැනිම සඳහා මඟපෙන්වූ සැබෑ පරිසර හිතකාමී ශ්‍රේෂ්ඨ ශාස්තෘවරයෙකි. උන්වහන්සේ ආදර්ශයට ගනිමින් පරිසර හිතකාමී මිනිසුන් ලෙස ජිවත්වීම මානව සංහතියේ මෙන්ම මෙම පොළෝ තලයේද ආරක්ෂාව පැවැත්ම සංවර්ධනය පිණිස හේතුවන්නේය.

පූජ්‍ය සීගිරියේ ධම්මජෝති හිමි



# සඳ සිසිල

සංස්කාරක
"සඳ සිසිල"
රංගිරි ශ්‍රී ලංකා පුවත්පත
අංක 130,
නුවර පාර,
දඹුල්ල.

## පොසොන් සඳෙන් නැහැවුණ ලක් දෙරණ

මිහිඳු සමිදු ලක් දෙරණට වැඩියදිනේ
ගහකොළ පවා අවනත වී නිසලවුනේ
සදහම් අම මිහිර දැනිලා එදින අනේ
දෙවන පෑ රජුත් අවි බිම තැබූ වානේ

දඹදිව් තලයෙ සිට ලක් දෙරණට වැඩලා
මිස්සක පව්ව තුළ සදහම් සිරිබෙදලා
සුමන සමිඳු උපසම්පන්නව කරලා
භණ්ඩුක උපාසක සසුනට ඇතුලුකළා

ලක් වැසියා නොදුටු හා නොලබපු දහමයි
ගෙන එන්නට මිහිඳු හිමියන් කැප වූවයි
තුනුරුවනගෙ ගුණ වරුසා ඇද හැලුනයි
එතුළින් අපේ ලක් දෙරණම නිවුනයි

වැව් මහ අමුණු සැදිලයි රට ගොඩනැගුණේ
දාගබ් පෙති පිළිම තුළ බුදුගුණ රැඳුනේ
සංග්‍රහ වස්තු ඉටු කරමින් පිහිට වුනේ
පොසොන් සඳෙන් නිවනට දොරගුලුඇරුණේ

දිගු ඉතිහාසයක් ඇති ඒ පින්බරදිනය
සුචරිතවත් බවෙන් සිහිකර ගතයුතුය
දන් සිල් භාවනා කරමින් තමදිවිය
ජය ගන්නට පතමු මේ මිනිසත් භවය

ගලගෙදර රතනවංශ හිමි

## හද තුළ පිරි අමා පියුම

අපරාජිත සිත මතුවී මල් සුවඳක් සේ
මා අතහැර ගිය සොම්නස පැමිණෙයි පෙර සේ
සිහින් සිනාවක සළකුණු වත මත සුදිලේ
තිලෝතිලක අමාපියුම හද තුළ පිපුණේ

රුවන් කණක විමන් අතර සිහින දුටුවදා
සවන් පුරා සරාගි ගී පිරුණු තුරුණු දා
හිමි රුව අභියස අඳුරේ දෙනෙත වැසුනු දා
දිවි අරණට අඳුර ඇඳුනි නොමැතිව දිනිදා

සඳුන් තුරෙක පිපුණු කුසුම් සුවඳක් සේම
නිරාමිසව විදිමි ලබමි හිමි ගුණ සුවඳ
පසක් කළා සේ දුටු දේ සසරේ පැතුව
නිසංසලය මසිත සිහින සිතුවිලි දාම

ශ්‍රාස්ත්‍රපති වික්‍රමසිංහ අතපත්තු
තලවත්තේගෙදර

## අනුබුදු හිමියන් මෙහි වැඩිදා...

බෝපත් අතරින් හමා සුළං රැල්
මිස්සක පව්වෙන් ගලා ගියා
අනුබුදු හිමියන් වැඩිය සඳේ
සමරමු අපි ඒ පොසොන් දිනේ
අඹතලයේ ලා දළු ළෙල දී
අනුබුදු ගුණ දම් සුවඳගලා
සිරිලක් දෙරණට
දම් පණිවිඩ ගෙන
අනුබුදු හිමියන්
මෙහි වැඩි දා
දිවා ගුවාවට  සඳ පායා
මහමෙව්නාවෙහි
සිසිල ලබා
සුදනන්
දුදනන්
අමා සුව ලබා
ලක් දන තිසරණ
සරණ ගියා

දිල්රුක්ෂි අබේකෝන්

## පූරුදු වෙන්නට ලියමි...

අහුලාගෙන අඟුරු කැටයක්
කොතැනක හෝ හිඳ මේ මහා පොළව පිට

නෙත් යොමා
දිලිහෙන
මිනිසුන්ගේ හදවත් මුඩුක්කු වෙත
කුරුටු ගා එකිනෙක අකුරෙන් අකුර
දෙමළ ද සිංහල ද ඉංග්‍රීසි ද
දන්නා භාෂාවක අකුරකින්

පැළ කරමි කවියේ බිජුවට
මේ මහා පොළව මත
කවි අකුරු පැල නොයෙක්
පැලව නැගී මහ විසල් තුරු හිස
හිරු දිලෙන සඳ බොඳව ගිය
කවි සිතුවම් ද දැක මේ පොළව පිට
පුරුදු වන්නට ලියමි මම
එකම එක කවියක්
අතීතයේ ප්‍රතිරූපයක් නොව
අතීත හිරු කිරණකින් ඔප වුන
එකදු එක වැලි කැටයක් හෝ වේවා
මේ අකුර පොළව පිට

ශාස්ත්‍රපති
ඕපල්ගල චන්ද්‍රරතන හිමි

## පොසොන් සිරිය

මිහිඳු සමිඳු වැඩිය දිනේ
අදයි පොසොන් සඳ බැබලේ
අඹතල අරලිය සෙවනේ
සාධු සාධු හඬ රැව්දේ

අරලිය අතු පතර පුරා
පොසොන් සඳේ රටා ඇඳී
සීතල සුළඟක් අවිදින්
ලොව්තුරු සුව තුරුළු කරන්

මිස්සක අඹතලය පුරා
සිල් සුවඳින් ඔකඳ වෙලා
සමිඳු දෙසූ දම් අසලා
පොසොන් සිරිය ජනිත වෙලා

තිලක් චන්ද්‍රසේන වැලිකල

## කුස පබා

එදා කළ පව් මෙදා පළදුන්
කොණ්ඩ කැවුම් මුහුණක්
විරූපි වත මත සුරූපී පබවත
ඇඳී රැඳී බැබලේ

පූරණය කළ පාරමී බල
ඌණ පූරණයේ
වෙර වඩා මුදිතා බවින් දින
අදිටනක මහිමේ

දිනූ රාගික පැතුම් අපමණ
විරාගික ගමනේ
නිරාමිස සුව ලබාගෙන මිස
නොනවතින සටනේ

ප්‍රභාවත් කළ පබා " දිගු නෙත
වසන් කළ කඳුළේ
සුභාවිත පෙම් කතා පුවතක්
සුපින්බර සසරේ

වංක ගිරියේ තවුස් දම් මැද
පිදූ අඹු දරුවෝ
සඳ කිඳුරු දා සුරැකි පති දම්
නිවන් මග තැනුවෝ

පාරමී ගුණ බලය පින් සිත
උපන් රාහුල සේ
ළසෝ දුක බණ පදට පෙරළු
යසෝදරාවයි මේ

වික්‍රමසිංහ අතපත්තු
තලවත්තේගෙදර

කුරිරු හද ගැබ ගල් තලාවකි දහම් වැස්සෙන් මුදු නොවෙන්නේ
සොඳුරු සිත්තුල වැඩෙන සදහම් ගුණ වගාවෙහි ඵල ලබන්නේ
මහරු බුදුගුණ පහුර ලෙස බැඳ සසර සයුරෙන් එතෙර වන්නේ
කුඹුරු වතුපිටි විනා වැස්සෙන් ගල් තලේ මොන ඵලද ගන්නේ

සරත් අර්තනායක - සඳලංකාව

ඔබගේ නිර්මාණ සිව්පද කාව්‍ය නම් කවි 4 - 5 කටත් නිසඳැස් කාව්‍ය නම් පේළි 10-15 අතර නිර්මාණය කර අප වෙත එවන්න.

රංගිරි ශ්‍රී ලංකා
RSL NEWSPAPER

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කර්මාන්ත

# බොදු සිත් සනසන සණ්ඨා කර්මාන්තය









මහනුවර යුගයෙන් ආරම්භ වූ පිත්තල කර්මාන්තයේ වර්ධනය මේ වනවිට ඉතා විශාල දියුණුවක් ලබා ඇත. පිත්තල කර්මාන්තය දියුණු වූන මුත් මහනුවර යුගය ආරම්භ වන විට ලෝකඩ කර්මාන්තය දුර්වලව පැවතින. අප රටේ පස්වන සියවස හෝ ඊට පෙර සිට ලෝකඩ භාවිතය වූ බව දැනට හමුව ඇති ලෝකඩ පිළිම ආශ්‍රයෙන් අනුමාන කළ හැක. නමුත් මහනුවර යුගය වන විට ලෝකඩ කර්මාන්තයේ පිරිහීමක් දක්නට ලැබුණු බව ඓතිහාසික තොරතුරු වලින් කියැවේ.

මුල් කාලීනව සණ්ඨා සෑදීම සඳහා ලෝකඩ භාවිතා වූ නමුත් ලෝකයේ විවිධ රටවල් තුළින් නැගෙන තොරතුරු අනුව සතුන්ගේ අං, ලී, වීදුරු, මැටි, රන්, පිත්තල සහ වානේ යොදා ඇති බව පෙනේ. සණ්ඨා තැනීම සඳහා සුදුසුම වන්නේ ලෝකඩ බව කියැවේ. මෙය තඹ හා ටින් විවිධ අනුපාතයකට යොදා සකස් කර ගත් මිශ්‍රණයකි. ඊට අමතරව තුත්තනාගම් ද යොදා ගන්නා ලද බව පෙනේ. විශාල සණ්ඨා තැනීමේදී ටින් ලෝහය මිශ්‍ර වන්නේ මද වශයෙන් බව කියැවේ. අප රටේ සණ්ඨා සෑදීමේ දී සැදැහැතියන් විසින් රන් හා රිදී ලබා දීම නිසා එලෙස ලෝහ මිශ්‍ර කිරීමක් ඇතැම් අවස්ථාවලදී සිදුවන බව ද පෙනේ. එසේ වීමෙන් සණ්ඨාවේ මිහිර වැඩි බව ද කියැවේ.

සාමාන්‍යයෙන් සණ්ඨාවක් නිර්මාණය කිරීමේදී ක්‍රමානුකූලව ලෝකඩ උණු කිරීමේ ක්‍රමයක් ඇත. මේවා නියමාකාරව තනාගත් අච්චුවලට වත් කරනු ලබයි. සණ්ඨා වේ නොමනා සවිවරතාවයක් ඇති නොවන පරිදි උපරිම ස්පටික වැද්දුමක් ලැබෙන සේ හුරුබුහුටි ලෙස වාත්තුව නිම කරනු ලැබේ. ලෝදිය වත් කිරීමේදී අච්චුව තුළ හිරවී තිබෙන වාතය ක්‍රමානුකූලව නිවීමට ඉඩ හරිනු ලබයි. මෙසේ නොකළ හොත් සණ්ඨාව පුපුරා යෑමට ඉඩ ඇති බව කියැවේ. මූලික ස්වරූපය මතු කරනු ලබන්නේ ඔප දැමීමෙන් අනතුරුවය.

ඉතාම සියුම් නාද ජනනය කර ගැනීම සඳහා සණ්ඨාවේ නිශ්චිත ස්ථානවල ලෝහ කොටස් කට්ටලයකට සවිකොට භ්‍රමණය වීමේදී ඉවත් කරනු ලබයි. මහනුවර යුගයේ ආරම්භය වන විට මෙම

සණ්ඨා කර්මාන්තය මොරටුව ප්‍රදේශයට පමණක් සීමා විය. මේ වන විටත් මෙම කර්මාන්තයේ නියැලි පවුල් කිහිපයක් මොරටු ප්‍රදේශයේ අදටත් සිටිති. ඔවුහු ආගමික සිද්ධස්ථාන සඳහා පමණක් සණ්ඨා තනයි. ප්‍රමාණයෙන් විශාල සණ්ඨා තැනීමට අවශ්‍ය වූ විටෙක අදාළ ස්ථානයට ගොස් තාවකාලික මඩුවක් තනා අවශ්‍ය භාණ්ඩ සකස් කරනු ලබයි. අප රටේ තවමත් භාවිත වනුයේ පාරම්පරිකව පැවත ආ ඉටි අච්චු ක්‍රමය වේ. සණ්ඨාරයක් සෑදීමේදී මුලින්ම අදාළ ශිල්පියා විසින් මැටියෙන් අච්චුවක් තනා ගනු ලබයි.

මෙම අච්චුව වාත්තුවේදී අධික ලෙස ගිනියම් වේ. එහිදී අච්චුව පුපුරා නොයෑම සඳහා අවශ්‍ය ලෙස සවිවරතාවයක් තබා ගත යුතුය.සවිවරතාවය තබාගැනීම පිණිස හුඹස් මැට්ට යොදා ගැනීම බොහෝ දුරට සිදු කරනුලබයි. දුම්මල, පොල්තෙල්, පරණමුඩි, පැරපින් ඉටි මිශ්‍රණයෙන් සකස් කළ මාත්තුවක්ද සකස් කර ගන්නා බව කියැවේ. සකස්කර ගන්නා ලද සණ්ඨාවට කාක්කතාල සවිකිරීම, කුණ්ඩුව සවි කිරීම, තාල පිහිටුවීම, අච්චුවීම, අච්චුවේ පිටත කඩොල්ල තැනීම ආදී විවිධ අවස්ථා වෙයි.

පාරම්පරික වාස්තු ශිල්පීන් කුඩා ප්‍රමාණයේ සණ්ඨා තනන විට රාහු කාලය, මරු සිටින දිශාව, හෝරා ශුද්ධිය සහ සතියේ තෝරාගත් දින පිළිබඳව සැලකිලිමත් වේ. වාත්තු කිරීම පිළිබඳව දින යොදා ගැනිමේදී අඟහරුවාදා, බ්‍රහස්පතින්දා සහ සිකුරාදා දින සුභ දින ලෙසත් සඳුදා සහ බදාදා අශුභ දින ලෙසත් සැලකේ. රාහු කාලය ද මඟ හරිනු ලබයි. බුදුන් වැඳ ගණ දෙවියන්ට පොල් වෙන්කර චන්ද්‍ර හෝරාවෙන් ලෝහ උණුකර ලිපද මුට්ටමද දල්වනු ලැබේ. විශාල ප්‍රමාණයෙන් සණ්ඨාවක් වාත්තු කරන්නේ නම් නැකතක් ශුද්ධ කර ගැනීමේ සිරිතක් ඔවුන් අතර පවතී. රටකෝව භාවිතයට ඒමට පෙර ශිල්පීන් විසින් තනාගත් දේශීය කෝව ලෝහ උණු කිරීමට භාවිතා විය. එය තනාගන්නා ලද්දේ මිණිරන් කුඩු වලින් මැටි එකට එක අනුපාතයට මිශ්‍ර කිරීමෙනි. මෙම මිශ්‍රණයට ජලය දමා හොඳින් පදම්කර දින දෙකක් පමණ පල් කිරීමට තැබීමෙන් පසුව නියමිත හැඩය අතින් සකස් කර ගැනීමෙන් පසුව කෝව පුලුස්සා ගැනීම ප්‍රථමයෙන් සිදු කරයි.

වසර දෙදහසකට අධික කාලයක සිට අප රටේ සණ්ඨා භාවිතය පවතී. සණ්ඨාව සහ සම සීනුව බටහිර රටවල භාවිතයට පත්ව ඇත්තේ වසර දහසක පමණ කාලයක් තුළය. නමුත් අප බෞද්ධ විහාරස්ථානයක නාද වන සණ්ඨාවක දේවස්ථාන වල නාදවන සීනුවේ හඬෙහි වෙනසක් පවතී. මෙය විශාල පරතරයක වෙනසකි. ඊට හේතුව වශයෙන් සිතිය හැක්කේ විහාරස්ථානයක පවතින්නා වූ සණ්ඨාවකට පල්ලියක පවතින සීනුවක ඇති කන්කලු ස්වරයක් අවශ්‍ය නොවන බැවින්ය යන්න සිතිය හැක. සීනුව සහ සණ්ඨාව අතර සකස් කිරීමේදී පවා වෙනසක් ඇත. අප මතු දිනෙක ඒ පිළිබඳව දැන ගනිමු.

**මුල් කාලීනව සණ්ඨා සෑදීම සඳහා ලෝකඩ භාවිතා වූ නමුත් ලෝකයේ විවිධ රටවල් තුළින් නැගෙන තොරතුරු අනුව සතුන්ගේ අං, ලී, වීදුරු, මැටි, රන්, පිත්තල සහ වානේ යොදා ඇති බව පෙනේ. සණ්ඨා තැනීම සඳහා සුදුසුම වන්නේ ලෝකඩ බව කියැවේ. මෙය තඹ හා ටින් විවිධ අනුපාතයකට යොදා සකස් කර ගත් මිශ්‍රණයකි. ඊට අමතරව තුත්තනාගම් ද යොදා ගන්නා ලද බව පෙනේ.**

පී.එන්. කොඩිකාර

# ලක්වැසියන් අඳුරින් මුදවාලන්නට අනුබුදු මාහිමි ලක්දිවට දුන් මහාදායාදය බුදු සමයයි

**සම්බුදු පහසින් අති පාරිශුද්ධත්වයට ලත් ලක් දරණීතලයෙහි ජනිත වන්නට තරම් අපි වාසනාවන්තයෝ වීමු. ලොව්තුරා අමා මෑණී සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ දම් අමාවෙන් නැහැවෙන්නටද අපි ශ්‍රීවන්තයෝ වීමු. ලොවට කිසිදා වෙනස් නොවන අසම සම වූ බුදුදහම දේශනා කළ ගෞතම පියාණන් වහන්සේ ලොව බිහි වූ අති ශ්‍රේෂ්ඨතම ශාස්තෘවරයා බව අවිවාදයෙන්ම පිළිගත යුතු මනාය.එකී උතුම් බුදු දහම ලක් දෙරණට උරුමකර දීමේ ගෞරවය හිමි වනුයේ අනුබුදු මහින්ද මහ රහතන් වහන්සේ නොහොත් මිහිඳු මහ හිමියන් වහන්සේටමය.**

ඉන්දියාවේ රජකල ධර්මාශෝක රජුගේ රාජ්‍ය සමයේ මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේගේ අනුශාසනා පරිදි නව රට සසුන් පිහිට වූ බව මහා වංශයේ සඳහන් වේ. ඒ අතුරින් මහින්ද මහ රහතන් වහන්සේ ප්‍රමුඛ ඉත්ථිය, උත්තිය, සම්බල භද්දසාල යන හිමිවරු සහ සුමන සාමනේර සහ භණ්ඩුක නම් වූ උපාසක තැන මෙරටට පැමිණ ඇත්තේ ලක් දිව දේවානම් පියතිස්ස රජු රාජ්‍ය කරන සමයේදීය. අශෝක අධිරාජ්‍යයා සහ දෙවන පෑතිස් රජු අතර වූ මනා මිතු දම කරණ කොට ගනිමින් මෙකී මහඟු දායාදය මෙරටට ලද බව අප සම්ප්‍රදායේ කියවෙනු ඇත. මහින්දාගමනය පිලිබඳ සඳහන් ශිලා ලේඛනයක මෙම පිරිස ඍර්දියෙන් පැමිණ ඇති බව සඳහන්ය. කෙසේ වුවද එහි ඉදිය අවුත්" යන්නෙහි අරුත සමෘද්ධිය පිණිස ආවා" යන්න මිස උත්ත අදහස නොවන බව ආචාර්ය සෙනරත් පරණවිතාරණ මැතිදුන්ගේ අදහසයි. ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර මනා වූ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා නැවත ඇති බවට ඉතා පැහැදිලිය. රාජ්‍ය තාන්ත්‍රික දූතයන් දෙරට අතර හුවමාරු වී සුදුසු කල මිහිඳු හිමියන් ප්‍රමුක පිරිස මෙරටට පැමිණි බව ඓතිහාසික තොරතුරු විමසීමේදී දක්නට ඇත.

"දේවානම්පිය" යන අභිධානය භාරතයේ අශෝක හා ලංකාවේ තිස්ස යන රජවරු දෙදෙනාම යොදා ගෙන ඇත. මහා වංශයේ සඳහන් පරිදි මෙරට ප්‍රථම වරට භාරතීය ක්‍රමයට අභිශේකයක් කොට ඇත්තේ දේවානම්පියතිස්ස රජුය. එසේ හෙයින් ලක් දිව හා භාරතය අතර වූ මනා සබඳතාවයක උදාර ප්‍රතිඵලයක් ලෙස බුදු දහම අප හට ලැබීම පෙන්වා දිය හැකිය.

පාලි ග්‍රන්ථ සහ එහි අටුවා ද මෙරටට රැගෙන ආ බව ථෙරවාදි සංග්‍රහය විසින් පිළිගනු ලැබ ඇත.

සරලව සිතිය යුත්තක් නොවනු ආගමික මුහුණුවරක් පමණක් නොව, සංස්කෘතික - අංශ දෙකකකින් වැදගත් වී ඇත. ඒ වනාහී,

1. **ලෝකයේ වෙනත් සභ්‍යත්වයන්ට අයත් දුෂ්ඨ අංගයන් සිංහල සභ්‍යත්වයට ඇතුල් නොවීම.**

2. **බුදු සමයේ විශේෂ ආභාෂය ලැබීම නිසා සිංහල සභ්‍යත්වයෙහි ඇතැම් පොදු අංග ප්‍රභාවිත වීම යනාදියයි.**

ශතවර්ශ තුනක පමණ කාලයක් තිස්සේ, භාරතයේ වැඩුනු මහාන්දාගමනයෙන් පසු ද්විත්ව ප්‍රගතියක සලකුණු මෙරට ජන සමාජයෙහි වර්තමානයෙහි පවා දක්නට ඇත. එනම්

1. ආධ්‍යාත්මික සංස්කෘතිය
2. බාහිර සංස්කෘතිය

වශයෙනි.

මිනිසාගේ ආචාර-අදහස්, උදහස් හා ගති පැවතුම් සැකසීම ආධ්‍යාත්මික සංස්කෘතිය වන අතර කර්මික විනෝදය තුළින් ගෘහ නිර්මණ, චිත්‍ර, මූර්ති, කැටයම් හා ලේඛන කලාවක් බිහිවීම බාහිර සංස්කෘතිය ලෙස හැඳින ගත හැකිය. සාහිත්‍යශූරි මාර්ටින් වික්‍රමසිංහ මහතා දක්වන පරිදි මහින්දාගමනය ලක් ජනතාවට උසස් ආගමික දර්ශනයක් ලංකා සමාජයට හඳුන්වා දීමක් මහින්දාගමනය තුළින් සිදුව ඇති බව කීම නිවැරදිය.

මිනිස් වර්ගයා ආධ්‍යාත්මික වශයෙන් ආගමික දර්ශනයක් මඟින් යහපත් මාර්ගයකට ප්‍රවිශ්ට කරනු ඇත. එසේ නමුදු මිහිදු හිමිපාණන් වහන්සේ මෙරටට වැඩම කරලීමට පෙර මෙකී කාර්යභාර්යය ඉටු කිරිම පිණිස සකස් වූ ජාතික ආගමික වැඩපිළිවලක් නොතිබිණ. මහින්දාගමනයෙන් අනතුරුව බුදු දහම රාජ්‍ය ආගම බවට පත්වීම රට නැවුම් මාවතකට ගමන් කිරිමට මහඟු පටුවහලක් වු අතර ජනතාවට ඉමහත් සමෘද්ධියක් විය. රජු ප්‍රමුඛ රජ පවිලේ සියල්ල බුදු දහම වැළඳ ගැනිම බුදු දහමේ ව්‍යාප්තියට බලපෑ ප්‍රබල කරුණක් විය. මහින්දාගමනය හේතුකොට ගෙන පෙර පැවති සමාජ ක්‍රමය තුළ නෙතබූ නවාංග රැසක් ලාංකික සමාජයට ප්‍රවේශ විය.



ගොවිතැනට අනුරූපවන ධර්මෝපදේශ රැසක් ලක්වාසියන්ට ලැබි ඇත. භික්ෂු බොහෝ දෙනාගේ හිතසුව පිණිස කැප වූ අතර උන්වහන්සේලාගේ පිවිතුරු ආදර්ශමත් ජීවිතය රජ පවුලේ සිට ජනයා දක්වා ප්‍රබොධමත් කිරිමට සමත්ව ඇත. ගමත් පන්සලත්, පන්සලත් ගමත් අතර සබඳතාවය ඇතිව එය මනාව වර්ධනය විමටත්, නිති පන්සිල් රැකිමටත්, පොහෝ දින අටසිල් රැකිමටත් ලක්වැසියා යොමු වුයේ මහිනදාගමනයේ මහඟු ඵලයක් ලෙස බව සැම දත යුත්තේමය.

මහින්දාගමනයට පෙර පැවති මිත්‍යාමත විශ්වාසයන් ක්‍රමාණුකූලව වෙනස් කරමින් ඊට නව මුහුණුවරක් ලැබිණි. අඳුරේ ගමන්ගත් ලක්වැසියා බුදුදහමේ ආලෝකයෙන් සිය නැණපහන් උදාකරගත් බව දත යුතුය. ඉර, හඳ, ගල්, මළවුන් අදහමින් සිටි ජනතාව ඉන් මුදවාගෙන දෙවියන්ට, මළවුන්ට පිංදීම මෙන්ම අදෘෂශ්‍යමාන බලවේග කෙරෙහි පැවති අසිමිත විශ්වාසයන්ගෙන් තුරන් කිරිම මහින්දාගමනයේම ඵලයකි. පේතවත්ථු - විමනවාත්ථු, පච්ච සංයුක්ත යන දේශනාවන් මෙන්ම, චුල්ලහත්ථි පදෝපම සුත්‍රය වැනි සුත්‍රදේශනාද, දේවදූත සුත්‍රයද නවමු ගමනට පිටුවහලක් වී ඇත.

රජ පවුලේ උදවිය පවා පැවිදිව බුදු දහම මෙරට ස්ථාපිත කරවීමට රජුගේ දායකත්වය මනාව ලබා ගැනිමට මිහිඳු මා හිමිපාණාන් වහන්සේ සමත්ව ඇත. ආරාම පුජාව, බෞද්ධ අධ්‍යාපන මධ්‍යස්ථාන බිහිවීම, වෙහෙර විහාර ඉදිවිම ක්‍රමයෙන් ඇරඹීම බොදු ජනතාවගේ යහපතටම වී ඇත්තේමය.

මහින්දාගමනය අර්ථවත් වන්නට පසු සිදු වූ දුමින්දාගමනය නොහොත් සංඝමිත්තාගමනය හේතු වූ බව මෙහි සදහන් කළ යුත්තේමය. මහින්දාගමනයේම ප්‍රතිඵලයක් ලෙස පසුව මිහාඳු මහරහත් වහන්සේගේ නැගෙණිය වූ සංඝමිත්තා තෙරණිය වැඩම කිරීම සිදුව ඇත. සිරි සීවලී හිමිපාණන් සඳහන් කරන පරිදි මිහිඳු මා හිමියන් විසින් න්‍යායික පදනම හෙලූ අතර සංඝමිත්තා මෙහෙණිය විසින් ප්‍රායෝගික පදනම හෙලා ඇත. ගෘහ නිර්මාණ, චිත්‍ර, මූර්ති, කැටයම්, අක්ෂර, පෙදරේරු, වඩු ආදී ලෙස නවතම සංස්කෘතියක පෝෂණයට අවශ්‍ය සම්පත් සපයා ඇත්තේ දුමින්දාගමනයන් බැව් මාර්ටින් වික්‍රමසිංහ මහාතා සඳහන් කරයි.

එදා අම්බස්තල පා මුලින මිහිඳු හිමි ඇරඹූ දහම් පණිවිඩය අද සකලවිධ ජන සමූහයාගේම සිත් සතන් නිමාලමින් මෙලොව පරලොව හිත සුව පිණිස පවතින්නා වූ අමාදහරක් වන්ව පවතිනු දැකීම සොම්නසට කරුණකි. එසේ හෙයින් පොසොන් පුන් පොහෝ දින වනාහී ලක් වැසි බොඳු ජනතාවට සදා අමරණීය දිනක් බව අමුතුවෙන් පැවසිය යුතු නොවනු ඇත. පොසොන් පෝය වනාහි ලක් වැසින් අඳුරින් මුදා ගත් දිනය වන අතර එදින බුද්ධාලම්භන ප්‍රීතීයෙන් යුතුව සැමරීම සැමගේම වගකීම වනු නියති.

**සැම සත සිත් සතන් අඳුරින් මිදී පහන් වේවා............!**

**" ඉර, හඳ, පර්වත හා මළවුන් පිදූ ජනතාව ඉන් මුදවාගෙන දෙවියන්ට, මළවුන්ට පිංදීම මෙන්ම අදෘෂ්‍යමාන බලවේග කෙරෙහි පැවති අසීමිත විශ්වාසයන්ගෙන් තුරන් කිරිම මහින්දාගමනයේම ප්‍රඵලයකි "**

-ආර්.එන්.එච්.එම්. සමන් ජයරත්න.-



# සුදු පැහැයෙන් ඈතින් දිස්වන දාගැබ් නමදිමු බැතියෙන් අපමන

ආර්.එන්.එච්.එම්. දීප්ති ජයරත්න
කුරුණෑගල

කිරිවන් පාටින් ගස් කොළන් අතරින් ඈතින් දිස්වෙන දාගැබෙන් අපි පන්සලක් ඇති බව දුර සිටම හඳුනා ගන්නෙමු. සැබැවින්ම පන්සලක්, එසේත් නැතිනම් විහාරයක් නොමැතිව දාගැබක් දකින්නට ලැබේ නම් ඒ ඉතාමත් කලාතුරකින්ය. බෞද්ධ ජනතාව වැඳුම් පිදුම් කරන ප්‍රධානම අංගය දාගැබයි. එය චෛත්‍යය, ස්ථූපය, ථූපය සහ වෙහෙර ආදී වචන වලින් ද හඳුන්වනු ලැබේ. ධාතු නිධන් කළ ගර්භයකින් සමන්විත වීම දාගැබ් යන නම ලැබීමට හේතු වී පදනම් කර ගනිමින් බෞද්ධයෝ දාගැබට ප්‍රමුඛ ස්ථානයක් දී වැඳුම් පිදුම් කටයුතු කරති. එසේ වුවද දාගැබෙහි ආරම්භය බෞද්ධයාගෙන් සිදුවිණි යැයි පැවසිය නොහැක.

දාගැබේ සම්භවය කවදා කෙසේ සිදුවිණි දැයි නිශ්චිතවම හඳුනා ගත නොහැකිය. එහෙත් මෘත ශරීර භූමිදානයෙන් පසු ඒ මතට පස් ගොඩ ගැසීමෙන් දාගැබේ සම්භවය සිදු වන්නට ඇතැයි විශ්වාස කළ හැකිය. මෙසපොතේමියානු ශිෂ්ටාචාරයේ 'ශිගුරත්' ගොඩනැගිලි මෙන්ම මිසරයේ පිරමීඩ දාගැබ් සංකල්පයේ ඉපැරණි භාවය විදහාපාන සාධකයෝය. දකුණු ඉන්දියාවේ කෝයිම්බටෝර් දිස්ත්‍රික්කයේ පණ්ඩුකුල නම් සොහොන් ගොඩනැගිලි ද ඩෙල්මන් නමින් හැඳින් වූ ගල් ගෙවල් ද තවත් උදාහරණයෝ වෙති.

බුද්ධකාලය වන විට ඉන්දියාවේ දාගැබ් තැනීම පැවති බවත් එය බෞද්ධයා හා සම්බන්ධ වීම ක්‍රමයෙන් සිදු වූ බවත් පැහැදිලි වේ. බුදුන් වහන්සේගේ සමකාලීනයෙක් වන මහා වීරගේ ජෛන ආගමේ ද දාගැබ් වන්දනාව පිළිගෙන ඇත. බුදුරජාණන් වහන්සේගේ භස්මාවශේෂ තැම්පත් කර දාගැබ් තැනීමට මත්තෙන් ජෛනයන් එතුමාගේ අළු තැම්පත් කර ස්ථූපයක් තනා ඇත. දාගැබ් තැනීම පිළිබඳ තොරතුරු රැසක් මහා පරිනිබ්බාන සූත්‍රයෙන් හෙළිදරව් කර ගත හැක. බුදු, පසේබුදු, මහරහත් සහ සක්විති රජ යන සතර වැදෑරුම් පුද්ගලයින්ගේ ධාතු නිධන් කොට ථූප තැනීම සුදුසු බව බුදුන් වහන්සේ විසින්ම මහා පරිනිබ්බාන සූත්‍රයේදී දේශනා කර ඇත. තවද සැරියුත් මුගලන් දෙනම වෙනුවෙන් බුද්ධ පරිනිර්වාණයෙන් පසු ථූපයක් ඉදි කරන ලෙස ආනන්ද හිමියන්ට පැවසූ බව සඳහන් වේ.

තපස්සු භල්ලුක වෙළඳ දෙබෑයන් විසින් බුදුන්වහන්සේගේ කේශ ධාතු නිධන් කොට තැනූ ගිරිහඬු සෑයක් සුමන සමන් දෙවියන් විසින් සෑද වූ මහියංගන දා ගැබක් මහා පරිනිබ්බාන සූත්‍රයේ සඳහන් වන චාපාල චේතියත් බුද්ධකාලය තුළම දාගැබ් ඉදි කිරීමේ සිරිත බෞද්ධයන් තුළ ද පැවති බවට සාධක වශයෙන් හඳුනාගත හැකිය. සාංචි හා භාරුත් කැටයම්වලට අනුව දාගැබ බුදුන් වහන්සේගේ සංකේතයක් ලෙස හඳුනා ගත හැක. ක්‍රි.පූ. 3 වන ශත වර්ෂයේදී පමණ අශෝක අධිරාජයා විසින් ඉදි කරන ලද සාංචි ස්ථූපය බෞද්ධ දාගැබ් පිළිබඳ අදහසක් ලබා දීමට බෙහෙවින්ම උපකාර වී ඇත. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ දාගැබ් බහුතරයක දකින්නට ලැබෙන බුබ්බුලාකාර ගර්භ හැඩය සාංචි ස්ථූපයේ දක්නට ලැබේ.

බුද්ධ කාලයේදී මෙන්ම ඊට පසු කාලීනව පැවති සමාජ ක්‍රමයට පිළිගත හැකි පරිදි බුද්ධ ශාසනයේ චිරස්ථිතිය තහවුරු කරලීමට දාගැබ බුදු දහම සමඟ ක්‍රමයෙන් බැඳුණු බව පිළිගත හැකි මතයකි. විශේෂයෙන් භාරතීය සමාජයේ පැවති විවිධ ආගමික විශ්වාසයක් මත ගොඩ නැගුණු වන්දනාමාන කිරීමේ රටාව දාගැබ තුළින් ආරක්ෂා වූ බවක් පෙනේ. තවත් අතකින් එය පැවති මිථ්‍යා දෘෂ්ටික ඇදහිලි සම්‍යක් දෘෂ්ටිකව සිදු කිරීමට මග පෑදීමක් ලෙස දැකිය හැක.

බෞද්ධ දාගැබක් පිළිබඳ විමසීමේදී එහි ප්‍රධාන අංග කීපයකි.

**01. වැලි මළුව**
**02. සලපතල මළුව**
**03. පේසා වලලු**
**04. ගර්භය**
**05. හතරැස් කොටුව**
**06. දේවතා කොටුව**
**07. කොත් කැරැල්ල**
**08. කොත**
**09. චූඩාමාණික්‍ය** පිළිවෙලින් හඳුනාගත හැකිය.

දාගැබ හා සම්බන්ධව කලා නිර්මාණ ගණනාවක් පසු කාලීනව එකතු වූ බව පෙනේ.

**වාහල්කඩ**
**වටදාගේ**
**චේතියඝර**

මළසුන් ගෙවල් උදාහරණ වශයෙන් දැක්විය හැකිය.

හෙන්රි පාකර් නම් ඉතිහාසඥයා දාගැබ දැකිය හැකි ප්‍රධාන ආකෘති 06ක් පෙන්වා දී ඇත. මේවා ගර්භයේ ස්වභාවය මත වර්ග කර ඇත.



**01. ඝණ්ඨාකාර**
**02. බුබ්බුලාකාර**
**03. ධාන්‍යාකාර**
**04. ඝටාකාර**
**05. අම්ලාකාර**
**06. පද්මාකාර** වශයෙනි.

බෞද්ධ දාගැබ ශ්‍රී ලංකාවට පැමිණියේ කෙසේ දැයි මෙන්ම එය ශ්‍රී ලංකාව තුළ විකාශනය වූයේ කෙසේ දැයි යන්න ද අවධානයට යොමු කිරීම වැදගත්ය.

ශ්‍රී ලංකාවේ ප්‍රථම ඓතිහාසික දාගැබ වශයෙන් පිළිගැනෙන්නේ ක්‍රි.පූ. 02 වන ශත වර්ෂයේදී දේවානම් පියතිස්ස රජු විසින් ඉදිකරන ලද ථූපාරාමයයි. ථූපවංශයට අනුව ථූපාරාමය ධාන්‍යාකාර හැඩයට ඉදි කළ දාගැබකි.

එහෙත් පසු කාලීන ප්‍රතිසංස්කරණයන්ට බඳුන් වීම එහි හැඩය වර්තමානයේදී ඝණ්ඨාකාර වී ඇත. මෙම ස්ථූපයේ බුදුරජාණන් වහන්ස්ගේ අකු ධාතුව නිධන් කර ඇතැයි ජනප්‍රවාදයේ කියැවේ.

ථූපාරාමයට වඩා පැරණි යැයි පැවසෙන දාගැබ් දෙකක් පිළිබඳ පුරාවෘත්තයන්හි සඳහන් වේ. ප්‍රමාණවත් සාක්ෂි සාධක මදිකමින් එවා තහවුරු කිරීමේ ගැටළුවක් ඇත. නැගෙනහිර වෙරළේ තිරියාය නම් ස්ථානයේ පිහිටි ගිරිහඬු සෑයත් මහා වැලි නදිය කඳු අතරින් මතු වන ස්ථානයට නුදුරින් ගංතෙර පිහිටි මහියංගන දාගැබත් මෙම ස්ථූප දෙක වේ. මේවා බුද්ධකාලයේදී ඉදි කරන බැව් පුරාවෘත්ත වලට අනුව පැහැදිලි වේ.


පූජාවලියේ එන පුරාවෘත්තයකට අනුව තිරියාය ගිරිහඬු සෑය කරවන ලද්දේ තපස්සු භල්ලුක නම් වෙළඳ දෙබෑයන් විසින් වන අතර එහි බුදුන් වහන්සේගේ කේෂ ධාතු තැම්පත් කර ඇත. මහා වංශයේ පුරාවෘත්තයකට අනුව මහියංගනය දාගැබ ඉදි කරන්නේ සමන්ත කූටය. වාසභවන කරගත් සුමන සමන් දෙවියන් විසිනි. බුද්ධත්වයෙන් අටවන මස ගෙවී සිදු වූ බුදුන් වහන්සේලාගේ ප්‍රථම ලංකා ගමනයේදී එම දෙවිඳුන් හට දෙන ලද කේෂ ධාතු තැම්පත් කිරීමට මෙම දාගැබ ඉදි කළ බව කියැවේ.

ශ්‍රී ලංකාවේ දාගැබෙහි විකාශනය ඉතාමත් සීඝ්‍රයෙන් සිදුවූ බවක් පෙනේ. මහින්දාගමනයත් සමඟ ඇති වූ බුදු දහමේ සීඝ්‍ර විකාශනය ඊට හේතුවක් වන්නට ඇත. මිහිඳු මා හිමියන්ගේ භස්මාව ශේෂ දාගැබ් කීපයක තැම්පත් කර ඇත. අම්බස්ථල දාගැබ ඉන් එකකි. අද වන විට හඳුනා ගත හැකිමුත් දාගැබ් ගණනාවක් පිළිබඳව මහාවංශය තොරතුරු හෙළිදරව් කරයි. ශ්‍රී ලංකාවේ බොහොමයක් දාගැබ් විටින් විට විවිධ රජවරුන් විසින් ප්‍රතිසංස්කරණය කළ බව පෙනේ. දාගැබෙහි විකාශනයේදී සැලකිය යුතු වෙනසක් දකින්නට ලැබෙන්නේ ක්‍රි.පූ. 01 වන සියවසේ දුටුගැමුණු රජු සමයේදීය. මිරිස වැටිය සහ රුවන් වැලි මහා සෑය ඉදිකිරීම මඟින් විශාල දාගැබ් ඉදි වීම ශ්‍රී ලංකාවේ ආරම්භ වූ බවක් පෙනේ. සැලකිය යුතු විශේෂිත ලක්ෂණය වන්නේ මෙම දාගැබ් ඉන්දියාවේ විශාලතම දාගැබ වන සාංචි ස්ථූපයට වඩා විශාල වීමයි. වැලි මළුවට පිටතින් ඇත් පවුරක් දකින්නට ලැබීම ද මේ යුගයේදී සිදු වූ නව්‍යතාවයයි.

වළගම්බා රජුගෙනුත් මහසෙන් රජුගෙනුත් විශාල දාගැබ් ඉදිකිරීම දැකිය හැකිය. රාජධානි බිඳ වැටීම හා සංක්‍රමණය වීම සමඟ දාගැබ් ඉදිවීමේ හීන වීමක් සැලකිය යුතු තරමට දක්නට නොලැබේ. රට පුරා දාගැබ් ව්‍යාප්ත වී ඇති බව පැහැදිලිව දක්නට ලැබේ.

පොලොන්නරු යුගයේදී ඉදිකරන ලද සත්මහල් ප්‍රාසාදය දාගැබක් බවට පිළි ගැනීමක් ඇත. සමහර විටක හින්දු බලපෑම නිසා එවැනි ආකෘතියකි ඇති වූවා විය හැක.

අද වන විට පන්සලක අනිවාර්ය අංගයක් බවට දාගැබ පත්ව ඇත. බෞද්ධයා උතුම් කොට සලකන ත්‍රිවිධ චෛත්‍යයෙන් ශාරීරික චෛත්‍යය ලෙසින් සලකන දාගැබ් වහන්සේ සාපේක්ෂව උස් භූමියක පිහිටු වීම ද ප්‍රථමයෙන්ම වන්දනාමාන කිරීම ද බෞද්ධයන්ගේ සිරිතය.



**තපස්සු භල්ලුක වෙළඳ දෙබෑයන් විසින් බුදුන්වහන්සේගේ කේශ ධාතු නිධන් කොට තැනූ ගිරිහඬු සෑයත් සුමන සමන් දෙවියන් විසින් සෑද වූ මහියංගන දා ගැබත් මහා පරිනිබ්බාන සූත්‍රයේ සඳහන් වන චාපාල චේතියත් බුද්ධකාලය තුළම දාගැබ් ඉදි කිරීමේ සිරිත බෞද්ධයන් තුළ ද පැවති බවට සාධක වශයෙන් හඳුනාගත හැකිය. සාංචි හා භාරුත් කැටයම්වලට අනුව දාගැබ බුදුන් වහන්සේගේ සංකේතයක් ලෙස හඳුන්වා දී ඇත.**

**නොවිමසා ක්‍රියා කරන රජ තෙමේ යහපතක් නොවේ**

# බුදු දහමෙන් පෙන්නුම් කරන පරිසරය

පරිසරය ගැන බුදුරජාණන් වහන්සේ ඉතා පැහැදිලි දේශනාවන් ඉදිරිපත් කර ඇති බව පළමුවෙන්ම සඳහන් කිරීමට පුළුවන. ''රමණීයානි අරඤ්ඤානි'' වන ලැහැබ ඉතා ලස්සනයි. යන ප්‍රකාශයෙන් ඒබව පැහැදිලිවෙයි. බුදු දහමෙහි වැදගත් සිදුවීම් සියල්ලක්ම වන ලැහැබ ආශ්‍රිතව පැවැති බව බුද්ධ චරිතය මගින් තහවුරු වෙයි. සිදුහත් බෝසතාණන් වහන්සේ උපත ලබා ඇත්තේ ලුම්බිණි සල්වනයේදී බව ප්‍රසිද්ධ කරුණකි. නිවන් පසක්කර ගැනීම සඳහා සය අවුරුද්දක දුෂ්කර ක්‍රියාවන් සිදුකර ඇත්තේද වනයේ විවිධ ස්ථානවලදී බව බුද්ධ චරිතයෙන් දැක්වේ. බුද්ධත්වයට පත්වූයේද ඇසටු රුකක් මුලදීය. අලංකාර වන ප්‍රදේශයක් වන බරණැස ඉසිපතනාරාම භූමියේදී ප්‍රථම ධර්මදේශනාව පැවැත්වීමද මෙහිලා සිහිපත් කල හැකිය. බුද්ධ කාලයේ දඹදිව ආරාම පිළියෙල කර ඇත්තේද ජනශූන්‍ය වනාන්තර ආශ්‍රිතවයි.''ජේතවනාරාමය'' සාදා ඇත්තේ උයනකය.''වේළුවනාරාමය'' සාදා තිබෙන්නේ උණ පඳුරුවලින් සමන්විත වන ලැහැබකය.භික්ෂූන් වහන්සේලාගේ අසමගියක් ඇතිවූ අවස්ථාවේ එය සංසිඳවීමට බුදුරජානන් වහන්සේ අනුශාසනා කලත් එයින් ප්‍රයෝජනයක් නොවූයෙන් ''පාරිලෙය්‍ය වනයේ'' වස් විසීමට සිදු වූ බව බුද්ධ චරිතයෙන් අපට පැහැදිලි වෙයි. බුදුරජාණන් වහන්සේගෙන් කමටහන් ලබා ගෙන භාවනි වැඩීමට පන්සියයක් භික්ෂූන් වහන්සේලා වැඩම කෙලේ මහාවෘක්ෂ වලින් සමන්විත වනාන්තරයටය. මහා වෘක්ෂයන් යට භාවනා කරන එම භික්ෂූන් වහන්සේලාට රුක්ෂ දේවතාවන්ගෙන් හිරිහැර සිදු වූ බවත් එය වැලැක්වීමට බුදුරජානන් වහන්සේ කරණීය මෙත්ත සූත්‍රය දේශනාකල බවත් බුද්ධ චරිතයෙහි සඳහන් වෙයි.

භික්ෂූන් වහන්සේලාට නිවැරදි ජීවිත ගතකිරීම සඳහා විනය නීති පැනවීමේදී බාහිර පරිසරය අලංකාර කරන වෘක්ෂලතාවන් වෙනුවෙන් නීති පද්ධතියක් බුදුරජාණන් වහන්සේ දේශනා කර තිබේ.ආරාම අවට ඇති ගස්,වැල් වලින් කොළයක් තැමට දෙයන් හෝ විනාශ කිරීම විනය නීති කැඩීමක් ලෙස දක්වා තිබේ. ගස්,වැල් කපා බිම හෙලීම විනය නීති වලට අනුව බැපතල වැදක් ලෙසින් දක්වා ඇති අවස්ථාවන් බුදු දහමෙහි දක්වා ඇත. පරිසරය අලංකාර කරන ගංගා,ඇළ,දොළ වලට මළ,මූත්‍රා වැනි අපද්‍රව්‍ය බැහැර කිරීම භික්ෂූන් වහන්සේලා විනය නීතියෙන් තහනම් කර ඇති බව විනය නීති වලට අනුව සඳහන් කිරීමට පුළුවන. විනයනීති සාමාන්‍ය ජනතාවට බලනොපෑවත් පරිසරය ආරක්ෂා කිරීම බව මෙහිලා සඳහන් කිරීමට පුළුවන.

සමාජ පරිණාමය පිළිබඳවත් අනිසිලෙස ස්වභාවික පරිසරය භුක්ති විඳීමෙන් මිනිස් සිත් සතන් විකෘති වන ආකාරයත් පරිසරයේ ඇති සම්පත බෙදා ගැනීමට වෙරදැරීමෙන් සිදුවන විනාභයත් පැහැදිලි කරන සූත්‍ර ධර්මයක් ලෙස ''අග්ගඤ්ඤ සූත්‍රය'' දැක්විය හැකිය.මිනිසාගේ හැසිරීම් පරිසරයට බලපාන ආකාරය ඉතා පැහැදිලි ලෙස මෙම සූත්‍රයෙන් විස්තර කර තිබේ.''අධම්මික සූත්‍රයෙන්'' පැහැදිලි වන්නේ මිනිසා සහ පරිසරය අතර පවත්නා සම්බන්ධතාවය ගැනයි. මිනිස් හැසිරීම් පරිසරයට බලපාන අන්දමයි. වැඩිදුරටත් විස්තර වන්නේ රජදරුවන්ගේ පටන් පහලට අනුක්‍රමයෙන් පියවරෙන්, පියවර,සමාජය ධාර්මික වීමෙන් විශ්වයේ භෞතික ක්‍රියාකාරිත්වයද සමව නිසිපරිදි සිදුවන බවයි. ධාර්මිකවීම පරිසරයේ පැවැත්ම සඳහා තදින් බලපාන බව පෙන්වාදෙන මෙම සූත්‍රය නියාමධර්මයන්ගේ බලපෑමද මෙයට හේතු වශයෙන් දක්වා තිබේ.



පුරාතනයේ විසූ ජනතාව ''වනරෝපා'' හෙවත් රුක්ෂ ගස්වලින් හෙබි වූ වනාන්තර සරණ ගිය බවත් පුරාතන ග්‍රන්ථවල දැක්වේ. ඔවුන්ගේ මනසේ ස්වභාවය අනුව වනාන්තර දේවත්වයෙන් ලා සැලකූහ. මෙයට බුදුරජාණන් වහන්සේ දේශනා කෙළේ ප්‍රාග් යුගයේ ජීවත් වූ මිනිසාගේ මනස නොදියුණු නිසා මෙසේ වන්දනාමාන කරන්නට ඇත යන්නයි.

බුද්ධ දේශනාවට අනුව පරිසරය මිනිසාගේ පැවැත්ම සහතික කරන බවත් එය විවිධක්‍රම යොදාගෙන විනාශ කිරීම බරපතල වරදක් බවත් සඳහන් වෙයි. පරිසරයේ තිබිය යුතු සමතුලිත බව,සුන්දරත්වය වැඩි දියුණු කරවන ගස්,වැල් වැවීම,උයන්වතු වැවීම මාහගු පින්කමක් ලෙසට දක්වා තිබේ. දිවා,රාත්‍රියෙහි පිං වැඩෙන පිංකමක් ලෙසට වර්ණනාකරන බුදුදහම මහජනයාට හිතැති ලෙස පොකුණු සෑදීම,පාලම් ඉදිකිරීම ද පරිසරයේ දියුණුව සලසාලන බවද පෙන්වා දෙයි. වැසි කාලයට පොළවෙහි සෑදෙන කුඩා තණකොළ දකුඩා ශාකයන්ද අනිසි ලෙස නොපෙළිය යුතු බවත් ඒවා පයින් මැඩලමින් චාරිකාවේ නොයෙදිය යුතු බවත් අවවාද සංඛ්‍යාත නිස දීමෙහි කරුණු වලට ඇතුළත් කර තිබේ.පැවිදි ජීවිත ගතකිරීම සඳහා ''රුක්මුල් සෙනසුන්'' තෝරා ගැනීමද බුදු දහමෙහි දක්වා තිබේ.කිසියම් ගසක සෙවන ලැබුයේ නම් නිදා ගැනීමට යොදාගත්තේ නම්, එතැනින් සිටවෙන විට එම වෘක්ෂයේ අතු කඩා දැමීම,ගසට හානි පැමිණවීම නොකළ යුතු බවත් දේශනාවේ සඳහන් වේ. ගසක ඵලයක් කඩා ගැනීමට අවශ්‍ය වූ විට එහි අතු සිඳීම බරපතල වරදක් ලෙස පෙන්වා දෙන බුදු දහම එවැනි පුද්ගලයින් ගුණමකු මිත්‍ර ද්‍රෝහීන් ලෙස දක්වා තිබේ.

සිත් පිත් නැති බෝධි වෘක්ෂයට පුරා සතියක් තුළ අනිමිස ලෝචන පූජාව පැවැත්වූයේ එම වෘක්ෂයෙන් ලැබුණු ප්‍රයෝජන සළකා ගෙනය. ප්‍රාග් බෞද්ධ යුගවලදී ද ඇසටු වැනි විශාල වෘක්ෂයන්ට පූජාවිධි පැවැත් වූ බව ප්‍රාග් ඉතිහාස ග්‍රන්ථවල සඳහන් වෙයි. ''මිලින්ද පඤ්ඤහ'' ග්‍රන්ථයෙන්ද විස්තරවන්නේ වෘක්ෂලතාවන්ගෙන් සත්වයන්ට සිදුවන අප්‍රමාණ සේවය ගැනයි.එයින් ප්‍රධාන වශයෙන් පැවසෙන්නේ ගස්,වැල් ඵල දැරීමෙන් අතු පතර වර්ධනය වීමත් සත්වයාගේ යහපත උදෙසා සිදුවන්නක් වන බවයි. වනාන්තර මගින් සැලසෙන සේවය මෙපරිද්දෙන් ඇගයීමට ලක්කර තිබේ.

කසීභාරද්වාජ බමුණා බුදුරජාණන් කෙරෙහි පැහැදීමෙන් තමන්ගේ ප්‍රයෝජනයට පිළියෙල කරගත් රසවත් කිරිබත පූජා කෙළේය.එම කිරිබත වඩාත් රසවත් වීමට දෙවියන් විසින් දිව්‍ය ඕජය දැමූ බව සඳහන්වේ. එම කිරිබත සාමාන්‍ය කෙනෙකුට ආහාරයට ගැනීමටද නොහැකි විය. එබැවින් ප්‍රාණීන් නැති තණ ජිඩිල්ලකට නොදමන ලෙසත් එය සතුන් නැති ජලයට දමන ලෙසත් බුදුරජාණන් වහන්සේ බමුණාට වදාළ සේක. මෙයින් පැහැදිලි වන්නේ පරිසරය ගැන බුදුරජාණන් වහන්සේ මොන ආකාරයට සැලකූවේද යන්නයි. භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් දේශනා කල ''වත්තක්ඛන්ධකය'' සඳහන් වන්නේ පරිසරය ආරක්ෂා කිරීම සඳහා අනුගමනය කළ යුතු පිළිවෙලයි.විහාර භූමියේ සිට වැසිකිලි,කැසිකිලි දක්වා පවිත්‍ර කිරීම ගැන දීර්ඝ විස්තරයක් එහි අන්තර්ගතවී තිබේ. අවම වශයෙන් වැසිකිලියේ දී පාවිච්චි කිරීම සඳහා යොදාගත් බඳුනේ ජලය ඉතිරි කිරීමද විනය විරෝධි ක්‍රියාවක් ලෙස දක්වා තිබේ. විනයධර ධම්මධර යන භික්ෂු පිරිසක් අතර අරගලයක් ද ඇති වූයේ ද මෙබඳු සිදුවීමක් හේතු කොටගෙනය.පරිසරය විනාශ කරන ශබ්ධයන්ද බුදු රජාණන් වහන්සේ ප්‍රතික්ෂේප කළ සේක. සැම විටම තම ශ්‍රාවකයන්ගේ නිහඩතාවය අගය බුදු දහම එමගින් නිවන් මගට පත්වීමට ඉතා පහසුවෙන බවද දක්වා තිබේ. වන සෙනසුන්වල භාවනානුයෝගී වෙසෙන භික්ෂූන් වහන්සේ කෙටි කලකින් නිවන් මගට පත්වන්නේද පරිසරයේ ඇති නිහඩතාවය නිසාම බව බෞද්ධ ග්‍රන්ථවල සඳහන් වෙයි.(ආරඤ්ඤ ගතානංවා,රුක්ඛමූල ගතානවො) යන දේශනාවලින් පැහැදිලි වන්නේද එම කරුණයි. ගංගා,ඇළ දොළ යන ස්ථාන කෙරෙහි සිත් යොමු කළ බුදු රජාණන් වහන්සේ ඒවා ආරක්ෂා කර ගැනීම සඳහා භික්ෂූන් වහන්සේලාගේ පොදු මහා ජනතාවට බුදු දහමෙන් ඉතා පැහැදිලිව දක්වා තිබේ.
ගසක්යට ජීවත්වන විට ලැබෙන සිසිලස වෙන කිසිම ස්ථානයකින් නොලැබෙන බව බුදු දහමෙහි දක්වා තිබේ. සත්ව වර්ගයාගේ ජීවිත රදා පවතින්නේද වනාන්තර මූලික කරගෙනය. වනාන්තර විනාශ කරන්නා අඥාන කෙනෙකු ලෙස බුදුරජාණන් වහන්සේ පෙන්වා දී තිබේ. කැලෑ විනාශ කිරීමෙන් සත්ව වර්ගයාට මුහුණපෑමට සිදුවන ගැටලු ගැන භෞතික විද්‍යාඥයින්ද පෙන්වා දී තිබෙනවා. බුදු දහම මෙයට වසර දහස් ගණනකට පෙරදී මේ ගැන කරුණු දක්වා ඇති බව බෞද්ධ ග්‍රන්ථ ඇසුරෙන් පැහැදිලි වෙයි.

ලක්දිව බොහෝ රජවරු බුදු දහමට අනුගත වෙමින් උයන් නිර්මාණයකර ඇති බව ඉතිහාසගත තොරතුරු වලින් පැහැදිලි වෙයි. මහාවංශයේ සඳහන් වන පරිදි මහ පැරකුම්බා රජතුමා නගරාසන්නයේ උද්‍යාන කරවා ඇති බව ප්‍රකාශ වේ. භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහා මෙම උද්‍යාන පූජාකළ බව සඳහන් වේ. බුදු දහමෙහි සඳහන් වන පරිසර සුරක්ෂිතාවය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම ඔබ අප සැමගේ වගකීම වන්නේමය. පරාපී චර්යාවේ අග්‍රඵලය එය වනු නොඅනුමානය.

ඇම්.ඩී.විජයවර්ධන










# මහින්දාගමනය පිළිබඳ

## සාහිත්‍යය හා අභිලේඛන වාර්තා

මහින්දාගමනය පිළිබඳ ලේඛනගත වාර්තා කියවන පාඨකයාට එහි යථා ස්වභාවය තේරුම් ගැනීම දුෂ්කර වෙයි. ලේඛණගත වාර්තා අඩුපාඩු වලින් යුක්ත වීම එයට හේතුවකි. ඇතැම් සිද්ධියක එකතැන දක්වන හේතුව තවත් තැනක දක්වන හේතුවට පටහැණි වෙයි. වංශකතා කරුවෝ ඇතැම් තොරතුරු දන හෝ නොදන වසන්කර ඇත. ඇතැම්විට විස්මය ජනිත කරවන පරිදි සිදුවීම් ඉදිරිපත් කරන්නට යාමෙන් නියම තත්වය සැඟවී ඇති අවස්ථා ඇත. එම නිසා මහින්දාගමනයේ ඓතිහාසිකත්වය අවබෝධ කරගැනීම සඳහා ඒ පිළිබඳ ලියවුණු වාර්තා විමසිලිමත්ව හැදෑරිය යුතු වෙයි.

මහින්දාගමනය පිළිබඳ ලියවුණු වැදගත් සාහිත්‍ය කෘති අතර දීපවංශය, සමන්තපාසාදිකාව, මහාවංශය, බෝධිවංශය ආදි පාලි කෘතිද පූජාවලිය, සිංහල බෝධි වංශය ආදී සිංහල කෘති මෙන්ම පුරාවිද්‍යා සාක්ෂි ද වැදගත් වේ. රජගලින් හා මිහින්තලයෙන් සොයාගත් සෙල්ලිපි දෙක මේ සඳහා බෙහෙවින් උපකාරී වේ.

මහින්දාගමනය සිදු වූයේ සමුබුද්ධ පරිනිර්වාණයෙන් වර්ෂ 236කට පසු උදා වූ පොසොන් පුන් පොහෝ දිනකදීය. එම වර්ෂය ශ්‍රී ලංකා පාලක දේවානම් උන්නතිය සඳහා ගන්නාලද පියවරක් වශයෙන් රටවල් (පච්චන්තිම ජනපද) නවයකට ධර්මදූත කණ්ඩායම් නවයක් යවන ලද බව වංශ කථාවේ සඳහන් වේ. ශ්‍රී ලංකාවද ඒ අතර විය.

ශ්‍රී ලංකාවේ වංශකතා වල සඳහන් මෙම සිද්ධියේ ඓතිහාසිකත්වය පිළිගැනීමට වින්සන්ට් ස්මිත් " වැනි ඇතැම් උගතුන් මැලිකමක් දක්වයි. එයට හේතු වන්නේ මෙම ධර්මදූතයන් වහන්සේලා වැඩිය ඇතුම් රටවල් අශෝක රජුගේ ධර්මදූතයන් ගැන සඳහන් xiii ගිරි ලිපියේ හෝ වෙනත් ලිපියක සඳහන් නොවීමයි. සුවණ්ණභූමි සහ හිමාලය ප්‍රදේශය එවැනි රටවල් දෙකකි. xiii වෙනි ගිරි ලිපියේ සඳහන් වන්නේ අශෝක රජුගේ ධර්මදූතයන් ගිය රටවල් පමණයි.

මොග්ගලීපුත්ත තිස්ස හිමියන් ප්‍රමුඛ සංඝයාගේ මූලිකත්වයෙන් යැවූ ධර්මදූතයන් වහන්සේලා ඉන් වෙනස් වෙති. එසේම මේ ධර්මදූත සේවා අතර කාල පරතරය වර්ෂ හතක් පමණ වීමද ඒ දෙක එක ගණයට ලා සැලකීමට බාධාවකි. අශෝක රජුගේ අනුග්‍රහය නොඅඩුව හිඥු ධර්ම දූත සේවයට ලැබෙන්නට ඇත. එහෙත් අශෝක රජු විසින් ස්වකීය ධර්මදූත සේවය රාජ්‍ය මට්ටමෙන් ද භික්ෂු ධර්මදූත සේවය ශාසනික මට්ටමෙන්ද සිදු කරන ලදි. ධර්මදූතයන් වහන්සේලා යැවූ ඇතැම් රටවල් අශෝක සෙල්ලිපිවල සඳහන් නොවීම පදනම් කොට ගෙන මුළු ධර්මදූත සේවයම ඓතිහාසික සිද්ධියක් වශයෙන් පිළිනොගැනීමට දක්වා ඇති හේතු පරණවිතාන මහතා සහේතුකව ඛණ්ඩනය කර ඇත. දහනවවෙනි සියවසේ දෙවන භාගයේ ආරම්භයේදී පමණ ඇලෙක්සැන්ඩර් කනිංහැම් මහතා විසින් සාංචියේ අංක 2 දරණ ස්ථූපයෙන් සොයාගත් ධාතු කරඬුවක කොටා තිබුණු අභිලේඛණවලින් භික්ෂු ධර්මදූත සේවයේ ඓතාහාසිකත්වය පිළිගැනිණි. හිමවතට යැවූ ශ්‍රී ලංකා වංශකතා වල සඳහන් ධර්මදූතයන් පස්නමගෙන් දෙනමක් වන මජ්ඣිම තෙරුන්ගේ නම සහ කස්සපගොත්ත තෙරුන්ගේ නම එම කරඬු අභිලේඛනවල සඳහන් වේ. එක ධාතු කරඬුවක ඇතුළු පියනේ සපුරිස(ස)මජ්ඣිමස " මජ්ඣිම නම් ශාන්තුවරයාගේ ධාතු යන්නද, පිට පියනේ සපුරිස(ස)කාසප ගොතස සව හෙමවතාචරි යස." මුලු හිමාලය ප්‍රදේශයේ ආචාර්යය තැන්පත් කස්සපගොත්ත නම් ශාස්තෘවරයාගේ (ධාතු) යන්නද සඳහන් වේ. සෝනාරියේ අංක දෙක දරන ස්තූපයෙහි තිබී සොයාගත් කරඬු අභිලේඛනවලින් සහා අළුබඳුන් අභිලේඛන වලින් මේ තොරතුරු තව දුරටත් සනාථවන අතර දදභිසාර (දුන්දුභිස්සර) නම් තෙරුන්ගේ නම ගොතිපුත්ත නම් තෙරුන්ගේ නම සමඟ අළුබඳුනක එකට කොටා තිබේ. දුන්දුභිස්සර තෙරණුවන් හිමාල ප්‍රදේශයට ගිය ධර්මදූතයන් වහන්සේ නමකි. මේ කරඬු හා අළු බඳුන් අභිලේඛන අනුව හිමවතට යැවූ ධර්ම දූතයන් අතර ප්‍රමුඛස්ථානය හිමි වූ බව පෙනෙන්නේ කස්සපගොත්ත තෙරණුවන්ටය. දීපවංසයේත් උන්වහන්සේගේ නම මුලට සඳහන් වේ. එහෙත් සමන්තපාසාදිකාව මහාවංසය හා එහි ටීකාවට අනුව ප්‍රමුඛස්ථානය හිමි වී තිබෙන්නේ මජ්ඣිම තෙරුන්ටය. හිමවතට ගිය ධර්මදූත කණ්ඩායමේ නායකත්වය ගැන ශ්‍රී ලංකා වංශ කතාවල එකඟතාවයක් නැති වුවත් හිමවතට යැවූ ධර්මදූතයන් පස්නමකගෙන් තුන්නමක් ඉන්දියාවෙන් සොයාගත් අභිලේඛන වලින් ද තහවුරුවී ඇති හෙයින් ලංකාවේ වංශකතා වල සඳහන් ධර්මදූත මෙහෙය පිළිබඳ පුවත ඓතිහාසික පදනමක් ඇති එකක් ලෙස පිළිගත හැකිය.

මහින්ද තෙරුන් ශ්‍රී ලංකාවට බුදුදහම හඳුන්වා දුන් ධර්මදූතයන වහන්සේ බව හියුං-ත්සිං විසින් ප්‍රකාශකර තිබීමෙන්ද එම ධර්මදූත සේවයේ ඓතිහාසිකත්වය තව තවත් තහවුරු විය. එමෙන්ම ශ්‍රී ලංකාවෙන් හමුවන සෙල්ලිපි වලින්ද එම ධර්මදූත සේවයේ විශ්වසනීයත්වය තහවුරු කෙරෙයි.

**" දහනවවෙනි සියවසේ දෙවන භාගයේ ආරම්භයේදී පමණ ඇලෙක්සැන්ඩර් කනිංහැම් මහතා විසින් සාංචියේ අංක 2 දරණ ස්ථූපයෙන් සොයාගත් ධාතු කරඬුවක කොටා තිබුණු අභිලේඛණවලින් භික්ෂු ධර්මදූත සේවයේ ඓතිහාසිකත්වය පිළිගැනිණි "**

උදයංගනි ප්‍රියංගිකා

ළා දළු බෝපත් සෙමෙන් සැලෙනසේ
යසෝදරා දේවී
වාවනු බැරි තැන රහසේ හැඬුවා
පෙර සංසාරේ ඇසුර මතක් වී

ලේන කුලේසිට ආගිය මඟ තොට
සිටියා නොසැලෙන පහන් ටැඹක් සේ
නිවන් දකින තුරු මේ සංසාරේ
පසු පස ආවා සෙවනැල්ලක් සේ

තැළී සෙනේ සිත සැලී හඬන විට
වැටී දෙපා ළඟ යසෝදරාවෝ
පිපී නිවන් මල් සාදුකාර දී
නිවී පහන් විය උදෑසනක් සේ





ගේය පද පූජ්‍ය රඹුක්කන සිද්ධාර්ථ හිමි
සංගීතය හා තනුව එච්.එම්. ජයවර්ධන
ගායනය කරුණාරත්න දිවුල්ගනේ

# නිවී පහන්විය යසෝදරාවෝ...

පරමාදර්ශී කාන්තාවක් වන යසෝදරාවගේ සාංසාරික ආධ්‍යාත්මික ප්‍රේමය පිළිබඳ කතා පුවත පසුබිම් කරගෙන අපූර්ව ගී පද පෙළක් නිමවී ඇත. රඹුක්කන සිද්ධාර්ථ හිමියන්ගේ ගේය පද රචනය යසෝදරාවගේ නිර්මල ප්‍රේමයත් ඈ සතුවූ අපරිමිත දයාව, කරුණාව, පතිභක්තිය, පරාර්ථකාමීත්වය ආදී ගුණාංග අපගේ මතකයට නංවයි. යසෝදරාවගේ ගුණගරුක බව වඩාත් හොඳින්ම ඉස්මතු වන්නේ යසෝදරාවත" තුළයි.

**කැලේ තියෙන කොයි දේවත්රස වේවා**
**මලේ බඹරු මෙන් පිරිවර ඇති වේවා**
**අව්වේ තියෙන රැස් මාලා අඩු වේවා**
**ගව්වෙන් ගව්ව දිව මාළිග සැදේවා**

ජන කවියෙකුගේ හදවතින් මෙවන් අව්‍යාජ ප්‍රකාශයක් මතුවන්නේ යසෝරාව පිළිබඳව බෞද්ධ සාහිත්‍යයේ හෙළි වන කරුණු අනුවය.

දයා කරුණාවේ ගුණ සුවඳ විහිදුවමින් සංසාරයේ බොහෝ දුරක් බෝසතාණන් වහන්සේගේ ප්‍රිය බිරිඳ වී සිටි යසෝදරා සැබවින්ම සුවිශේෂී කාන්තාවකි.

මතු බුදු බව ලැබෙන ලෙස පැතූ මුල් අවධියේම ඔහු බුදු බව ලබන තෙක් සංසාර ගමනේ බෝසතාණන්ගේ පාද පරිචාරිකාව වන්නට ඇය පාර්ථනා කළාය.

ඈ ප්‍රාර්ථනා කළ පරිදිම භවයෙන් භයේ බෝසතාණන් හා එක්ව පිය නැගුවාය. පරාර්ථය පිණිස ජීවිතය කැප කරමින් තම හිමියන්ට ධෛර්ය දෙමින් ඔහු හා දුක සැප බෙදා ගත්තාය. වෙස්සන්තර දේවියව උපන් භවයේදී වෙස්සන්තර රජු දරුවන් දන් දුන් පසු අසීමිත වූ දරුදුක හඬමින් වුවද දරාගෙන ඇය ද ඒ පින අනුමෝදන් වන්නීය.

වෙස්සන්තර රජු දේවියද දන් දෙයි. ඇය එයද තම හිමියන්ගේ පරාර්ථකාමී පැතුම වෙනුවෙන් ඉවසා දරා ගන්නීය.

උපන්දිනයේදීම රාහුල කුමරුවනුත් තමාත් තනිකොට සිදුහත් කුමරා ගිහි ගෙයින් නික්ම ගියද ඇය සිය දුක්ඛ දෝමනස්සයන් සියල්ල දරා ගනී. ඇය සියළු සැප අතහැර සැමියාගේ බුදු බව වෙනුවෙන් නිබඳව ප්‍රාර්ථනාවන් කළාය. අනෙකුත් කාන්තාවන් මෙන් තමා හැර ගියා යැයි කිසි විටෙකත් චෝදනා නොකළාය.

ළා දළු බෝපත් සේ සංවේදී සියුම් හදවතක් ඇති ඇය සියලු දුක්ඛ මහෝගයන් දරා ගනිමින් රහසේ හැඬුවාය. අනෙක් කාන්තාවන් මෙන් තම හිමියා විවේචනය කරනු වෙනුවට සියලු දුක් තමාම දරා ගත්තාය.

සඳ කිඳුරන්ව උපන් ආත්ම භවයේ දී සඳ කිඳුරා හී සැර වැදී ළය සිදුරුව ගිය විට ඔහුගේ ජීවිතය යළි ලබා ගත්තේ සිය පතිනි බලයෙනි. මෙලෙසින් යසෝදරා කෙතරම් විපත් කඩා වැටුණ ද සියලු දුක් සමසේ දරා ගත්තාය. කල්ලන්දක ජාතකයේ ලෙහෙනුන්ව ඉපිද තම දරුවා මුහුදට වැටුණු විට පතිභක්තියේ බලයෙන් ද ගුණ මහිමයෙන් ද එය ජය ගත්හ.

මේ නොසැලෙන ගුණය යසෝදරාවෝ ආත්ම ගණනක සිට පුරුදු පුහුණු කළාය.

ඇයගේ ඉවසීමත් කරුණාව හා දයාවන්ත බවත් කැපවීමත් බුදු රදුන්ගේ බුද්ධත්වයට විශාල පිටිවහලක් විය.

සිදුහත් කුමරුන් බුද්ධත්වයට පත්ව කිඹුල්වත් පුර වීදියක වැඩම කරද්දී සිය රාහුල පුතණුවන්ට බුදු රදුන් පෙන්වා උන්වහන්සේගේ රුව "චක්ඛවරංඛිත රත්ත සුපාදෝ " වශයෙන් නරසීහ ගාථා ගයමින් වර්ණනා කළාය.

තමා හැර ගිය සැමියා කෙරෙහි ඈ තුළ පැවති ප්‍රේමය කොතෙක්ද යන්න මෙයින් පැහැදිළි වේ.

ජාතක කතා පෙළ කියවන විට අපට පැහැදිළි වන්නේ ලෝයේ මෙතෙක් ජීවත් වූ හොඳම පෙම්වතුන් යුවළ සිදුහත් හා යසෝදරා බවය. උම්මග්ග ජාතකයේ අමරා දේවීව බෝසතාණන් හා ගැළපෙන නුවණැතිව යසෝදරාව විසුවාය.

කුස ජාතකයේදී ද ඉවසීම, වීර්ය ප්‍රගුණ කරමින් බෝසතුන් පබාවතියට ප්‍රේම කළේය.

මේ සියලු සසර සැමරුම් දෑස් තෙමාලන්නක් වූවද තම හිමියන්ට දිරි දෙමින් පින් දහම් කළ යසෝදරාවෝ ලොව්තුරා මාවතේ ශාන්තිය ලබා ගන්නට තරම් වාසනාවන්ත වූවාය.

උදෑසන " යනු නව දිනයක උදවකි. පෙර දිනයේ සියලු දුක් දොම්නස් ඉවතලා නැගී සිටිය අවස්ථාවකි. නිවන උදෑසනක් " වන්නේ පෙර ආත්මයෙහි ක්ලේෂයන්ගෙන් මිදී නව මාවතක් වෙත එළඹීම නිසාය.

රඹුක්කන සිද්ධාර්ථ හිමියන්ගේ සංයමයෙන් යුතු ස්වකීය බස් වහර එච්.එම්. ජයවර්ධනයන්ගේ තනුවෙන් කරුණාරත්න දිවුල්ගනේගේ හඬට මුසුව ගලා යන්නේ සහෘද හදවත් හි කරුණා රසයත් ශාන්ත රසයත් උපදවමිනි.

ගීතය සවනත වැකෙත්ම බෞද්ධ අබෞද්ධ කාගේත් සිත් භාවනාවක දැහැන් ගත කරවයි.



චාමිකා ජනානි ද සිල්වා



## පොසොන් පොහොය දින වැදගත්කම

1. මිහිඳුමහ රහතන් වහන්සේගේ ලංකා ගමනය සිදුවීම.
2. බුද්ධි පරීක්‍ෂණය සිදුවීම
3. ලක්දිව බුදුසසුන පිහිටු වීම.
4. චුල්ල හත්ථිපදෝපම සූත්‍ර දේශනාව කිරීම.
5. භණ්ඩුක කුමරුගේ පැවිද්ද හා උපසම්පදාව සිදුවීම.

- පූජ්‍ය ගලගෙදර රතනවශ හිමි -

# සම්බුදු දහමයි සදහම් මිහිරයි සිරිලක වනිතාවයි

සමස්ථ ලෝකවාසී බෞද්ධ ජනතාවට වෙසක් පුන් පොහෝ දිනය අත්‍යෝදාර වන්නා සේම හෙළ බොදුනුවන්ට පොසොන් පුන් පොහෝ දිනයද සුවිශේෂී වන්නේය. පොසොන් පුන් පොහොය වැදගත් කරුණු රාශියකි.

1. මහබෝසතාණන් වහන්සේ දුටු පෙර නිමිති හතරෙන් තුන්වන පෙර නිමිත්ත වූ මරණය දැක කළකිරීම
2. බුද්ධ වර්ෂ 236 වැන්නේ මිහිඳු හිමියන් සම්බුදු දහම ගෙන ලක්දිව වැඩම වීම
3. මිහිඳු මහා රහතන් වහන්සේ ශ්‍රී ලංකාවේ බුදු සසුන පිහිටු වීම
4. ලක්දිව දී දෙවියන්ට සමචිත්ත පරියාය සූත්‍රය දේශනා කිරීම.
5. දෙවන පෑතිස් නිරිඳු ඇතුළු 40 000ක පිරිසට චුල්ලහත්ථි පදෝපම සූත්‍රය දේශනා කිරීම
6. භණ්ඩුක කුමරු මහණ උපසම්පදා කිරීම
7. ශ්‍රී සද්දහම ශ්‍රවණය කළ රාජකීය කාන්තාවෝ මාර්ගඵල ලැබීම

ඉහත කරුණු කාරනා සම්බන්ධයෙන් පොසොන් පුන් පොහොය සමස්ථ ශ්‍රී ලාංකීය ජනතාවටම අත්‍යුදාර වන්නේ පුද්ගලයාගේ මොලොව පරලොව විමුක්තිය සාධනය කරගැනීමට මේ වනතුරු දියුණු වූ ආගමක් දර්ශනයක් නොවූ හෙයිනි. එමෙන්ම මිහිඳුමා හිමියන්ගේ ආගමනයට පෙර සංස්කෘතික සාමාජීය වශයෙන්ද අප පොහොසත් නොවිමු. මිහිඳු මහා රහතන් වහන්සේගේ ආගමනයෙන් අප ලද දායාදය බොහෝය.

1. මයුර ශිෂ්ඨාචාරය යටතේ ඉන්දියාවේ දියුණුව තිබූ ගෘහ නිර්මාණ ශිල්ප
2. කැටයම් කලාව
3. චිත්‍ර, මූර්ති ශිල්ප
4. වාරි කර්මාන්ත
5. බ්‍රාහ්මී අක්ෂර කලාව

ආදිය කරණ කොට ගෙන පන්සල් වෙහෙර විහාර ගෙවල් දොරවල් මැනවින් සකස් වෙද්දී ඒ සියල්ල අභිබවමින් මහණ චිත්ත සන්තාන බුද්ධාලම්භන ප්‍රීතියෙන් ඔද වැඩුනේ ශ්‍රී ලාංකීය ජනතාවගේ හදවත හදුනාගනිමින් මිහිඳු මහා රහතන් වහන්සේ ඇතුළු මහාරහතන් වහන්සේලා දෙසූ ධර්ම දේශනා නියායෙනි.

ශ්‍රී ලංකාවේ ජනතාවට සුලභව අසන්නට දකින්නට ලැබෙන හස්ථි උපමාවක් ගෙනහැර දක්වමින් දේශනා කළ චුල්ල හත්ථි පදෝපම සූත්‍රදේශනාවෙන් ලොව්තුරා සම්මා සම්බුදු පියාණන් වහන්සේගේ ගුණය විදහා දක්වීම කොතරම් සාර්ථක දැයි කිවහොත් හතලිස් දහසක් පමණ ධර්මය ඇසූ පිරිසෙන් ස්ත්‍රී පුරුෂ බොහෝ දෙනෙකු සෝවන් මාර්ගඵල නුවණ ලැබිය. එදවසම රාත්‍රියේ සුමන සාමණේරයන් වහන්සේ දේවාරාධනය කිරීමෙන් චුල්ලහත්ථි පදෝපම සූත්‍රසාරය ඇසූ දෙවියෝ එතැන ලක්ෂ ගණනින් රැස්වූහ. එම දෙවියන්ට සමචිත්ත පර්යාය" සූත්‍රයෙන් දහම් දෙසා දෙවියන්ගේ රැකවරණය ද ලැබ දුන්සේක.

දහම් ශ්‍රවණය කළ පිරිස අතර මාර්ග ඵල ලැබූ අතර බහුතරයක් කාන්තාවන් විය. දෙවන පෑතිස් නිරිඳුගේ සොහොයුරු මහනාග යුවරජුගේ අගබිසව වූ අනුලා දේවිය ඇතුළු 500 කට අධිකව මාර්ගඵල ලද කාන්තාවෝ දිගින් දිගටම සදහම් ශ්‍රවණය කරමින් සිය ජීවිත මෙලොව පරලොව ශාන්තිය ඇතිවන අයුරින් සකස් කරගත්තා පමණක් නොව ලෞකික ජීවිතයේ හරසුන් භාවය වටහා ගනිමින් පැවිද්දට යොමු වීමට තීරනය කළහ. නව ලොව්තුරු සදහම්හරය තව දුරටත් ජීවිතය තුළ සපථ කරමින් සකෘදාගාමී ඵල ලැබූ අනුලා දේවිය ප්‍රමුඛ රාජකීය කාන්තාවෝ මිහිදු හිමියන් ගෙන් මෙන්ම දෙවනපෑතිස් නිරිඳුන්ගෙන් පැවිද්ද අවශ්‍ය බව ඉල්ලීය.

මෙහි ප්‍රතිඵලයක් ලෙස ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේගේ දක්ෂිණ ශාඛාවත් අප රටේ සංස්කෘතික ප්‍රබෝධය අති කිරීමෙහි සමත් ශිල්ප ශ්‍රේණි 18 ක්ද මේ රටතුළ ඉතා සීග්‍රයෙන් මෙහෙණි සමාජය අරඹා ව්‍යාප්ත කිරීමෙහිලා අති දක්ෂ තරුණ නික්ලේශී මහරහත් තෙරණින් වහන්සේලාද අපට දායාද විය.

ශ්‍රී ලංකාව තුළ දම්බුදු දහම අරඹා හය මසක් ගතවන දිනේදී ක්‍රි.ව. 236 වැන්නේ උඳුවප් පොහෝ දින අනුලා දේවිය ඇතුළු මාර්ගඵල ලාභී උපාසිකාවන් මහණ උපසම්පදාව ලැබ මේ සිරිලක් ධරණී තලය සිව්වනක් පිරිසෙන් සමුපූර්ණ කළහ.

මෙසේ ඇරඹී මෙහෙණි සමාජය සමාජය තුළ තම තමන් වහන්සේලා ඓහලෞකික පාර ලෞකික වශයෙන් (ලෞකික-ලෝකෝත්තර) ජීවිත සාර්ථක කරගනිමින් සමාජයේ සියළු කාන්තාවන්ට එදිනෙදා ලෞකික ජීවිතත් ලෝකෝත්තර ජීවිතත් සාර්ථක කර ගැනීමෙහිලා සුවිශේෂී ලෙස දහම් දෙසූහ. ප්‍රතිපත්ති පිරූහ. එහි ප්‍රතිඵලයක් ලෙස අනුරාධපුර රාජධානිය තුළම විසි තිස් දහස් ගණනින් භික්ෂුණීහු රට තුළ ව්‍යාප්තව සිටි බව වංශකතා සාක්ෂි දරයි. දුටුගැමුණු මහා රජතුමා විසින් පැවැත්වූ රුවන්වැලි මහාසෑ පූජෝත්සවයේදී දාහතර දාහසක් භික්ෂුණීන් වහන්සේලා වැඩහිඳ ඇත. මිරිසවැටි වෙහෙරේ ධාතු නිධානෝත්සවයේදී භික්ෂුණීන් වහන්සේලා අනූපන්දහසක් සහභාගී වී ඇත. එසේම එවකට සිටි රජවරුන්ගේ ඇමති වරුන්ගේ දියණිවරු, බිසෝවරු, මව්වරු පවා පැවිදි කරන්නට තරම් භික්ෂුණී සමාජය බැබලුණි.

වත්මන් පිංවත් කාන්තාවනි, එදා මේ අයුරින් නිර්මල බුදු දහමේ අගය වටහා ගත් ප්‍රඥාවන්ත කතුන් සසුන් ගතව කටයුතු කළ අතර ඒ මෙහෙණිවරු අනුගමනය කරමින් විමානවත්ථු, පේතවත්ථු වැනි දහම් දෙසවුන් අනුගමනය කරමින් ගෘහස්ථ ජීවිතයත් බෞද්ධ ජීවිතයත් මැනවින් සාර්ථක කරගත්හ. උදාහරණයක ලෙස ඔබේ ජීවිතයට එකතු කරගන්නවානම් විහාරමහා දේවියගේ සෝමා දේවියගේ චරිතය දෙස අවධානය යොමු කළ හැකිය. විහාර මහා දේවිය පිළිබඳ ඔබ අවධානය යොමු කරන්නේ නම් ඔබට ඇති ගැටළු රාශියක් විසදා ගත හැකිය. දේවි කුමරිය සුකුමාල තරුණියක්ව සිටි මොහොතේ රට, ජාතිය, ආගම වෙනුවෙන් ජීවිතය පරිත්‍යාග කිරීමට නොබියව ඉදිරිපත් වූයේ ඇ තුළ තිබූ ආත්ම විශ්වාසයත්, සෘජු බවත්, අවංක බවත්, වීරෝදාර බවත් නිසාය. පිංවත් ඔබටත් යම් යම් ගැටළු පැන නගින මොහොතක මේ උදාර චරිතය සිහියට නගා ගන්න. මොහොතක මේ උදාර චරිතය සිහියට නගා ගන්න. ඔබ ඔබ තුළම ආත්ම විශ්වාසයක් ගොඩ නගා ගන්න. මට මෙය කළ හැකියි. මට මේ සඳහා කායික මානසික ශක්තිය තිබෙනවා. දේවි කුමරියට මුහුදට බිලිවෙන්න හැකි වුණි නම් අනුලා බිසව ඇතුළු පිරිසට සියළු රජ සැප අතහැර දමා පැවිදි වීමට හැකි වුණි නම්, තරුණ සංඝමිත් තෙරණියට රට, ජාතිය හැර දමා අනුන්ගේ රටක් වෙනුවෙන් ජීවිතය කැප කිරීමට හැකි වුණි නම් මට ද මේ සියළු ගැටලු හමුවේ ඉවසීමේ ස්ථානෝචිත ප්‍රඥාව ඇති කරගනිමින් කටයුතු කළහැකි පව තරයේ සිහියට ගත්විට ඔබද එදා මෙදා තුර ජීවත් වූ ශේෂ්ඨ කාන්තා රත්නයන් අතර එක් අයෙකු වීම නොඅනුමානය.

> සම්බුදු රදුන් ලොව පහළව වසර ගණනාවක් සපිරුනත් නිර්මල බුදු සසුන තවමත් ප්‍රභාශ්වරය. එම නිසා ඔබ ඒ නිර්මල බුදු දහමට අනුගත වන්නේ නම් ධමෙමා හවේ රක්ඛති ධමමචාරී" ඒ ඔබේ නිවැරදි දහම් මඟ කරන කොට ගෙන ඔබේ ආරක්ෂාව ඒකාන්තයෙන් සැලසේ.

පිංවත් කාන්තාවනි,ඔබට රට ජාතිය වෙනුවෙන් උදාර එහෙත් යම් කර්ක මෙහෙයක් කරන්නට වූ මොහොතක කල්පනාවට ගතයුතු කරුණක් වන්නේ සඝමිත් තෙරණිය ශ්‍රීමා බෝධීන් වහන්සේ වැඩමවාගෙන නැවේ පැමිණෙන් මොහොතේ විවිධ උවදුරු ඇති වුණත් නොබියව අධිෂ්ඨානශීලීව වැඩම කළ නිසා ශ්‍රී ලාංකීය ජනතාවට ඒ අත්‍යුදාර බෝධීන් වහන්සේත් කාන්තා පැවිද්දත් ලැබ මහඟු සේවයත් සැළසුනා සේ කාන්තාවක් වීම මාගේ ශ්‍රේෂ්ඨ කර්තව්‍යට බාධාවක් නොවන බව සිතමින් පිංවත ඔබට ඔබේ කාර්ය මැනවින් ඉටුකළ හැකිය.

මෙසේ අදිටනින් සිංහලකම බෞද්ධකම රැකගත් කාන්තාව මෑත භාගය වන තුරුම තම තමන්ගේ ආත්ම ගරුත්වය රැකගනු පිණිස ආධ්‍යාත්මය ගරු කරමින් දිවි ගෙවූහ. එම නිසාම දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුව දක්වා සර්වාභරණයෙන් සැරසුන කතකට පා ගමනින් අනතුරු රහිතව ගමන් කළ හැකි විය. එහෙත් අද තම නිවස තුළද කාන්තාවට ආරක්ෂාවක් නොමැත. මෙයට වගකිව යුත්තෝ කවුරුන් වුවද කාන්තා ඔබේ ආරක්ෂාව සලසා ගත යුතුය.


සම්බුදු රදුන් ලොව පහළව වසර 2600 ක් සපිරුනත් නිර්මල බුදු සසුන තවමත් ප්‍රභාශ්වරය. එම නිසා ඔබ ඒ නිර්මල බුදු දහමට අනුගත වන්නේ නම් ධමෙමා හවේ රක්ඛති ධමමචාරි" ඒ ඔබේ නිවැරදි දහම් මඟ කරන කොට ගෙන ඔබේ ආරක්ෂාව ඒකාන්තයෙන් සැලසේ. ඔබ විසින් කළ යුත්තේ හදවතට එකඟව ඔබ නිසාවත් අන්‍යයන් නිසාවත් පිරිසිදු පංචශීලය කඩනොකර ගැනීමය. ඔබගේ නිවස තුළ සාමය, සමඟිය නැතිවන අවස්ථා තේරුම් ගෙන ඉවසීමෙන් හා ප්‍රඥාවෙන් කටයුතු කිරීමය. එසේම ඔබ දියණියක්ද, මවක් ද, මිත්තණියක් දැයි තේරුම් ගෙන යෑම්, ඊම්, කෑම්, බීම්, ඉඳුම්, හිටුම්, ඇඳුම්, පැළඳුම් තෝරා ගැනීම සහ පරිහරණය කිරීමය.

මෙසේ පිංවන්ත ඔබ කටයුතු කරන්නේ නම් ඔබගේ ජීවිත ගැටළු නිමා වී සාමය, සමඟිය මෙන්ම විමුක්තියද ඔබට උදාවනු ඇත.

ඔබට මේ දහම් මඟ මෙසේ යෑමට ශක්තියක් නොවන්නේ නම් ඒ සදහාද කළ යුතු දේ බොහෝය. බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාර තිබෙන්නේ මේ නිර්මල සමුබුදු සසුන සම්බුදු දහම පවතින්නේ කල්‍යාණ මිත්‍ර ධර්මය මත බවයි. ඒ නිසා වීරෝදාර ශ්‍රී ලාංකීය පිංවතියනි, ඔබගේ ජීවිත ගැටළු නිමාකර ගෙන ඔබගේ මෙලොව පරලොව දෙලොව දියුණුවට අතහිත දෙන කල්‍යාන මිත්‍ර ආශ්‍රයක් ඔබ හුරු පුරුදු කර ගන්න. බෞද්ධ ඔබගේ හොඳම කල්‍යාන මිත්‍රයා ලොව්තුරා ශ්‍රී සද්ධර්මයයි. ඒ ශ්‍රී සද් දහම ඔබටද දායාද කරන භික්ෂු භික්ෂුණීන් වහන්සේලාගේ ඇසුර නිතරම ඔබ තබාගත යුතුයි. ඔබේ දියණිය, පුතණුවන්, සොයුරිය, සොයුරාණන් නිතර මහා සංඝරත්නයේ අසුරට යොමු කරන්න. එවිට ඔබට යම් ගැටළුවක් ඇති වූ විට ඒ කල්‍යාණ මිත්‍ර උපදේශය මත විසදාගැනිමට ශක්තිය ධෛර්යය ඒකාන්තයෙන් ලැබෙනු ඇත. එතුළින්ම ඔබේ සැනසීම වේවා.

මිහිරිපුර ධම්මප්‍රදීපා භික්ෂුණීන් වහන්සේ

# නිරාමිස ප්‍රීතිය නිවනට මගවේ



අප තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ අසංඛ කල්ප ලක්ෂයක් පෙරුම් පුරා සසර සැරිසරන සත්වයින් විඳිනා දුක දැක අවබෝධ කොට ඉන් මුදවා ගැනීමට බුද්ධත්වයට පත්වූ සේක. මිනිස් සත්වයාගෙන් නැවත මිනිසුන් වශයෙන් උපදින්නේ ඉතා අල්ප ප්‍රමාණයකි. එසේම ඉතාම සුළු කොටසක් දෙවියන් වශයෙන් ද පහල වන බව බුද්ධ දේශනාවයි. ඉතිරි මම හා පස්කන්ද වැනි බහුතරයක් උපදින්නේ තුන්තැනක බව දේශිතය. ඒ තිරිසන්, ප්‍රේත, නිරයයි. බුදුන් වහන්සේගේ එකම පරමාර්ථය සසර ගමනේ යන පුද්ගලයා එතෙර කිරීමයි. අසූහාරදහසක් ධර්මස්කන්ධය දේශනා කරන ලද්දේ මේ ජීවිතයේදීම නිවන අවබෝධකර ගන්නටය. මේ දුකින් මිදෙන්නට බුදුරජාණන්වහන්සේ අප කෙරෙහි මහත් කරුණාවෙන් අවවාද කළේ විදර්ශනා වඩන්නටය. විදර්ශනා යනු ඇත්ත ඇති සැටියෙන් දැකීමයි. යථා සම්භාවය දැකීමයි.

පංචස්කන්දය යනු බඹයක් පමණ වූ මේ සිරුරයි. කායගතාසතිය වඩා සිරුරේ යථා ස්භාවය අවබෝධ කරගෙන නුවණ වඩා ගත යුතුයි. මෙය දෙතිස් කුණුපයක් බවත් පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන කොටස් 4ක් මිස සත්වයෙක් පුද්ගලයෙක් මම" කියා කෙනෙක් මෙහි නැති බවත් අවබෝධ ඥානයෙන්ම දැන ගත යුතුයි. සිත හා කය යන රූප කලාප ගොනු 2ක් බවත් කය යනු අජීවී වස්තුවක් බවත් ඒ අජීවි වස්තුව දිරා යන කරත්තයක් බවද බුද්ධ දේශනයයි. දිරා යන මේ කරත්තය තල්ලු කරගෙන යන්නේ හිත බව පෙන්වා දී ඇත. සිත කයෙන් වැඩ ගන්නා බැවින් මරණය දක්වාම මේ ක්‍රියාවලිය සිදුවන්නේ මම" වැඩ කරනවා යනුවෙන් පවසමින්ය. ආයුෂ කර්මය අවසන් වූ විට කය බිම දමා සිත එසේ නැතිනම් විඤ්ඤාණය වෙනත් කයක් ගන්නා බව පෙන්වා දී ඇත.

මේ ජීවිතයේ දී කරන ලද සිතින් කයින් වචනයෙන් කළ කර්මයන්ට අනුව වෙනත් කයක් ගනී. ඒනිසා බුදුන් වහන්සේ වාසනාව ඇති පිංවතුන් සොය සොයා පා ගමනින් වැඩම කරන ලද්දේ සත්වයා සසර දුකින් එතෙර කරන්නටයි. අවුරුදු 45ක කාලයක් දේශනා කරන ලද අසූහාරදහසක් ධර්මයන් දේශනා කරන ලද්දේ අප්‍රමාදිව සම්පාදනය කරගන්නනා ලෙසය. අවකසානයේ පිරිනිවන් මංචකයේ වැඩ සිට සුභද්‍ර භික්ෂූන් වහන්සේටද දේශනා කළේ අප්‍රමාදීව වාසය කරන ලෙසය. බුදුරජාණන් වහන්සේගේ දේශනාව අල්ප කෘතියක් ඇතිව වාසය කිරීමය. සැහැල්ලු සන්සුන් ඉඳුරන් ඇතිකර ගැනීම චතුරාර්ය සත්‍යය අවබෝධ කිරීමය.

බුදුන්වහන්සේ දේශනා කරන ලද්දේ නිවන් අවබෝධය සඳහා යන ගමනේ සංයෝජන බාධක 10ක් ඇති බවයි.

සිත දමනය කිරිම, සිත මෙල්ල කිරීම, සිත සකස් කර ගැනිම, සිත නිවා ගැනීම කළ යුතු ප්‍රධානතම කාර්යයකි. ඇස, කණ, නාසය, දිව, කය, යන පසිඳුරන් සයදෙනා සංවර කර ගැනීම බුද්ධ දෙශනාවේ හඳුන්වා දී ඇත. දෙතිස් කුණුපයන්ගේ කොතැනක හෝ මම" කියා පුද්සලයෙක් නැතිනම් අවබෝධ ඥානයෙන් සක්ඛාය දිට්ඨි නැති කරගත යුතුයි.

තෙරුවන් සරණ ගිය අයෙකුට කිසිසේත්ම සැකයක් ඇති නොවේ. බුදුන් වහන්සේ මේ ලොව පහළ වූයේ බමුණු සමාජයේ 62ක් මිත්‍යා ඇදහීම් ඇති යුගයකදීය.

බුදුන් දවස සෝවාන් මාර්ගඵල ලැබූ පිංවතුන් සුලභව සිටි බව ධර්මයේ සඳහන්ය. වෙර දරනා නැණවතෙකුට මඟ විවෘතය. එහි ඉදිරියට යාම ඔබ සතුය. පෙර සරේදී කළ කුසල කර්ම පැතුම් බොහෝ විට බලපාන්නේය. සංසාරික පුරුද්ද අත්‍යවශ්‍යය.

මිනිස් ලොව යනු කාම ලෝකයකි. එහි ඇති සියළු වස්තූන් කාමවස්තුය. මාපිය, භාර්යා, දූ දරු, නෑදෑ, හිතමිතුරු, ගේදොර, වතුපිටි, යානවාහන, මිළ මුදල්, පදවි පට්ටම් මේ ආදී සියල්ල කාම වස්තූන්ය.

මේවා කෙරෙහි සිතේ පවතින ලෝභය කාමච්ඡන්දය" යනුවෙන් හඳුන්වයි. මේ ලෝකයේ කිසි දෙයක්, කිසි තැනක්, කිසිකෙනෙක් කෙරෙහි ආශාවක් ඇලීමක්, බැඳිමක්, තණ්හාවක්, උපාදනයක් නැති නම් එය කාමච්ඡන්ද නිරෝධයයි. ගිහි ජීවිතයේදී නම් ඔබට මෙය කිරීමට අපහසු කාර්යයක් වුවද විදර්ශනා වඩා සිත පුරුදු පුහුණු කිරීමට වැයම් කළ යුතුයි.

පංච උපාදනස්කන්ධයම දුකකි. මෙවන් භයංකාර දුක් සහිත ගමනකට හේතුව කුමක්දැයි විමසා හේතු නසා දැමීමේ ක්‍රියාදමයට සම්බන්ධ නොවුනේනම් අපි තරම් අවාසනාවන්තයෝ තවත් නැත. මිනිස් සත්වයාට එයින් ගැලවී ගත නොහැකිව දුක් කන්දරාව විඳගෙන ඒමේදී ඉතා අල්ප වූ පිරිසක් බුද්ධ අවවාදය අසා දුක නැති කරගන්නට උත්සහා කළේය. මීට හේතූන් ගණනාවක් ඇතත් ප්‍රධාන හේතුව වශයෙන් සැළකේන්නේ තණ්හාවය.

එලෙසම හුදකලා වීමද අනිවායයීයය. මේ සඳහා ආයයී අෂ්ටාංගික මාගීය වශයෙන් බුදුන්වහන්සේ දේශනා කළ සේක. තමා පිහිට තමාටමය. වෙනත් කෙනෙකුට ඔබට නිවන ලබාදෙන්නට හැකියාවක් නොමැත. ඔබ හුදකලා වී වීර්යය වැඩිය යුතුය. ඔබේ වැරදි ඔබම නිවැරදි කර සම්මාදිට්ඨිය වඩා නිවන දකින්නට උත්සහා කළ යුතුය. විශ්වයේ ඇති සෑම දෙයම අනිත්‍යය වූ අනාත්ම වූ දේ නිසා සියල්ල අත්හැරිය යුතුයි යන සම්මා සංකල්පය පුරුදු කළ යුතුයි. සියළු සත්වයෝම සුවපත් වේවා සසර දුකින් මිදෙත්වා යන සංකල්පය ජීවිතයට පුරුදු කරගන්න.

අපගේ ශාස්තෘන්වහන්සේගේ මඟ ගැනීම අපගේ පරම යුතුකමය. සසර දුකින් මිදීම සඳහා මේ සංකල්පය ජීවිතයට පුරුදු කර සම්මාසංකල්පය වඩා ප්‍රඥාව දියුණු කරගත යුතුයි.

නිවැරදි ජීවිකාව කිසිවෙකුට හිංසාවක්, පීඩාවක්, කරදරයක්, හිරිහැරයක් නොවන සේ ජීවිතය ගෙන යාම සඳහා පුරුදු විය යුතුයි. සරල ආහාරයකින් යැපෙන්නට පුරුදුවන්නේ නම් යෙහෙකි. යථාවාදී තථාකාරී ගුණය කරන දේ පමණක් කියන ගුණය ජීවිතයට පුරුදු කරගත යුතුමයි. මෙතෙක් දුරට අප පුහුණු කරගෙන ආ විදුසුත් මඟ ආර්යය අෂ්ඨාංගික මාර්ගය වඩාගෙන සම්මා සතියේ පිහිටා ගමන අවසාන කළ හැක. සතර ඉරියව්වේම මේ සමාධියේ සිත පිහිටුවීමට පුරුදු කළ යුතුයි. තමාගේ වැඩ තමාම කරගෙන නිරාමිස ප්‍රීතියෙන් සිටීමට පුරුදු විය යුතුයි. සිත සැමවිටම නිවන ලබන ධර්මයේම තබා ගන්න. පැය විසිහතර පුරාම කිසිවෙකුගේ ඇලීමක්, ගැටමක් නැතිව ජීවත්වීමට හැකිනම් බලවත් පිනක ප්‍රතිඵලයකි.

**සිත කයෙන් වැඩ ගන්නා බවත් මරණය දක්වාම මේ ක්‍රියාවලිය සිදුවන්නේ "මම" වැඩ කරනවා යනුවෙන් බව පවසමින්ය.**

චවින්ද්‍ර නිරෝමණී වෛද්‍යරත්න.

# මහින්ද්‍රගමනයෙන් ශ්‍රී ලංකාද්වීපයට දායාද වූ සංස්කෘතික උරුමයන්



උක්දිව රජකළ දෙවන පෑතිස් රජදවස සිදු වූ මිහිදු මහරහතන් වහන්සේගේ වැඩමවීම හේතුකොටගෙන සංස්කෘත විප්ලවයක් සිදු වූ බව ශාසන ඉතිහාසගත තොරතුරු වලින් පැහැදිලි වෙයි. මෙය පැහැදිලි වන්නේ එවකට ප්‍රාග් බෞද්ධ යුගයේ පැවැති ආගමික හා සංස්කෘතික තොරතුරු හැදෑරීමට ඇති මූලාශ්‍රයන් අතරින් මහාවංශය, සමන්තපාසාදිකාව යන ග්‍රන්ථත් දැනට ශේෂ වී ඇති ශිලා ලේඛනයන් ප්‍රධාන වේ.යක්‍ෂ,යක්‍ෂණී උදෙසා දෙවොල් ඉදිකර තිබූ බවට මහාවංශයේ එක් තැනක මෙසේ දැක්වේ.

**"මහාසුසානා ගිහිනං - පච්චිම රාජනිතථා**
**වෙසසාමනස්ස නිග්‍රෝධං - ව්‍යාධ දෙවස්ස නාලකං"**

සොහොන් භූමියට පසු පෙළෙන් පවුච්ම රාජිතයටද,වෙසමුණියාට,නුගගස්ද ,ව්‍යාධ දෙවියාට,තල් ගස්ද වෙන්කර පුද පූජා පැවැත්වූ බව සඳහන් වේ. මෙයට අමතරව මලවුන් ඇදහීම,වෘක්‍ෂ වන්දනාව, ජීවත වන්දනාව,යක්‍ෂ,නාග වන්දනාව පැවැති බව දැක්වේ. තාරකා වන්දනාව ද පැවැති බවට තොරතුරු සඳහන් වෙයි. මිහිදු මහරහතන් වහන්සේගේ වැඩමවීමත් සමගම මෙම මිථ්‍යා ඇදහිලි හා විශ්වාසයන් ක්‍රමානුකූලව වෙනස් වූ බව මෙසේ දැක්විය හැකිය.බෝධිවන්දනාව ඇතිවීමත් සමගම වෘක්‍ෂ වන්දනාව ජනතාවගේ මනසෙන් ඈත්විය. ශ්‍රද්ධාව පෙරටුකරගත් බෝධි පූජා ක්‍රමයක් ඇතිවිය. ධාතූන් වහන්සේලා නිධන්කර ස්ථූප ගොඩනගා ඒවාට වන්දනා කිරීමත් පුදපූජා පැවැත්වීමත් ආරම්භවීම හේතුවෙන් ජීවත වන්දනා ක්‍රමය නැතිවිය. මියගිය අය වෙනුවෙන් විවිධ පිංකම් කර පිංදීමෙන් මළවුන් පිදීමද නැතිවිය. මේ ආකාරයට නව අරුතක් ලබාදුන්නේ මිහිදු මහරහතන් වහන්සේ මෙරටට ගෙන එනලද නිර්මල බුදු දහමයි.

ශ්‍රී ලංකාවට ලැබුණු දායාද අතර බෞද්ධ කලා ශිල්ප ලධාන තැනක් ගන්නා බව සඳහන් කිරීමට පුළුවන. ඉන්දියාවේ පැවැති කලා සම්ප්‍රදායන් අතරින් ප්‍රධානවන ස්ථූප කලා නිර්මාණ ඍජුවම ලැබුණේ මහින්ද්‍රාගමනයෙන් බව පුරාවිද්‍යාඥයින්ගේ පිළිගැනීමයි.ස්ථූප නිමාණයන්ට උපාංගයන් වන වාහල්කඩ,වටදාගෙය,කොරවක්ගල ,මනුෂ්‍ය,දේව,සත්ව රූප ආදියත් මේ සමග ඇති වූ බව සඳහන් කළ හැකිය.

බුදුරජාණන් වහන්සේගේ ශාරීරික ධාතූන් ප්‍රධාන අතිරේක පූජනීය වස්තූන් තැන්පත් කර තනන ස්ථූපය චෛත්‍යය යන නාමයෙන් හඳුන්වනු ලබයි. රහතන් වහන්සේලා සහ බෞද්ධ භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් ද සක්විති රජවරුන් වෙනුවෙන්ද ස්ථූප සෑදූ බවත් බෞද්ධ ඉතිහාසගත තොරතුරු සඳහන් වෙයි. මෙය බෞද්ධ කලා නිර්මාණයක් ලෙස සැළකේ. බෞද්ධ ඉතිහාසයට අනුව ලොව මුල්ම ස්ථූපය ලෙස සැළකෙන්නේ බුදුරජාණන් වහන්සේගේ උපදෙස් පරිදි සැරියුත් ,මුගලන් මහ රහතන් වහන්සේලා පිරිනිවන් පෑ කල්හි වෙනුවෙන් ධාතූන් වහන්සේලා තැන්පත් කොට සෑදූ ස්ථූපයන්ය. ලංකාවේ සාදන් ලද මුල්ම ස්ථූපය ලෙෂ සැළකෙන්නේ බුදුරජාණන් වහන්සේගේ ධාතූන් වහන්සේලා නිධන් කර සෑදූ මහියංගන ස්ථූපයයි. මහින්ද්‍රාලමනයෙන් පසු ලංකාවේ සාදන ලද ස්ථූපය ලෙෂ සැළකෙන්නේ අනුරාධපුර ථූපාරාම දාගැබයි. බුද්ධ කාලීන ස්ථූපයක් ලෙෂ තිරියායේ කේශධාතූන් නිධන්කර තලස්සු භල්ලුක වෙළඳ දෙබෑයන් කරවන ලද ස්ථූපය සැළකෙන බව පුරාවිද්‍යාඥයින්ගේ පිළිගැනීමයි. දුටුගැමුණු රජතුමා විසින් කරවන ලද රුවන්වැලි මහා චෛත්‍යය සුප්‍රකට නිර්මාණයක් ලෙස සැළකේ. ධාතූන් වහන්සේලා ද්‍රෝණයක් මෙහි නිධන් කර ඇති බව වංශ කථාවල (ථූපවංශය) සඳහන් වේ. කලා නිර්මාණයක් ලෙස ගත්විට ස්ථූපය මනා සැලැස්මක් ඇතිව නිර්මාණයකරන ලද්දක් බව පැහැදිලිය. මෙය සය ආකාරයකින් යුක්ත වුවකි.

1.ඝණ්ටාකාර (සීනුව හැඩය) 2.ඝටාකාර(කළයක හැඩය)
3.බුබ්බුළාකාර(දියබුබුලක හැඩය)
4.ධාන්‍යාකාර(ධාන්‍ය ගොඩක හැඩය)
5.පද්මාකාර(පියුමකහැඩය)
6.ආමලාකාර(නෙල්ලි ගෙඩියක හැඩය)

රුවන්වැලි දාගැබ බුබ්බුලාකාරව සාදා තිබේ. ලංකාවේ විවිධ ස්ථානවල ඉහත සඳහන් ආකෘති ඇති ස්ථූප හමුවී තිබේ. ලංකාවේ ඇති ස්ථූප බෙදා වෙන්කර ඇත්තේ මෙසේය. ස්ථූපය නිර්මාණය වී ඇති ආකාරය මෙසේය.

**පාදම,ආසනය,පේසා වළලු,ගර්භය,හතරැස් කොටුව,දේවතා කොටුව,කොත් කැරැල්ල,කොත** යනුවෙනි.

ස්ථූපයක් ආරක්‍ෂාවට වටදාගෙයක්ද,වාහල්කඩක්ද,ගෘ හයක්ද සාදා තිබුණ බවට සාධක තිබේ. ඉන්දියාවේ සාංචි ස්ථූපයේ ලක්‍ෂණ මෙරට ස්ථූප වලටද ඇතුළත්ව තිබෙනු දක්නට ලැබේ. දෙවන කලා නිර්මාණයක් වූ බුද්ධ ප්‍රතිමාවන් නෙලීම වෙනුවට මුල් යුගයේ පැවැතියේ වජ්‍රසනය,පද්මට,සිරිපතුල,ධම් චක්‍රය වැනි සංකේතයන් භාවිත කිරීමය.භාරතයේ කණිෂ්ක රාජ්‍ය සමයේ ඉන්දියාවේ මථුරාවෙහි මුල්ම ප්‍රතිමාව නිර්මාණය කරන්නට ඇතැයි විශ්වාස කෙරේ. දෙවනපෑතිස් රජතුමා විසින් පළමුවරට ථූපාරාමයෙහි ගල්පිළිමයක් නෙලූ බවත් සඳහන් වෙයි. මෙය මහාවංශය තහවුරු කර තිබේ.

බුදුපිළිමය වර්ග 04කට බෙදා දක්වා තිබෙන බව ඉතිහාසගත තොරතුරු අනුව දැක්විය හැකිය.

1.හිඳි පිළිම
2.සිට පිළිම
3.සැතපෙන පිළිම
4සක්මන් පිළිම

බුද්ධ ප්‍රතිමාවක දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ දෙකක් වේ.

එනම්, මුද්‍රාව හා ආසනයයි.අත් හා ඇඟිලි හසුරුවන ආකාරය මුද්‍රාව නමින් හැඳින්වේ. **අභය මුද්‍රාව,විතර්ක මුද්‍රාව,ධම්මචක්‍ර මුද්‍රාව,භූමි ස්පර්ශ මුද්‍රාව,ධ්‍යාන මුද්‍රාව,වරද මුද්‍රාව** යනුවෙනි.බුදු පිළිම සඳහා ආසන වර්ග හතරක් වේ.

**පද්මාසන,වජ්‍රාසන,වීරාසන,භද්‍රාසන**

ආගමික ගොඩනැගිලිකට පිවිසෙන දොරටුවෙහි පියගැට පෙළ ආරම්භ වන ස්ථානයෙහි දක්නට ලැබෙන අඩසඳක් වැනි මටසිලිටු පැතලි ගල සඳකඩපහණ ලෙස හැඳින්වේ.බෞද්ධ සංස්කෘතියේ බලපෑමක් මත අගනා කැටයම් නිර්මාණයක් බවට පත්ව ඇති බව ඉතිහාසඥයින්ගේ අදහසයි. උසස්ම,අගනාම සඳකඩපහණ ලෙස සැලකෙන්නේ අනුරාධපුර බිසෝ මාලිගාව අසල ඇති සඳකඩපහණයි. මුලින්ම ගිනිදැල් පේළියක්ද ඉන්පසු ඇතා,අශ්වයා,ගවයා,සිංහයා යන පිළිවෙලින් සත්ව රූපද ඉන්පසු සංකීර්ණ ලියවැලක්ද,හංස පෙළක්ද,සරල ලියවැලක්ද මධ්‍යයෙහි පිපුණු නෙළුමක්ද දක්නට ලැබේ. මහාවංශයෙහි සෙනරත් පරණවිතාන මහතාගේ අදහස භක්තිවන්තයෙකු පූජනීය සමානයට පිවිසීම සසරින් එතරවී නිවන් දැකීමට හේතුවන බව පරණවිතාන ශූරීනුගේ අදහසයි.

බෞද්ධ සංස්කෘතියෙහි ඉතා වැදගත් අංගයක් වශයෙන් චිත්‍ර කලාව දැක්විය හැකිය. දැනට ආරක්‍ෂා වී ඇති සීගිරි බිතු සිතුවම් වලින් නිරූපණය වන්නේ බුද්ධ වන්දනාව පිණිස පිදුරංගල විහාරයට යන රාජකීය දේවිවරුන් හා සේවිකාවන් බව මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා පවසා ඇත. රංගිරි දඹුලු විහාරයේද ආගමික භක්තිය උපදවන චිත්‍ර නිර්මාණ රාශියක් දක්නට ලැබේ. ජාතක කතා,බුද්ධ චරිතය මෙම චිත්‍ර නිර්මාණවල තේමාව විය.ආගමික ශ්‍රද්ධාව ප්‍රේක්ෂකයා තුළ ඇති කරවීම හා ධාර්මික සිතුවිලි ජනිත කරවීම මෙහි අරමුණ වී ඇතිබව පැහැදිලිය. මිහිදු මහරහතන් වහන්සේ මෙරටට වැඩම කරවීමෙන් පසු මෙරට තිබූ ලේඛන කලාව සිංහල භාෂාවෙන් බෞද්ධ සාහිත්‍යයක් බවට පත්වීමද ඉතා වැදගත්ය. ත්‍රිපිටක ධර්මය මෙරට ව්‍යාප්ත වූ බව සඳහන් කිරීමට පුළුවන.ක්‍රි.පූ.03වන සියවසේ සිට වර්තමානය දක්වා දක්නට ලැබෙන සාහිත්‍යයන් මූලික අවස්ථාව උදවනුයේ මහින්ද්‍රාගමනයෙන් පැමිණුණු දායාදයක් වශයෙන් බව සඳහන් කිරීම උචිතය.

ඉපැරණි පද්‍ය සාහිත්‍යයට ඇති උදාහරණය වන්නේ සීගිරි පර්වතයෙන් හමු වූ කුරුටු ගීතයි. I කාශ්‍යප රජුගේ වාසස්ථාවය ලෙස සැලකෙන සීගිරි පර්වත කැටපත් පවුරේ මෙම ගීත සටහන් වී තිබෙනු දක්නට ලැබේ.මහාචාර්ය සෙනරත් පරණවිතාන ශූරීනු සීගිරි ගීත 685ක් පැන සොයාගෙන තිබේ. ශ්‍රී ලාංකික සංස්කෘතික තොරතුරු හා සමාජගත සිද්ධීන් මෙම ගීත වලින් අනාවරණය වෙයි. බුදුසහමෙහි බලපෑම මේ සඳහා ලැබුණු බව මෙම ගීත වලින් පෙන්නුම් කරන බව පුරාවිද්‍යාඥයින්ගේ මතයයි. ''පෙදෙන් බුදු සිරිත'' යන කියමනට අනුව මෙසේ සිදුවන්නට ඇතැයි සිතිය හැකිය. ජාතක කතා ඇසුරෙන් පද්‍ය සාහිත්‍ය නිර්මාණයන් ඇති කිරීමට ගිහි,පැවිදි උගතුන් ක්‍රියාකර ඇති බව මුවදෙව්දාව,ලෝවැඩ සඟරාව,ලෝකෝපකාරය යන ග්‍රන්ථයන් උදාහරණ වශයෙන් දැක්වීමට පුළුවන.මෙවැනි බෞද්ධ සාහිත්‍යමය කෘති ඇතිවීමට මූලික වූයේ බුදු දහමේ ආභාෂය නිසාම මෙහිලා සඳහන් කිරීමට පුළුවන. ගද්‍ය සාහිත්‍යය කෘතිද රාශියක් ද රචනා වී ඇති බව පෙන්වාදීමට පුළුවන.ධම්පියා අටුවා ගැටපදය,සිඛවලඳවිනිස,ධර් මප්‍රදීපිකාව,බුත්සරණ,දහම් සරණ,සද්ධර්මරත්නාවලිය,ස ද්ධර්මාලංකාරය,පන්සිය පනස් ජාතක පොත උදාහරණ වශයෙන් දැක්වීමට පුළුවන.''සිංහල දරුවා නැලවුනේ පෝෂණය වුනේ බෞද්ධ සංස්කෘති තොටිල්ලේය.'' යන කියමන මේ සඳහා උචිතවන බව පවසීමට පුළුවන.

**විජය තලවත්තේගෙදර**

රංගිරි ශ්‍රී ලංකා
සත්‍ය ගවේෂී බෞද්ධ හඬ
රංගිරි ශ්‍රී ලංකා 2020 ජූනි- 2564 පොසොන් කලාපය

**පොසොන් පැතුම...**

සන්සුන් ඉඳුරන් නිති ඇති වේවා
සිහි නුවණින් කටයුතුද කෙරේවා
කුලමානෙන් දූසිත නොම වේවා
සියලු සතුන් ලොව සුවපත් වේවා

# සමාජ ප්‍රභවය හා විකාශනය පිළිබඳ බෞද්ධ විග්‍රහය

සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳව ක්‍රි.පූ. 6 වෙනි සියවස හා ඊට පෙර විවිධ මත ඉදිරිපත් විය. ඒ අනුව ජෛන පුරාණ මතය හා බ්‍රාහ්මණ මතය ඉතා වැදගත් වේ. ජෛන පුරාණය පවසන්නේ වෘෂභ විසින් වර්ණ තුනක් නිර්මාණය කරන ලද අතර භරත විසින් බ්‍රාහ්මණ වර්ණය නිර්මාණය කළ බවයි. මේ මතය බ්‍රාහ්මණයින් ප්‍රතික්ෂේප කරනු ඇත. කෙසේ වුවද මෙම දෙආකාර දර්ශනයෙන්ම ස්භාවය සිද්ධි මාලාවෙන් බැහැර වෙන අතර බුදු සමය සමඟ ද නොගැළපෙනු ඇත.

භාරතීය දර්ශන කීපයකම සඳහන් වන්නේ ලෝකය ආරම්භයේ දී මුළු මනින්ම ජලයෙන් යට වී අන්ධකාරයෙන් යුක්තව පැවතුන බවය.
උදාහරණයක් ලෙස විෂ්ණුගේ දසාවතාරයෙහි මුල්ම අවතාරය මත්ස්‍යාවතාරය බවත්, මත්ස්‍යා ජලතර සත්වයෙක් බවත් එයින් ලෝකය ආරම්භයේදීම එකම ජලාශයක් වී තිබූ බවත් පැහැදිළි කර ඇත. එසේ වුවද දි:නිකාය අග්ගඤ්ඤ සූත්‍රය තුළින් බෞද්ධ විග්‍රහය කර ඇත්තේ හේතු ප්‍රත්‍ය ධර්මතාවය අනුව ලෝකයේ ආරම්භය හා ක්‍රමික වර්ධනය සිදු වූ බවය. එහි සාරාංශය වන්නේ ලෝකය විනාශ වී ගිය පසු ඝණ අන්ධකාරයෙන් වෙලී ජලයෙන් යට වී එකම ජලාසයක් බවට පත් වන බවයි. කාලයක් ගත වූවාට පසු මිහිමත ආභස්සර බ්‍රහ්ම ලෝකයෙන් චුත වූ සත්වයින් පහළ වනු ඇත. ඔවුන් විවිධ ස්භාවයෙන් යුක්ත වෙති. එනම්,

01. දීඝ ජීවි (දිගුකල් ජීවත්වන්නෝ වෙති)
02. සයං පභා (ශරීරා ලෝකයෙන් යුක්ත වෙති)
03. ප්‍රිති භක්ඛා (ප්‍රීතිය ආහාර කොට වසයි)
04. ආකාසචාරී (අහසෙන් ගමන් කිරීමෙහි නියැලෙයි)

මොවුන් අන්‍යෝන්‍ය ගෞරවයෙන් හා සමානාත්මතාවයෙන් යුක්ත විය.

එසේ වූවද පසු කළ ඔවුන් අතර විවිධ අවශ්‍යතා ප්‍රකට වීමෙන් පොදු සම්පත් පෞද්ගලික අයිතියට පත් වී විෂම බවක් ඇති විය. එහි ප්‍රතිඵලයක් ලෙස දුප්පත් පොහොසත් භේදය ඇති වී සමාජ ගැටලු රැසකට මුහුණ දෙන්නට සිදු විය. එය පිළිවෙලින් මෙසේ දැක්වීමට පුළුවන.

**අදනානං ධනෙ අනුප්පදීය මානේ**
**දාළිද්දියං වේපුල්ලං මගමාසි**
**(දිළින්දන්ට ධනය උපයන මාර්ග නැති වීමෙන් දිළිදුකම තවතවත් වැඩි විය)**

**දාළිද්දියේ වේපුල්ලං ගතේ අදින්නාදානං**
**වේපුල්ල මගමාසි**
**(දිළිදුකම වැඩිවීම නිසා හොරකමට පෙළඹුනි)**

**අදින්නාදනෙ වෙපුල්ලං ගතේ සත්ථෙ**
**වෙපුල්ල මගමාසි**
**(සොරකම වැඩිවීම නිසා අවි ආයුධ බහුල විය)**
**සතථෙ වෙපුල්ලං ගතේ පාණාතිපාතෝ**
**වෙපුල්ල මගමාසි**
**(අවි ආයුධ වැඩි වීම නිසා ප්‍රාණඝාතය බහුල විය)**

**පාණාතිපාතේ වෙපුල්ලං ගතේ මුසාවාදෝ**
**වේපුල්ලං මගමාසි**
**(ප්‍රාණඝාතය නිසා බොරු කීමට පෙළඹුණි)**

මෙම සමාජ විෂමතා හේතුවෙන් රාග ද්වේෂාදි අකුසල ධර්ම ප්‍රකට විය. එතුළින් සමාජය පිරිහී දූෂණ භීෂණ වැඩි වී අපරාධ ගැටුම් වැඩි විය. එතුළින් රෝගාබාධ ඇති වී සත්වයාගේ ආයුෂ ද පිරිහිණ. මෙම සමාජ රාමුව තුළ බුද්ධිමත් පිරිසක් බියෙන් සැකයෙන් තොරව ජීවත් වීමේ පසු තලයක් නිර්මාණය කිරීමට තීරණය කළ අතර, ඔවුන් අතුරින් පෞරුෂයක් ඇති කාර්යශූර දක්ෂ බුද්ධිමත් අයෙකු මහජන සම්මතයෙන් පත් කර ගන්නා ලදි. එනිසා ඔහුව මහා සම්මතය කියා හැඳින් වූ අතර ඔහුට රට සුමඟට ගැනීමට වගකීම පවරන ලදි. ඔහුට පැවරුන කාර්යන් අතර වූයේය.
**සම්මා සික්ඛිතබ්බං සික්ඛෙය්‍ය**
**(හික්මිය යුත්තන් මැනවින් හික්මවීම)**

**සම්මා ගාරුතබ්බං ගාරෙය්‍ය**
**(ගැරහිය යුත්තන්ට ගරුකළ යුත්තුයි.)**

**පාභාතබ්බං පභාතබ්බෙය්‍ය**
**(පහකළ යුතු දෑ ප්‍රහානය කළ යුතුය.)**
ආදී වශයෙනි.

මෙම වගකීම දරන්නාට අනුග්‍රහයක් වශයෙන් ධාන්‍ය වලින් කොටසක් බදු වශයෙන් ගෙවීමට පොරොන්දු විය. ඔහුට තවත් නම් පට බැඳුනි.
**ඛෙත්තානං අධිපතීයො ඛත්තියො (ඔහු විශාල කෙත් වතු හිමියෙක් වූ බැවින් ක්ෂත්‍රිය විය)**
**ධම්මෙන පරේ රංජනතීති රාජා (යුක්තියෙන් ධර්මයෙන් රට පාලනය කරමින් ජන හදවත් දිනාගත් නිසා රජතුමා වශයෙන් හැඳින්විය.)**

මේ අනුව ප්‍රථම පාලක පක්ෂය හෙවත් ක්ෂත්‍රිය සමාජය බිහි විය.

තවත් පිරිසක් සමාජයේ සිදු වූ අපරාධ දැක කළකිරී වනගත විය. ඔවුන් ''බාහිත පාප ධම්මෝ බාහ්මනෝ" පව බාහනය කිරීම හෙවත් පාපයෙන් වැලකී සිටීම සිදු කළහ.

තවත් පිරිසක් අජ්ඣායක" යනුවෙන් ශිල්ප ශාස්ත්‍රයන් වෙත දැඩි ඇල්මක් දැක් වීමෙන් ඉහත නම් දැරීය.

තවත් පිරිසක් ධ්‍යාන භාවනා කිරීමෙන් ඣායක" නමින් හැඳින් විය.

මේ අයුරින් බ්‍රාහ්මණ සමාජය බිහි විය.
**"විසුං කම්මන්තේ පයෝජෙන්තීති වෙස්සා"**

යනුවෙන් වෙළඳ කටයුතු වලට උනන්දුවක් දැක්වීමෙන් වෛශ්‍ය නමින් හැඳින්විය.
**"ඛුද්ද ලුද්ද සමාචාරා සුද්දා"**
යනුවෙන් පාපී ලාමක ක්‍රියා වලට නැඹුරු වීමෙන් ශුද්‍ර කියා නම් පට බැඳුනි. හොර මැරකම් කළ අය එම සමාජයට අයිති විය.

මේ අනුව සමාජ ප්‍රභවය ඉබේ හටගත්තාක් නොවන අතර, සමකාලීන සමාජ අවශ්‍යතාවය අනුව සිදු විය. මේ අනුව සමාජ ප්‍රභවය හේතුඵලවාදීව සිදු වූවක් බව බෞද්ධ විග්‍රහයට අනුව පෙන්වා දිය හැකිය.

කොබෙයිගනේ පුබ්බිලිය ශ්‍රී සාරානන්ද පිරිවෙනේ
ආචාර්ය
ගලගෙදර රතනවංශ හිමි

## පැරණි පොත පතින්

**සැපත සඳහා අත්හැරිය යුතු දෝෂ 6 ක්**

01. නිදිමත
02. නිතර පසු බැසීම
03. භය
04. ක්‍රෝදය
05. සිත අවධි නොවන අලස කම
06. දූන් කළ යුත්ත පසුවට කල් තැබීම

**නුවණැත්තා හඳුනාගත හැකි ලක්ෂණ 10 ක්**

01. ක්‍රෝධය නැති වීම.
02. නිරෝගී වීම.
03. ඉඳුරන් දිනීම.
04. දයාව පෑම.
05. වරද ඉවසීම.
06. අලෝභය.
07. සැමට ප්‍රිය වීම.
08. දීමට කැමැත්ත.
09. බියෙන් තොර වීම.
10. ශෝකයට හෝ පසුතැවිල්ලට පත් නොවීම.

**බොදුනුවකගේ යහපත් සිතුවිලි 07**

01. සිහි බුද්ධියෙන් සිටීම.
02. ධර්මය සොයා දූන ගැනිම.
03. දුක් නැසීමේ උත්සහාය.
04. නිරතුරු නිවැරදි ප්‍රිතිය.
05. උඩගු සිතින් මැඩ ගැනිම.
06. සිත එකඟකර ගැනීම.
07. මැදිහත් ගතියෙන් සිටීම.

**ඇසුරුකළ යුතු හත්දෙනා**

01. සත්‍ය පිහිට කොට ඇත්තා.
02. ආර්යය ධර්මය ගුරු කොට දකින්නා.
03. ධර්මිෂ්ටයා.
04. අමාරුවකට මුහුණපාන අනාර්යය.
05. බොහෝ සහෝදරයන් ඇත්තා.
06. තමාට වඩා බලවතා.
07. නොයෙන් තැන්හිදී දිනුම් ලබන්නා.

**ධර්මය නොසලකන දස දෙනා**

01. යෞවනාදී මදයෙන් මත් වූ තැනැත්තා.
02. තරයේ වැඩක යෙදී සිටින තැනැත්තා.
03. උමතුවෙන් පෙළෙන්නා.
04. විඩා පත්ව සිටින්නා.
05. කිපෙන සුළු තැනැත්තා.
06. සා පිපාසයෙන් පෙලෙන්නා.
07. දැඩි ලෝභයා (මසුරා).
08. ඉවසීමෙන් තොර කඩි මුඩි ගති ඇත්තා
09. පස්කම් සුවයට ගිජු වී එහි එල්බ සිටින්නා
10. බිය සුළු තැනැත්තා.

**ලතෙක් බවක් නැති 12 දෙනෙක්**

01. මාංශ සඳහා සතුන් ඇති කරන්නා.
02. සත්ව මාංශ වෙළෙන්දා.
03. සත්ව ඝාතනය කරන්නා.
04. උගුල් අටවන්නා.
05. මිනිස් දිවි තොර කරගන්නා.
06. චෞරයා.
07. මංකොල්ල කාරයා.
08. අසාධාරණ වෙළෙන්දා.
09. මුදල් පොලියට දෙන්නා.
10. සිය වාසිය පමණක් බලා කටයුතු කරන්නා.
11. රාගයෙන් අන්ධවූ තැනැත්තා.
12. සුරාවෙන් මනස අවුල්කරගත් තැනැත්තා.

**බිරිඳකට තිබිය යුතු ගුණාංග හතර**

01. ගෘහ කර්මාන්තයෙහි දක්ෂ වීම.
02. යහපත් දරුවන් ඇති වීම.
03. ස්වාමියාට සිය පණ මෙන් හිතවත් වීම.
04. පති වෘත්තාවෙන් යුතු වීම.

කොස්ගොඩ කරුණාදාස සිල්වා දූණුසිංහ